
VERITÉ RESEARCH
Strategic Analysis for Asia

NATIONAL CHRISTIAN
EVANGELICAL ALLIANCE SRI LANKA



# අක්‍රියාකාරීත්වය සහ දණ්ඩ මුක්තිය:

## ක්‍රිස්තියානුවන්, මුස්ලිමුන් හා හින්දුන් ඉලක්ක කරගනිමින් සිදුවූ ආගමික ප්‍රචණ්ඩ ක්‍රියා

2015 - 2019

මෙම වාතර්ාව, ශ්‍රී ලංකාවේ ජාතික ක්‍රිස්තියානි ඉවැන්ජලික සන්ධානය (NCEASL) මගින් සැපයුණු තොරතුරු මත පදනම්ව වෙරිටෙ රිසච්ර් මගින් සම්පාදනය කොට තිබේ.

වෙරිටෙ රිසච්ර් වෙත ලබාදුන් තොරතුරු සම්බන්ධයෙන් වන එකම බුද්ධිමය දේපළ අයිතිය ශ්‍රී ලංකාවේ ජාතික ක්‍රිස්තියානි ඉවැන්ජලික සන්ධානය සතුවේ. මෙම වාතර්ාවේ විශ්ලේෂණය සම්බන්ධයෙන් වන සියලුම බුද්ධිමය දේපළ අයිතීන් වෙරිටෙ රිසච්ර් සතුවේ.

මෙම වාතර්ාව සම්බන්ධයෙන් එකම බෙදාහැරීමේ අයිතිය ශ්‍රී ලංකාවේ ජාතික ක්‍රිස්තියානි ඉවැන්ජලික සන්ධානය සතුවේ.

# ස්තූතිය

මෙම අධ්‍යයනය පදනම්ව ඇත්තේ ශ්‍රී ලංකාවේ ජාතික ක්‍රිස්තියානි ඉවැන්ජලික සන්ධානය (NCEASL) විසින් එක්රැස් කරනු ලැබූ දත්ත මත පදනම් වෙමිනි.

මෙම වාතර්ාව, ශ්‍රී ලංකාවේ ජාතික ක්‍රිස්තියානි ඉවැන්ජලික සන්ධානය සක්‍රිය වශයෙන් පුළුල් ක්ෂේත්‍රයන් තුනක ක්‍රියාත්මක වේ. එනම් ධමර්දූත මෙහෙවර හා දේවධමර්ය; ආගමික නිදහස හා මානව හිමිකම්; සහ සහන සාධනය හා සංවධර්නය යන ක්ෂේත්‍රයන්හි වේ. ශ්‍රී ලංකාවේ ජාතික ක්‍රිස්තියානි ඉවැන්ජලික සන්ධානය ලෝක ඉවැන්ජලික සන්ධානය (WEA) හා අනුබද්ධ වන අතර, එය ලෝකයේ රටවල් 129 ක පැතිරුණු මිලියන 620 කට අධික ක්‍රිස්තියානි භක්තිකයින්ගෙන් සැදි ලෝක ව්‍යාප්ත ජාලයකි. ශ්‍රී ලංකාවේ ජාතික ක්‍රිස්තියානි ඉවැන්ජලික සන්ධානයට නායකත්වය ලබාදෙන්නේ සමාජ පරිවතර්නය, ආගමික නිදහස හා මානව හිමිකම් පිළිබඳ කීතර්ීමත් ක්‍රියාකාරිකයෙකු වන දේශමාන්‍ය ගොඩ්ෆ්‍රි යෝගරාජා විසිනි.

දශක දෙකකට වැඩි කාලයක් පුරාවට ශ්‍රී ලංකාවේ ජාතික ක්‍රිස්තියානි ඉවැන්ජලික සන්ධානයේ ආගමික නිදහස පිළිබඳ කොමිසම (RLC) මගින් ශ්‍රී ලංකාවේ ක්‍රිස්තියානි ප්‍රජාවට එරෙහිව සිදුවූ ප්‍රචණ්ඩත්ව ක්‍රියාවන්, බියවැද්දීමේ ක්‍රියාවන් සහ කොන් කිරීම් අධීක්ෂණය සහ වාතර්ාගත කිරීම සිදුකරන ලදී. කෙසේ වෙතත් ආගමික නිදහස පිළිබඳ කොමිසමේ අරමුණ වන්නේ, පක්ෂව කථා කිරීම, පෙළඹවීම් ඇති කිරීම, පයෙර්ෂණ හා වාතර්ාගත කිරීම සහ පුහුණුව හා අධ්‍යාපනය ඔස්සේ සියලුම ශ්‍රී ලාංකිකයන් සඳහා වන ආගමික නිදහස වෙත කෙරෙනා ප්‍රගමනයයි.

මෙම අධ්‍යයනය සම්පාදනය කරනු ලැබුවේ වෙරිටෙ රිසචර් හි මාධ්‍ය පයෙර්ෂණ කණ්ඩායම විසිනි. මහෝෂධී පීරිස් මෙම අධ්‍යයනයේ ප්‍රධාන පයෙර්ෂිකාව සහ කතුවරියයි. මෙම අධ්‍යයනය සිදුකල කණ්ඩායම සැදුම් ලද්දේ මිහිඳු පෙරේරා සහ ජොනතන් කෘස් ගෙනි. සංස්කරණ මගපෙන්වීම ගෙහාන් ගුණතිලක, දීපාංජලී අබේවදර්න, වලනි රණවල, ෂමාරා වෙත්තමුණි, ස්ටෙෆනි නිකෝල් සහ හස්නා මුනාස් ගෙනි. සමස්ත පයෙර්ෂණ අධීක්ෂණය නිශාන් ඩි මෙල් විසින් සපයන ලදී. ඉන්ෆොග්‍රැෆික් නිමර්ාණය නිලංගිකා ෆනර්ැන්ඩෝ ගෙනි. නිමැවුම් සැකසුම දිනුක් සෙනාපතිරණ ගෙනි. රොෂෙල් කනගසබේ විසින් වාතර්ාව සම්පාදනය සඳහා සහාය ලබාදෙන ලදී. පූවෙර්ාක්ත නම් සඳහන් වූවන් විසින් මෙහි මුල් කෙටුම්පත හා අදහස් විමංසනය සඳහා කැප කල කාලය සම්බන්ධයෙන් සහ ඔවුන්ගේ ප්‍රතිචාර සම්බන්ධයෙන් කතුවරයා ඔවුනට අතිශයින්ම කෘතඥ වේ.

# පටුන


| | |
|---|---|
| ප්‍රස්තාවනාව | 5 |
| විධායක සාරාංශය | 6 |
| හැඳින්වීම | 8 |
| සමාජ-දේශපාලන සන්දර්භය විශ්ලේෂණය | 10 |
| ක්‍රිස්තියානි භක්තිකයන්ට එරෙහි ආගමික ප්‍රචණ්ඩත්වයේ නැඹුරුතාවයන් පිළිබඳ විශ්ලේෂණය | 13 |
| රාජ්‍යයේ භූමිකාව | 18 |
| දිස්ත්‍රික්ක අනුව සිදුවීම් වල භූගෝලීය විසිරීම | 22 |
| මුස්ලිම් හා හින්දු භක්තිකයින් ඉලක්ක කෙරුණු ආගමික-වාර්ගික ප්‍රචණ්ඩත්වය පිළිබඳ විශ්ලේෂණය | 27 |
| නිගමනය | 33 |
| ඇමුණුම | 34 |
| ක්‍රමවේදය සහ සිදුවීම් වර්ගීකරණය | 38 |
| අවසන් සටහන් | 42 |

# ප්‍රස්තාවනාව

පසුගිය වසර කිහිපය පුරාවටම ශ්‍රී ලංකාව තුළ ආගම් හෝ විශ්වාසයන් සඳහා වන නිදහස (FoRB) විවේචනයට ලක්වුණි. ආගම් හෝ විශ්වාසයන් සඳහා වන නිදහස ශ්‍රී ලංකාවේ ව්‍යවස්ථාවේ එන මූලික අයිතිවාසිකමක් ලෙසින් හඳුනාගත හැකි වුවද, එය මූලිකම මිනිස් නිදහසක් ලෙසින් විශ්වීය වශයෙන් සැලකුණද, ශ්‍රී ලංකාව තුළ ආගම් හෝ විශ්වාසයන් සඳහා වන නිදහස සියලුම පුරවැසියන් සඳහා සුරක්ෂිත කිරීමේ ප්‍රයත්නයන්ගේ අවශ්‍යතාවයක් පවතී.

2015 දී ශ්‍රී ලංකාවේ ක්‍රිස්තියානි ඉවැන්ජලික සන්ධානය විසින් නිකුත් කළ වසර 20 ක ප්‍රවණතා විශ්ලේෂණ වාතර්ාවෙන් පසුව, 2015 සිට 2019 දක්වා ශ්‍රී ලංකාවේ ආගම් හෝ විශ්වාසයන් සඳහා වන නිදහසේ තත්වය විශ්ලේෂණය කිරීම සඳහා ශ්‍රී ලංකාවේ ක්‍රිස්තියානි ඉවැන්ජලික සන්ධානය විසින් මෙම පයෙර්ෂණය අනුමත කරනු ලැබ ඇත. මෙම අධ්‍යයනය තුළ ක්‍රිස්තියානි භක්තිකයින්ට එරෙහිව සිදුවූ ආගම් හෝ විශ්වාසයන් සඳහා වන නිදහස උල්ලංඝනය කිරීමේ සිදුවීම් 397 ක්, මුස්ලිම්-විරෝධී කලකෝලාහල සිදුවීම් කිහිපයක් සහ උතුරු සහ නැගෙනහිර පළාත් වල හින්දු ප්‍රජාවන්ට එරෙහිව සිදුවූ කොන් කිරීම් විශ්ලේෂණය කෙරී ඇත.

කණස්සල්ල ඇති කරවන ලෙසින්, මෙම අධ්‍යයනය මගින් ශ්‍රී ලංකාවේ සුළුතර ප්‍රජාවන්ට එරෙහිව ආගම් හෝ විශ්වාසයන් සඳහා වන නිදහස උල්ලංඝනය කිරීම් වලදී, සක්‍රිය කාරකයන් ලෙසින් මෙන්ම අක්‍රිය කාරකයන් ලෙසින්ද රාජ්‍ය නිලධාරීන්ගේ මැදිහත්වීම් ඉහළයැමක සැලකිල්ලට ලක් විය යුතු ප්‍රවණතාවයක් මෙන්ම රාජ්‍යයේ ක්‍රියාකාරීත්වය හෝ අක්‍රියාකාරීත්වය ඔස්සේ ආගමික ප්‍රචණ්ඩත්වය අවිකල්පයෙන්ම පෝෂණය වීමක්ද මෙම අධ්‍යයනය මගින් ඉස්මතු කොට දක්වයි. එසේ හෙයින්ම ශ්‍රී ලංකාවේ ආගම් හෝ විශ්වාසයන් සඳහා වන නිදහස සම්බන්ධයෙන් ඉටු කිරීමට බොහෝ කටයුතු ඉතිරිව ඇති බවට වන බිය උපදවන සළකුණක් මෙම අධ්‍යයනය තුළින් ඉදිරිපත් වේ.

අන්තවාදයේ නැගී ඒමත් රාජ්‍ය තහංචි ඉහළ යෑමත් සමගින්, ආගමික සුළුතරයන් සඳහා ඉදිරියේ වන මාගර්ය දුගර්ම එකක් බව පෙනෙන්නට තිබේ. එනිසා, ශ්‍රී ලංකාවේ ආගමික සුළුතරයන්ගේ අයිතිවාසිකම් සඳහා සවිශක්තිය ලබාදීමට පියවර ගැනීමෙහි ලා චේතනාන්විත වීමේ සහ පූවර් ක්‍රියාකාරී වීමේ වගකීම රාජ්‍යයට ඉතිරිවී තිබේ. මෙම අධ්‍යයන වාතර්ාව මගින් ආගම් හෝ විශ්වාසයන් සඳහා වන නිදහසෙහි වත්මන් තත්වය පහදා දීමත්, මෙම ගැටළුව සම්බන්ධයෙන් අවශ්‍යම වී තිබෙනා කතිකාවක් සහ ක්‍රියාත්මක වීම් ප්‍රවධර්නය කිරීමත් සිදුවේ යැයි අපි බලාපොරොත්තු වෙමු.

මෙම අධ්‍යයනය සිදුකළ වෙරිටෙ රිසචර් නොවන්නට, මෙය සිදුනොවන්නට තිබිණි. එසේම, මිල කළ නොහැකි මග පෙන්වීමක් ලබාදීම කෙරෙහි ශ්‍රී ලංකාවේ ක්‍රිස්තියානි ඉවැන්ජලික සන්ධානයේ මහලේකම් දේශමාන්‍ය ගොඩ්ෆ්‍රි යෝගරාජා හටත්, මහඟු කැපවීම වෙනුවෙන් ක්‍රිස්තියානි ඉවැන්ජලික සන්ධානයේ පයෙර්ෂණ හා ප්‍රලේඛන සම්බන්ධීකාරක අනුෂ්කා විජේසිංහ මෙනෙවියටත් මාගේ අවංක අගය කිරීම සහ අත්‍යන්ත කෘතඥතාවය හිමිවේ. එසේම මෙම ව්‍යාපෘතිය කෙරෙහි සිය සහාය දැක්වීම සම්බන්ධයෙන් කොළඹ බ්‍රිතාන්‍ය මහ කොමසාරිස් කායර්ාලය වෙතද මාගේ විශේෂ ස්තුතිය පළ කරමි.

යාමිනී රවීන්ද්‍රන්
අධ්‍යක්ෂ, නීති හා උපදේශන
ශ්‍රී ලංකාවේ ක්‍රිස්තියානි ඉවැන්ජලික සන්ධානය

# විධායක සාරාංශය

ශ්‍රී ලංකාවේ වාගරීක-ආගමික ප්‍රචණ්ඩත්වය, නිදන්ගතව පවත්නා පද්ධතිමය ගැටළුවකි. 2015 ජනවාරි මස බලයට පැමිණි පෙර රජය සමගින් සිදුවූ පයර්න්ත වෙනස තිබියදී වුව එය නොනැසී පැවතිණි. මෙම පයෙර්ෂණ අධ්‍යයනයෙන් පෙන්වා දෙනු ලබන්නේ, ශ්‍රී ලංකාවේ ක්‍රිස්තියානි, මුස්ලිම් සහ හින්දු සුළුතර ප්‍රජාවන් මුහුණ දෙන ප්‍රචණ්ඩත්වයේ ප්‍රමුඛ ප්‍රවණතාවයන් හා සිදුවීම් සමගින් වන අභියෝගයන් පිළිබඳ පොදු විශ්ලේෂණයකි. මෙම අධ්‍යයනයේ ක්‍රමවේදයට පහත දැක්වෙන සංරචකයන් ඇතුළත් වේ. (අ) 2015 සිට 2019 අගෝස්තු දක්වා ශ්‍රී ලංකාවේ ජාතික ක්‍රිස්තියානි ඉවැන්ජලික සන්ධානය (NCEASL) මගින් සම්පාදනය කරනු ලැබූ ක්‍රිස්තියානි ආගමිකයින්ට එරෙහිව වූ ප්‍රචණ්ඩ ක්‍රියා පිළිබඳ සිදුවීම් වාතර්ාවන් සමාලෝචනයක්; සහ (ආ) ශ්‍රී ලංකාවේ වාගරීක-ආගමික ගැටුම් හා සුළුතර-විරෝධී ප්‍රචණ්ඩත්වය පිළිබඳ ද්විතීයික ප්‍රකාශනයන් සමාලෝචනයක් ලෙසින් එම සංරචකයන් දැක්විය හැක.

මෙම අධ්‍යයනය මගින් 2015 ජනවාරියේ සිට 2019 අගෝස්තුව කාලසීමාව අතරතුර ක්‍රිස්තියානි භක්තිකයින්ට එරෙහිව සිදුවූ සමස්තයක් ලෙස 397 ක් වූ ප්‍රචණ්ඩ ක්‍රියාවන් ප්‍රමාණයක් විශ්ලේෂණය කරයි. එම අධ්‍යයනය ඔස්සේ අනාවරණය වූයේ 2010-2014 වසර පහක කාලසීමාවට සාපේක්ෂව, 2015 න් පසු කාලපරිච්ඡේදය තුළ උක්ත කියූ ආකාරයේ සිදුවීම් සංඛ්‍යාතයේ ක්ෂණික පහත වැටීමක් වාතර්ාගතව ඇති බවයි. මෙම පහත වැටීමේ බොහෝ කොටසක්, ශාරීරික හිංසනය සම්බන්ධ වූ සිදුවීම් ප්‍රමාණය අඩු වීම ඔස්සේ පැහැදිලි කළ හැක. කෙසේ වුවත්, මෙම ක්‍රිස්තියානි භක්තිකයින්ට එරෙහිව වූ ශාරීරික හිංසනය නොමැති සිදුවීම් 87% ක්, ප්‍රධාන වශයෙන් වැඳුම් පිදුම් කරනා ස්ථාන සහ පාස්ටවර්රුන් ඉලක්ක කොට ගනිමින් සිදු වූ *කොන්කිරීමේ ක්‍රියාවන් හා භාවිතයන්* ලෙස දැක්විය හැක. මෙම සිදුවීම් වලින් 50% කට වැඩි ප්‍රමාණයක ප්‍රධාන වරදකරුවන් වූයේ රජයේ නිලධාරීන් වේ.

2015 ජනවාරි සිට 2019 අගෝස්තු දක්වා කාලය අතරතුර ක්‍රිස්තියානි භක්තිකයින්ට එරෙහිව ප්‍රචණ්ඩ ක්‍රියා සිදුකිරීමේදී සහ එවන් ක්‍රියා සිදුකිරීමට අවකාශ සැලසීමේදී රාජ්‍යයද සැලකිය යුතු භූමිකාවක් ඉටු කර තිබිණි. ඒ සඳහා රජයේ මැදිහත්වීමේ මට්ටම තිබුණේද ඉන් පෙර අවුරුදු පහක (2010-2014) කාලය තුළ තිබූ මට්ටමේමය. මෙම සියලු ප්‍රචණ්ඩ ක්‍රියාවන්ගෙන් 40% කට වඩා වැඩි ප්‍රමාණයක් සඳහා රජයේ නිලධාරීන් ප්‍රධාන වරදකරුවන් ලෙසින් හඳුනාගනු ලැබිණි.

මීට අමතරව, බෞද්ධ භික්ෂූන් වැනි රාජ්‍ය-නොවන ක්‍රියාකාරිකයන් විසින් සිදුකරනු ලැබූ ප්‍රචණ්ඩ ක්‍රියාවන් සඳහා පොලිසිය මගින් දැක්වූ ප්‍රතිචාරය සැලකිය යුතු ලෙසින් සෘණාත්මක වූ බවද මෙම අධ්‍යයනය මගින් වාතර්ා කොට ඇත. මෙසේ බලන කල්හි, ක්‍රිස්තියානි භක්තිකයින්ට ඔවුන්ගේ ආගමික විශ්වාසයන් පුරුදු පුහුණු කිරීමට ඇති අයිතිය වෙත ගරු කිරීමේදී මෙන්ම, රාජ්‍ය-නොවන ක්‍රියාකාරිකයන් විසින් ක්‍රිස්තියානි භක්තිකයින්ගේ අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමෙන් ඔවුන්ව ආරක්ෂා කිරීමටද රාජ්‍යය අසමත් වී ඇති බවක් පෙනී යයි.

2015 සිට 2019 දක්වා කාලය අතරතුර වැඩිම ප්‍රචණ්ඩ ක්‍රියා සිදුවීම් ප්‍රමාණයක් වාතර්ා වී ඇති දිස්ත්‍රික්කය වන්නේ මඩකළපුව වන අතර, දෙවෙනි තැනට පැමිණ ඇත්තේ පොළොන්නරුවයි. කෙසේ වුවත්, පොළොන්නරුවේ ක්‍රිස්තියානි බැතිමතුන්ගේ ජනගහණය ප්‍රතිශතයක් ලෙසින් අඩුම අගයක් ගත්තද, 2015 ට පෙර වසර පහක කාලය හා සසඳන විට වාතර්ාගතව ඇති ප්‍රචණ්ඩ සිදුවීම් ප්‍රතිශතයක් ලෙසින් ඉහළ යෑමෙන් ඉදිරියෙන්ම සිටින්නේ (400% කින්) පොළොන්නරුවයි. තවදුරටත්, ආගමික ප්‍රචණ්ඩ ක්‍රියාවන්ගේ වාෂර්ික ශීඝ්‍රතාවයේ ඉහළම වැඩිවීමක් වාතර්ා කරන්නේද පොළොන්නරුවයි. මෙම සමාලෝචනය සිදුකළ කාල සීමාව අතරතුරදී පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ක්‍රිස්තියානි භක්තිකයින් හට බොහෝ විට මුහුණ පෑමට සිදුව ඇති ආගමික ප්‍රචණ්ඩ ක්‍රියා ප්‍රමාණය, ඊට පෙර කාල සීමාව (2010-2014) හා සසඳන විට ආසන්න වශයෙන් පස් ගුණයක් වත් විය හැක.

පසුගිය වසර පහක කාලය තුළ, ශ්‍රී ලංකාවේ මුස්ලිම් ප්‍රජාවට විසින් විටින් විට සිදුවූ හදිසියේ උග්‍ර වූ බහු ප්‍රචණ්ඩ ක්‍රියාවන් වෙත මුහුණ දෙන්නට සිදුවිණි.[a] මීට ගිංතොටදී (2017 නොවැම්බරයේදී), අම්පාරේදී (2018 පෙබරවාරියේදී), දිගන/තෙල්දෙණියේදී (2018 මාතර්ුවේදී) සහ කුරුණෑගල/මිනුවන්ගොඩදී (2019 මැයි වලදී) සිදුවූ මුස්ලිම්-විරෝධී කැරලි කෝලාහල ඇතුළත් වේ. මේ අතරේදී ශ්‍රී ලංකාවේ උතුරේ සහ නැගෙනහිර හින්දු ජනතාව හට, මෙම ප්‍රදේශයන්හි සිදුවුණු බවට මාධ්‍ය ඔස්සේ සහ සිදුවීම් වාතර්ාවන් ඔස්සේ චෝදනා නැගෙන 'සිංහලීකරණය/බෞද්ධාගමීකරණය' සමගින් සිදුවූ පුළුල්ව පැතිර ගිය කොන් කිරීමට, වෙනස් කොට සැලකීමට මුහුණ දීමට සිදුවිණි. මෙම සිදුවීම් ඔස්සේ අනාවරණය වන්නේ, වාගරීක-ආගමික ප්‍රචණ්ඩත්වය චිරස්ථායී කිරීමෙහි ලා ශ්‍රී ලංකාවේ සමාජ-දේශපාලන සහ සංස්කෘතික සාධකයන් කෙතරම් ගැඹුරට මුල්බැස ගෙන ඇතිද යන්නයි. මේවාට -

- බහුතර ප්‍රජාවන් තුළ ඇති හිමිකාරීත්ව හැඟීම් සංකීර්ණයන් සහ කලහකාරී ජාතිකවාදී කණ්ඩායම් මගින් අයුතු ලෙසින් භාවිතා කරනු ලැබූ පැවැත්ම පිළිබඳ භීතීන්ද ඇතුළත් වේ. උක්ත සාධකයන්ගේ පැතිරීම මගින් හැඟවුම් කෙරෙන්නේ, මෙම ප්‍රචණ්ඩත්වය රටේ බහුතරය වන සිංහල-බෞද්ධ වාගරීක-ආගමික කණ්ඩායමට හැඟෙනා තර්ජනයක් හෝ අනාරක්ෂිත භාවයක් නිසාවෙන් ඇතිවන ප්‍රතික්‍රියාවක් බවයි.

අවසන් වශයෙන් මෙම අධ්‍යයනය මගින් ඉස්මතු කොට දැක්වෙන්නේ, වාගරීක-ආගමික ප්‍රචණ්ඩත්වයේ ගැඹුරෙහි පවත්නා සාධකයන් මුල්බැසගෙන තිබීම අවසානයේ සියලුම තලයන්හි 'සංස්ථායික පිරිහීමක්' දක්වා මග පාදා ඇත්තේ කෙසේද යන්නයි.[2] මෙම සංස්ථායික පිරිහීම මගින් රාජ්‍ය විධිවිධානයන් සහ ආරක්ෂක අංශ නිලධාරීන්, සුළුතර කණ්ඩායම් වලට හානිකර තත්වයක් ඇති කරමින් බහුතර වාගරීක-ආගමික කණ්ඩායම වෙත පක්ෂග්‍රාහී වී ඇති බවට මෙහිදී තකර් නැගී ඇත. වාගරීක-ආගමික ප්‍රචණ්ඩ ක්‍රියාවන් විෂයෙහි රාජ්‍යයේ වාතර්ාගතව තිබෙන අක්‍රියාකාරීත්වය සහ සහාය ලබාදීම සම්බන්ධයෙන් පැහැදිලි කිරීමක්, රාජ්‍ය ආයතනයන් තුළ සිංහල-බෞද්ධ බහුතරවාදය මුල්බැසගෙන තිබීම ඔස්සේ ඇතැම් විට සැපයෙනු ඇත.

[a] 'හදිසියේ උග්‍ර වන' ප්‍රචණ්ඩ ක්‍රියා යන්න මෙම අධ්‍යයනය තුළ විස්තර කෙරී ඇත්තේ, ඉහළ තීව්‍රතාවයකින් යුතුව, ස්වභාවයෙන්ම අවිධිමත්ව වරින් වර සිදුවන ක්‍රියාවන් ලෙසිනි.

# හැඳින්වීම

හිටපු ජනපති මහින්ද රාජපක්ෂ රජයේ ධූර කාලය තුළදී, විද්‍යමාන දණ්ඩ මුක්තියකින් යුතුව ක්‍රියාත්මක වූ බෞද්ධ කලහකාරී කණ්ඩායම් වල නැගීමක් ශ්‍රී ලංකාව තුළ දක්නට ලැබිණි.[3] මෙම බෞද්ධ කලහකාරී කණ්ඩායම් අත්විඳි දණ්ඩ මුක්තිය මගින් හැඟවුණේ, වාගර්ික-ආගමික ප්‍රචණ්ඩත්වය බලාත්මක කිරීමෙහි ලා රාජ්‍යය අනුග්‍රහය ලැබුණා වීමට තිබූ හැකියාවයි.[4] එනිසා, 2015 ජනාධිපතිවරණයෙන් මහින්ද රාජපක්ෂ පරාජයටර් පත්වීම මගින් සංහිඳියාව, වගවීම සහ බහුත්වවාදී ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ අපේක්ෂාවන් නිමර්ාණය විණි.[5] කෙසේ වෙතත්, 2015 ජනවාරියේ සිදුවූ ප්‍රජාතාන්ත්‍රික බල පෙරළියෙන් පසුව වුවත්, ශ්‍රී ලංකාවේ වාගර්ික-ආගමික ප්‍රචණ්ඩත්වයේ නිදන්ගත සහ ව්‍යුහාත්මක ස්වභාවය නොනැසී පැවතිණි.[6]

මෙම අධ්‍යයනය, ශ්‍රී ලංකාවේ පශ්චාත්-යුධ සන්දභර්ය ගවේශණය කරන අතර 2015-2019 අතර කාලසීමාවේදී ආගමික සුළුතර කණ්ඩායම් වලට එරෙහිව දියත් වුණු ආගමික ප්‍රචණ්ඩ ක්‍රියා සම්බන්ධයෙන් විභාග කොට බලයි. මෙම අධ්‍යයනයේ අරමුණ වෙනුවෙන්, ශ්‍රී ලංකාවේ ජනගහණයෙන් 30% ක් සම්පූණර් කරනා ක්‍රිස්තියානි, මුස්ලිම් සහ හින්දු භක්තිකයින් ආගමික සුළුතර කණ්ඩායම් වලට ඇතුළත් කොට ඇත. තවදුරටත් ගත් විට, 'ප්‍රචණ්ඩත්වය' යන යෙදුම පිළිබඳව පවත්නා විද්වත් විවාදයන් පිළිබඳව සඳහන් කරන අතරතුරදීම, මෙම අධ්‍යයනය මගින් ආගමික ප්‍රචණ්ඩත්වය සඳහා ප්‍රචණ්ඩත්වයේ ශාරීරික, ශාරීරික නොවන සහ ව්‍යුහාත්මක ආකාරයන් ඇතුළත් වන වඩාත් පුළුල් අථර් දැක්වීමක් යොදාගෙන ඇත.[7] ඒ අනුව මෙම අථර් දැක්වීම මගින් ඒ යටතට පහත දැක්වෙන ආකාරයේ පුළුල් ක්‍රියාකාරකම් ප්‍රමාණයක් හසු කරගෙන ඇත: දේපළ හානි හෝ විනාශ කිරීම්; පුද්ගලයෙකු/පුද්ගලයින් හට එරෙහි ශාරීරික ප්‍රචණ්ඩත්වය; ද්වේෂ සහගත අදහස් දැක්වීම්; තජර්නයන්, බියවැද්දීම් හා බලහත්කාරකම්; සහ පද්ධතිමය වශයෙන් වන කොන් කිරීමේ ක්‍රියා හෝ භාවිතයන්.

මෙම පසුතලය මත, මෙම අධ්‍යයනය ඔස්සේ 2015 ට පසු කාලසීමාව තුළ ආගමික සුළුතර කණ්ඩායම් ඉලක්ක කරගනිමින් සිදුවූ ප්‍රචණ්ඩ ක්‍රියා සිදුවීම් විශ්ලේෂණය කෙරේ. ඊට අමතරව, 2015 දී යහපාලන රජය පත්වීම තිබියදී වුව වාගර්ික-ආගමික ප්‍රචණ්ඩත්වය නොනැසී පැවතීම විවරණය කිරීමද මෙහි ඉලකයක් වේ. අවසාන වශයෙන්, සුළුතර-විරෝධී ප්‍රචණ්ඩත්වයන් පවතින්නේ රජය විසින් මෙම ප්‍රචණ්ඩ ක්‍රියාවන් සිදුවීමට බලය ලබාදීමෙහි ලා යම් කිසි භූමිකාවක් රඟ දක්වන නිසා හෝ අකමර්ණ්‍යතාවය ඔස්සේ මෙම ප්‍රචණ්ඩ ක්‍රියාවන් සිදුකළ වරදකරුවන්ට දණ්ඩ මුක්තියකින් යුතුව හැසිරීමට ඉඩ ලබාදී ඇති නිසා යැයි මෙම අධ්‍යයනය විසින් නිශ්චය කරයි.

මෙම අධ්‍යයනය කොටස් හතරක් ඔස්සේ ඉදිරිපත් කෙරී ඇත. පළමු කොටස මගින්, ආගමික සුළුතර කණ්ඩායම් ඉලක්ක කොට ගනිමින් ප්‍රචණ්ඩ සිදුවීම් සිදුවූ විමශර්ණයට බඳුන්ව ඇති කාල පරිච්ඡේදය (2015 ජනවාරි-2019 අගෝස්තු) සඳහා වන සමාජ-දේශපාලන සන්දභර්ය විභාග කෙරේ. දෙවෙනි කොටස මගින්, ක්‍රිස්තියානි ප්‍රජාවන්ට එරෙහිව වූ ආගමික ප්‍රචණ්ඩ ක්‍රියා සිදුවීම් වලට අදාළ නැඹුරුතාවයන් සම්බන්ධයෙන් සංසන්දනාත්මක ප්‍රමාණාත්මක හා ගුණාත්මක විශ්ලේෂණයක් ඉදිරිපත් කෙරේ. මෙම කොටස මගින් විමශර්ණයට බඳුන්ව ඇති කාල පරිච්ඡේදයට එදිරිව 2010-2014 කාල පරිච්ඡේදය තුළ ක්‍රිස්තියානි භක්තිකයින් ඉලක්ක කොට ගනිමින් සිදුවූ ආගමික ප්‍රචණ්ඩත්ව සිදුවීම් වල ප්‍රධාන සොයාගැනීම් සංසන්දනය කෙරේ.[8] ඒ අනුව මෙම අධ්‍යයනය මගින්, ශ්‍රී ලංකාවේ ජාතික ක්‍රිස්තියානි ඉවැන්ජලික සන්ධානය (NCEASL) මගින් සම්පාදනය කරන්නට යෙදුණු ක්‍රිස්තියානි භක්තිකයින්ට එරෙහිව සිදුවූ ප්‍රචණ්ඩකාරී සිදුවීම් සම්බන්ධව විමශර්ණයට ලක්වූ කාල පරිච්ඡේදයට අදාළව, එනම් අවුරුදු 4 ක් සහ මාස 8 ක් ඇතුළත එක්රැස් කෙරුණු දත්ත විශ්ලේෂණය කරයි.

මෙම ශ්‍රී ලංකාවේ ජාතික ක්‍රිස්තියානි ඉවැන්ජලික සන්ධානය විසින් සැපයුණු දත්ත, මීන් පෙර සිදුකළ *Silent Suppression: Restrictions on Religious Freedoms of Christians 1994-2014* අධ්‍යයනයේදී වෙරිටෙ රිසච් (VR) මගින් දියුණු කොට භාවිතයට ගැනුණු වර්ගීකරණ පද්ධතියක් භාවිතා කරමින් වර්ගීකරණය කොට ඇත. මෙසේ වර්ගීකරණය කෙරුණු දත්ත ඉන් පසුව ක්‍රිස්තියානි භක්තික ප්‍රජාවන් ඉලක්ක කරගනිමින් සිදුවූ ආගමික ප්‍රචණ්ඩත්ව සිදුවීම් වල නිතර සිදුවූ හානි ආකාරයන්, සිදුවීම් භූගෝලීය වශයෙන් සිතියම් ගත වීම්, ප්‍රධාන ඉලක්ක කණ්ඩායම්, ප්‍රධාන වරදකරුවන් සහ රාජ්‍යයේ භූමිකාව හඳුනාගැනීම සඳහා භාවිතා කොට තිබේ.

තුන්වන කොටස මගින්, 2017, 2018 සහ 2019 වසරවලදී මුස්ලිම් ප්‍රජාව ඉලක්ක කරගනිමින් සිදුවූ 'හදිසි උග්‍ර' ප්‍රචණ්ඩත්ව සිදුවීම් තුනක් ගුණාත්මකව විශ්ලේෂණයට විෂය-අධ්‍යයන ප්‍රවේශයක් ලබාගෙන ඇත. තවදුරටත්, ශ්‍රී ලංකාවේ උතුරු සහ නැගෙනහිර ප්‍රදේශයන්හි සිදුවෙන බවට චෝදනා එල්ල වන 'සිංහලීකරණය/බෞද්ධාගමීකරණය' සම්බන්ධයෙන් වන ගුණාත්මක විශ්ලේෂණයක්ද මෙම අධ්‍යයනය මගින් සිදුකෙරේ. අවසාන වශයෙන්, සමාප්තිය ලකුණු කරනා කොටස මගින් ආගමික නිදහස සහ ශ්‍රී ලංකාවේ ආගමික සුළුතර කණ්ඩායම් ඉලක්ක කොටගත් ආගමික ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙන් වන ප්‍රධාන සොයාගැනීම් ඉදිරිපත් කෙරේ.

## මෙම අධ්‍යයනයේ පරාමිතීන්

අධ්‍යයනයට සමාන ලෙසින්, ශ්‍රී ලංකාවේ ජාතික ක්‍රිස්තියානි ඉවැන්ජලික සන්ධානයේ සිදුවීම් වාතර්‍රාවන් මත පදනම්ව, මෙම අධ්‍යයනයේ එන සිදුවීම්ද 'ආගමික අභිප්‍රේරණයකින්' සිදුවූවන් ලෙසින් වර්ගීකරණය කොට ඇත. කෙසේ වෙතත්, වෙරිටෙ රිසච් වෙත ආගමික අභිප්‍රේරණයකින් යුතුව සිදුවූ බවට හඳුනාගැනීමට නොහැකි වූ යම් යම් සිදුවීම් ඉවත් කොට ඇත. ශ්‍රී ලංකාවේ ජාතික ක්‍රිස්තියානි ඉවැන්ජලික සන්ධානයේ සිදුවීම් වාතර්‍රාවන් හි අන්තගර්ත සිදුවීම් වල තොරතුරු ප්‍රධාන මූලාශ්‍රයන්ගෙන් අත්පත් කොටගෙන ඇත. ඉන් පසුව ශ්‍රී ලංකාවේ ජාතික ක්‍රිස්තියානි ඉවැන්ජලික සන්ධානය මගින් අදාළ ප්‍රදේශයන්හි තම ජාලය සහ/හෝ ශ්‍රී ලංකාවේ ජාතික ක්‍රිස්තියානි ඉවැන්ජලික සන්ධානයේ ප්‍රාදේශීය නිලධාරී (එවැන්නන් සිටිනා විට) සම්බන්ධ කරගැනීම ඔස්සේ එම තොරතුරු ස්ථිර කොට ඇත. ඉදිරිපත් කොට ඇති තොරතුරු වල සත්‍යතාවය තක්සේරු කරගැනීම උදෙසා, අඩු තරමින් ශ්‍රී ලංකාවේ ජාතික ක්‍රිස්තියානි ඉවැන්ජලික සන්ධානයේ ප්‍රධාන කායර්‍යාලයේ නිලධාරීන් දෙදෙනෙකු විසින් වෙන් වෙන්ව අදාළ වගඋත්තරකාර පාශර්‍වයන් සම්බන්ධ කොටගෙන ඇත. ශ්‍රී ලංකාවේ ජාතික ක්‍රිස්තියානි ඉවැන්ජලික සන්ධානය මගින් සැපයුණු වාතර්‍රාවන් සෑමවිටම පරිපූණර්‍, විස්තීණර්‍ ලැයිස්තු නොවිය හැක. කෙසේ නමුත්, එම ලැයිස්තුවට තුන්වන පාශර්‍ව මූලාශ්‍රයන්ගෙන් දත්ත (ක්‍රිස්තියානි භක්තිකයින්ට එරෙහිව වූ ප්‍රචණ්ඩත්ව සිදුවීම් පිළිබඳ වාතර්‍රාවන් හා සම්බන්ධව) එක් කිරීමට කිසිදු ප්‍රයත්නයක් ගැනී නොමැත. මූලික දෝෂ පරීක්ෂා කිරීම් සහ දත්ත පිරිසිදු කිරීම් වලට අමතරව, වෙරිටෙ රිසච් මගින් තුන්වන පාශර්‍වීය මූලාශ්‍රයන් ඔස්සේ දත්ත තහවුරු කරගෙන නොමැත. කෙසේ වෙතත්, එකම සිදුවීම් නැවත නැවත වාතර්‍රා ගත කෙරී තිබීමට ඇති හැකියාව සම්බන්ධයෙන් වෙරිටෙ රිසච් මගින් පරීක්ෂා කොට බලා ඇති අතර, එසේ එකම සිදුවීමම නැවත වාතර්‍රා වී ඇති අවස්ථා මුණගැසුණු විටක ඒවා ඉවත් කිරීමටද කටයුතු කර ඇත.

# සමාජ-දේශපාලන සන්දහර්ය විශ්ලේෂණය

## සුළුතර විරෝධී මනෝභාවයන්ගේ යළි පිබිදීම

පසුගිය වසර පහ තුළදී, රජයක මාරුවීම, නව 'සිංහල-බෞද්ධ ජාතිකවාදී' පක්ෂයක නිමර්ාණය[9] මෙන්ම භයානක ත්‍රස්තවාදී ප්‍රහාරයක්ද ශ්‍රී ලංකාව අත්විඳ තිබේ. මෙම පසුතලය යටතේ 2015 වසරෙන් පසු ශ්‍රී ලංකාවේ ආගමික සුළුතරයන්ට ලැබුණු සැලකුම් වල පැන නැගි නැඹුරුතාවයන් මෙම අධ්‍යයනය මගින් බැරෑරුම් විශ්ලේෂණයකට සහ ඇගයුම් කිරීමකට බඳුන් කොට ඇත.

ශ්‍රී ලංකාවේ පශ්චාත්-යුධ සමය, සුළුතර වාගරීක කණ්ඩායම් කොන් කිරීමකට ලක් කෙරුණු සිංහල-බෞද්ධ ජාතිකවාදයේ හදිසි නැගීමක් සමගින් සලකුණු විණි.[10] මෙම කොන් කිරීම බොහෝ කොට බැර කෙරුණේ, සිංහල-බෞද්ධ ජාතිකවාදී දෘෂ්ටිවාදය ප්‍රවධර්නය කරන අතරතුර, රටේ යටිතල පහසුකම් සංවධර්නය කිරීම යුද්ධයෙන් පසුකාලීන ප්‍රවේශය ලෙසින් ගත් පැරණි මහින්ද රාජපක්ෂ පාලනයටයි.[11] ශ්‍රී ලංකාවට සුළුතර-විරෝධී ඇජෙන්ඩාවකින් යුක්ත වූ බෞද්ධ කලහකාරී සංවිධානයක් වූ බොදු බල සේනා (BBS) ඇතුළු වාගරීක-ආගමික ජාතිකවාදී කණ්ඩායම් වල නැගී සිටීමක් දැකගැනීමට හැකි වූයේ මෙම පසුතලය යටතේයි.

2015 වසරේදී සිදුවූ ප්‍රජාතාන්ත්‍රික ආණ්ඩු මාරුව මගින්, 'වගර්වාදී ජාතිකවාදය' 'ලිබරල් ජාතිකවාදය (නිදහස් ජාතිකවාදය) වෙතට විතැන් වනු ඇතැයි අපේක්ෂාවන් නිමර්ාණය කරන ලදී.[12] වගර්වාදී ජාතිකවාදය මගින් රාජ්‍යය බහුතර වාගරීක-ආගමික කණ්ඩායම ඔස්සේ ජනවාගරීකරණය කිරීමක් ඉල්ලා සිටින අතර, බොහෝ විට ඒ ඔස්සේ සුළුතරයන් සමග වන ගැටුම් ඇතිවේ. මීට ප්‍රතිවිරුද්ධ ලෙසින් ලිබරල් ජාතිකවාදය, ස්වාධීනත්වයේ, සමානාත්මතාවයේ, පුද්ගල අයිතිවාසිකම් හි සහ ඇතුළත්කරණයේ හරයන් හා සංසක්තව සිටී. එය මගින්, අනෙකුත් අභිබවා එක් ජාතික සංස්කෘතියක් ප්‍රවධර්නය කිරීමට ප්‍රතිවිරුද්ධව හවුල් පුරවැසිභාවයක් වටා දේශපාලන අනන්‍යතාවයක් ගොඩනැංවීමට පෙරට පැමිණේ.[13] මේ අනුව, රජය මාරුවිම ඔස්සේ ආගමික සුළුතරයන්ට එරෙහි සංවිධානාත්මක ප්‍රචණ්ඩත්වයේ තාවකාලික අඩුවීමක් දක්නට ලැබිණි.[14] කෙසේ වෙතත්, මෙම අධ්‍යයනය මගින් තකර් කොට සිටින්නේ පෙර ප්‍රජා ප්‍රචණ්ඩ ක්‍රියාවන්ට වගකිව යුතු වරදකරුවන්ව නීතිය ඉදිරියට ගෙන ඒමට අපොහොසත් වීම හේතුවෙන්, එම වරදකරුවන් අදද ක්‍රියාකාරීව සිටිනා දණ්ඩ මුක්තියක වාතාවරණයක් නිමර්ාණය වූ බවටයි. මෙම අක්‍රියාකාරීත්වය සහ දණ්ඩ මුක්තිය, 2015 වසරෙන් පසු කාලසීමාව තුළ රටේ සුළුතරයන් ඉලක්ක කොටගනිමින් සිදුවුණු ආගමික ප්‍රචණ්ඩත්වයේ මුල්බැසගැනීම සහ එවන් සිදුවීම් ඉහළ යෑම ඔස්සේ විද්‍යමාන විණි. මෙම සිදුවීම් 2019 වසරේදී පාස්කු ඉරිදා ත්‍රස්ත ප්‍රහාරයන් සහ ඊට පළිගැනීම් ලෙසින් වූ ප්‍රහාරයන් හා මුස්ලිම් ප්‍රජාව කොන් කිරීම් සමගින් උච්ඡ අවස්ථාවකට ළඟා වුණි. 2019 නොවැම්බර් 18 දින හිටපු ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ ශ්‍රී ලංකාවේ සත් වෙනි විධායක ජනපතිවරයා ලෙසින් දිවුරුම් දීමත් සමගින්, ශ්‍රී ලංකාවේ දේශපාලන සන්දහර්ය වෙනස් විණි. සැලකිය යුතු පරිද්දෙන්, බොදුබල සේනා (BBS) සහ සිංහල රාවය වැනි වාගරීක-ආගමික ජාතිකවාදී සිංහල-බෞද්ධ කණ්ඩායම් විසින් ගෝඨාභය රාජපක්ෂගේ ජයග්‍රහණය දැක තිබුණේ, සිංහල ජාතිය වෙත මුස්ලිම් සහ දමිළ අන්තවාදී කණ්ඩායම් වෙතින් ආරක්ෂාව ලැබීමේ ජයක් ලෙසිනි. මෙම පසුතලය යටතේ මහ මැතිවරණයද සමගින් ඔවුන් තම කණ්ඩායම් විසුරුවා හැරීමේ අභිප්‍රාය නිවේදනය කර සිටියේ, තවදුරටත් ඔවුන්ගේ 'අවශ්‍යතාවයක්' නොමැති බව දක්වමිනි.[15] කෙසේ වුවත් පුවත්පත් හා වෙනත් ජනමාධ්‍ය වාතර්ාවන්ගෙන් දැක්වුණේ, සිංහ ලේ වැනි අනෙකුත් අන්ත ජාතිකවාදී සිංහල-බෞද්ධ කණ්ඩායම් මෑතකාලීනව යම් යම් ගැටළු-

-විශේෂයෙන්ම පැවසෙන ආකාරයට බෞද්ධාගමට හා ක්‍රිස්තියානි දහමට අපහාස කෙරුණු එක්සත් ජාතික පක්ෂ පාලරීමේන්තු මන්ත්‍රී රන්ජන් රාමනායකගේ මතභේදකාරී දුරකථන සංවාද පටිගත කිරීම්- සම්බන්ධයෙන් හඬ නැගූ බවයි.[16] සමස්තයක් ලෙසින්, නව පාලනය මගින් උග්‍ර-ජාතිකවාදී සිංහල-බෞද්ධ සහ ඉස්ලාමික කලහකාරී කණ්ඩායම් වලට එරෙහිව සටන් වැදීම සඳහාත්, ආගමික සුළුතරයන් ආරක්ෂා කිරීම සඳහාත් පියවර ගනු ඇතිද යන්න අනාගතයේදී දැකිය යුතු කරුණකි.

ගෙහාන් ගුණතිලක ඇතුළු විද්වතුන් තකර් නගන කරුණක් වන්නේ, රජයේ සක්‍රිය සහ/හෝ නිහඬ සහායෙන් තොරව වුවද වාගරීක-ආගමික ප්‍රචණ්ඩත්වය පැවතිය හැකි බවටයි.[17] එනිසා, සුළුතර-විරෝධී ප්‍රචණ්ඩත්වය රජයයන් වෙනස් වුවද නොනැසී පැවතිය හැක. ව්‍යාප්තව පවත්නා සුළුතර-විරෝධී හැඟීම් සහ ප්‍රචණ්ඩත්වය, ශ්‍රී ලංකාවේ වාගරීක-ආගමික ප්‍රචණ්ඩත්වයේ ඉතිහාසය විෂය කොට ගෙන බැලූ විට වටහා ගත හැක.

ශ්‍රී ලංකාවේ ප්‍රචණ්ඩ ක්‍රියා බොහෝ විට බහුතර සහ සුළුතර ප්‍රජාවන් අතර ඇති වූ අතර, බහුතරය සිංහල-බෞද්ධ ප්‍රජාව වීම හා සුළුතර ප්‍රජාවන් වාගරීක හා ආගමික පෙළපත් සමගින් නිවර්වනය වනු දක්නට හැක.[18] මේ අනුව ගුණතිලක විසින් තකර් නගන්නේ, සුළුතර-විරෝධී ප්‍රචණ්ඩත්වය අතිප්‍රමුඛ වශයෙන් බහුතර සිංහල-බෞද්ධ ප්‍රජාවේ කොටස් අතර පැතිර පවත්නා හිමිකාරීත්ව සංකීණර්ය සහ පැවැත්ම පිළිබඳ අනාරක්ෂිත භාවය ඔස්සේ ඉදිරියට යන බවටයි.[19]

මෙම හිමිකාරීත්ව සංකීණර්ය විශාල වශයෙන්ම ප්‍රාණය ලබා ඇත්තේ, තමන්ට මෙම රට සඳහා සුජාතමය, ඓතිහාසික අයිතියක් තිබෙනා බවට (එනම් මෙය මුල පටන්ම සිංහල-බෞද්ධ රටක් බවට) සිංහල-බෞද්ධ ප්‍රජාව තුළ සිටිනා ඇතැම් කොටස් නෛසගරීකවම එල්බ ගෙන සිටිනා විශ්වාසය ඔස්සේයි. මෙම අයිතිය සඳහා 'ඓතිහාසික සාක්ෂ්‍ය' ලබාදෙන බවට බොහෝ විට ප්‍රවධර්නය කරමින් මූලාශ්‍රයක් ලෙසින් දැක්වෙන්නේ මහාවංශයයි (ශ්‍රී ලංකාවේ බෞද්ධ රාජ්‍යාත්වයන්යේ වංශ කථාව රචනා කොට ඇති ප්‍රවාදමය-ඓතිහාසික කෘතියක්).[20] සැබවින්ම මෙම හිමිකාරීත්ව සංකීණර්ය ඔස්සේ බහුතරයක මනස තුළ මුල්බැසගෙන ඇති සත්කාරක-ආගන්තුක ගතිකයක් වෙත ප්‍රභවය ලබා දේ. එනම් මෙහිදී සිංහල-බෞද්ධ ප්‍රජාව යනු ප්‍රමුඛ පුරවැසියන් සහ සුළුතරයන් යනු ආගන්තුකයන් ලෙසින් දැකීමයි.[21] මෙම 'සත්කාරක-ආගන්තුක' ගතිකය තුළ, ආගන්තුකයින් විසින් 'පවත්නා බල ව්‍යුහයන්ට අභියෝග නොකළ යුතු' බවට දිරිගැන්වේ.[22]

පැවැත්ම පිළිබඳ අනාරක්ෂිත භාවයන් සම්බන්ධ වන්නේ, රටේ සිංහල-බෞද්ධ ප්‍රජාවේ ආධිපත්‍යයික ස්ථාවරයට ඇතැයි අවබෝධ කොට ගෙන ඇති 'පැවැත්මේ තජර්නය' වෙතයි.

ස්ටැන්ලි ජේ. තම්බයියා වැනි විද්වතුන් මෙම අනාරක්ෂිත භාවය විග්‍රහ කොට ඇත්තේ, සිංහල-බෞද්ධ ප්‍රජාව 'සුළුතර සංකීණර්යකින් යුක්ත බහුතරයක්' ලෙසින් පෙන්වා දෙමිනි.[23] තම්බයියා ප්‍රකාශ කොට සිටින්නේ, ඇතැම් සිංහල-බෞද්ධයින් විසින් වඩාත් පුළුල් ගෝලීය සන්දහර්ය තුළ තමන් සුළුතරයක් ලෙසින් සලකන බවයි. මෙම ගෝලීය සන්දහර්ය, ගෝලීය ප්‍රජාවන් සිටින්නේයැයි සිතන ශ්‍රී ලංකාවේ දමිළ, මුස්ලිම් සහ ක්‍රිස්තියානි ප්‍රජාවන් ලෙසින් අදහස් කෙරේ. එනම් ඒ ඔස්සේ රටේ සැබෑ සුළුතරය සිංහල-බෞද්ධයින් වේ යැයි අදහස් කෙරේ.[24] ඒ නිසාම, ශ්‍රී ලංකාවේ සිංහල-බෞද්ධ ආධිපත්‍යයට හානි කිරීමට විභවයක් ඇතැයි සිතනා අන්තරායන්ගෙන් සිය වාගරීක-ආගමික අනන්‍යතාවය ආරක්ෂා කර ගැනීමට සිංහල-බෞද්ධයන් කටයුතු කරති.[25]

මෙම තිබෙන්නේ යැයි සිතනා පැවැත්ම පිළිබඳ තජර්නයන්ට නිදශර්න සියලුම වාගරීක-ආගමික සුළුතරයන් තුළින් සොයාගත හැක. උදාහරණයක් ලෙසින් දක්වන්නේ නම්, මුස්ලිම් ප්‍රජාවගේ ජනගහණ වධර්නය පිළිබඳ භීතිය හා යා වුණු මුස්ලිම් ප්‍රජාව ආථරීකමය වශයෙන් වඩාත් සමෘද්ධිමත්ය යන හැඟීම හඳුනාගැනුණේ, බහුතර සිංහල-බෞද්ධයින්ගේ අනන්‍යතාවයට සහ ආථරීක අවකාශයට තජර්නයක් ලෙසිනි. මේ අතර, දමිළ ස්වාධිපත්‍යය ලබාගැනීම සඳහා දියත් වුණු දෙමළ ඊලාම් විමුක්ති කොටි (LTTE) සංවිධානයේ බෙදුම්වාදී න්‍යාය පත්‍රය හඳුනාගැනුණේ, සිංහල-බෞද්ධ ප්‍රජාවේ භෞමික ආධිපත්‍යයට තජර්නයක් ලෙසිනි. ක්‍රිස්තියානි ආගම්කරණය (උදා: ආගම් ප්‍රචාරණය හෝ ආගමට හරවා ගැනීම) දැක තිබුණේ සිංහල-බෞද්ධ සංඛ්‍යාත්මක හා සංස්කෘතිකමය ආධිපත්‍යයට තජර්නයක් එල්ල කරන්නක් ලෙසිනි.[26]

වඩාත් මෑතකාලීනව, පශ්චාත් යුධ සන්දහර්ය තුළදී, ශ්‍රී ලංකාවේ උතුරු සහ නැගෙනහිර ප්‍රදේශයන්හි ආධිපත්‍යයික මතවාදයක් ලෙසින් දමිළ-හින්දුවාදයේ පැන නැගීමක් සිදුවිණි.[27] මෙම මතවාදය ප්‍රධාන වශයෙන්ම බලගැන්වුණේ, දමිළ-හින්දූන් හට ක්‍රිස්තියානි දහමට හැරවීම් ඇතුළු අනෙකුත් ආගමික ප්‍රචාරණයන් හමුවේ මුහුණ දීමට සිදුව ඇතැයි ප්‍රත්‍යක්ෂ කොටගත් පැවැත්වේ තජර්නය මගිනි.[28]

මෙම තජර්නයන්, සුළුතර 'ආගන්තුකයින්' විසින් පවත්නා බල ව්‍යුහයට අභියෝග කරන්නක් ලෙසින් අථර් විවරණය කළ හැකි අතර, එය සුළුතර හා බහුතර ප්‍රජාවන් අතර ප්‍රචණ්ඩත්වය දක්වා වැඩිවධර්නය වීමේ හැකියාවක්ද ඇත. මෙම අධ්‍යයනයේද දැක්වී ඇති පරිදි, මෙම බහුතර-සුළුතර ගතිකයන් ප්‍රාදේශීය දිස්ත්‍රික්ක-මට්ටමේදී සැලකිය යුතු ලෙසින් වෙනස් වීමේ නැඹුරුතාවයක් තිබේ. උදාහරණයක් ලෙසින් දක්වන්නේ නම්, මඩකළපුව දමිළ-හින්දු ආධිපත්‍යය සහිත වාගරීක-ආගමික සංයුතියකින් සැදෙන අතර, පොළොන්නරුව බහුතර සිංහල-බෞද්ධ වාගරීක-ආගමික සංයුතියකින් යුක්ත වේ.

මෙම පසුබිම තුළ, මෙම අධ්‍යයනය තුළ වාතර්‍ා ගත කෙරී සහ විශ්ලේෂණය කෙරී ඇති, ක්‍රිස්තියානි, මුස්ලිම් හා හින්දු භක්තිකයින් ඉලක්ක කොටගෙන සිදුවූ වාගරීක-ආගමික ප්‍රචණ්ඩත්ව සිදුවීම්, ප්‍රාදේශීය ආගමික බහුතරයේ වාගරීක-ආගමික ආධිපත්‍යයට අනතුරුදායක බවට ප්‍රත්‍යක්ෂ කොට ගත් උක්ත පැවැත්ම පිළිබඳ තජර්නයන්ගේ විද්‍යමාන වීම් වලට ප්‍රතිචාර ලෙසින් සිදුවූවන් සේ දැකිය හැක.


# ක්‍රිස්තියානි භක්තිකයන්ට එරෙහි ආගමික ප්‍රචණ්ඩත්වයේ නැඹුරුතාවයන් පිළිබඳ විශ්ලේෂණය

මෙම අධ්‍යයනය ඔස්සේ අවධානය යොමු කොට ඇත්තේ 2015 ජනවාරි සිට 2019 අගෝස්තු දක්වා කාලසීමාවටයි. මෙම අධ්‍යයනය සම්පාදනය කරන අවස්ථාව වන විට, 2019 වසරේ අවසන් මාස හතරේ සිදුවීම් වාතර්ාවන් ලබාගැනීමට නොතිබූ බව කිව යුතුවේ. එනිසා, මෙම අධ්‍යයනයේ වන දත්ත, 2019 අගෝස්තු මස දක්වා සීමාසහිත වී ඇත. මෙම සීමා කිරීමද සලකා බලමින්, වසර 4 ක් සහ මාස 8 ක් වන කාලසීමාව අධ්‍යයනය කළ විට, ශ්‍රී ලංකාවේ ක්‍රිස්තියානි භක්තික ප්‍රජාව ඉලක්ක කරගනිමින් සිදුවූ ආගමික ප්‍රචණ්ඩත්ව සිදුවීම් අඩු තරමින් 397 ක් ලේඛනගතව ඇත. මෙසේ සමාලෝචනයට බඳුන් කළ කාලසීමාව තනිව ගත්තක් නොවේ. ඒ වෙනුවට, මින් පෙර අධ්‍යයනයකදී, වසර 21 කටත් වැඩි කාල පරිච්ඡේදයක් (1994-2014) පුරාවට වාතර්ා වූ, ක්‍රිස්තියානු භක්තිකයින් විසින් මුහුණ දී ඇති ප්‍රචණ්ඩත්වයේ දිගින් දිගටම පැවතුණු නැඹුරුතාවයන්ගේ සන්දභර්යක එය විශ්ලේෂණයට බඳුන් කොට ඇත.

මින් පෙර මේ සම්බන්ධයෙන් වූ අධ්‍යයනය වන Silent Suppression: Restrictions on Religious Freedoms of Christians 1994-2014 මගින්, වසර 20 කටත් වැඩි කාලයක් පුරාවට ශ්‍රී ලංකාවේ ජාතික ක්‍රිස්තියානි ඉවැන්ජලික සන්ධානය (NCEASL)මගින් එක්රැස් කළ වාතර්ාවන් මත පදනම්ව, ශ්‍රී ලංකාවේ ක්‍රිස්තියානි භක්තිකයින්ව ඉලක්ක කොටගනිමින් සිදුවූ ආගමික ප්‍රචණ්ඩ ක්‍රියාවන් හා කොන් කිරීම් විශ්ලේෂණය කොට ඇත.

නිරීක්ෂණයට බඳුන් වූ කාලය තුළ වාතර්ා වූ සිදුවීම්, සිදුවූ හානියේ ආකාරය, ප්‍රධාන ඉලක්කයන්, ප්‍රමුඛතම වරදකරුවන් හා භූගෝලීය විසිරීම ඔස්සේ වගර්ීකරණය කෙරී ඇත. මෙම වගර්ීකරණය මගින්, ක්‍රිස්තියානි භක්තිකයින් මුහුණ දුන් ආගමික ප්‍රචණ්ඩත්ව සිදුවීම් විශ්ලේෂණය කිරීම පහසු කොට ඇත. මෙම අධ්‍යයනයේ මෙයින් පසුව හමුවන කොටස් ඔස්සේ 2015 ජනවාරි සිට 2019 අගෝස්තු දක්වා කාලය තුළ සිදුවූ ආගමික ප්‍රචණ්ඩත්ව සිදුවීම් අතර -

නිදශර්කය 1: ක්‍රිස්තියානි භක්තිකයින්ව ඉලක්ක කරගත් සමස්ත ආගමික ප්‍රචණ්ඩ සිදුවීම් සංඛ්‍යාව *2010-2019* (අගෝස්තු)



- අන්තර් සම්බන්ධතාවයන් සහ අනුක්‍රමික කාල පරිච්ඡේදයන් -එනම්, 2010 න් පසු (2010-2014) සහ 2015 න් පසු (2015-2019)- ඔස්සේ සංසන්දනයන්ද පිරික්සා බලයි.

පහත දැක්වෙන නිරීක්ෂණයන් සිදුකෙරී ඇත්තේ, මෙම සිදුවීම් සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ ජාතික ක්‍රිස්තියානි ඉවැන්ජලික සන්ධානයේ ආවරණය සහ වාතර්ා කිරීමේ ශීඝ්‍රතාවය, නිරීක්ෂණයට ලක්වූ කාලය තුළ ස්ථායීව තිබූ බවට උපකල්පනය කරමිනි.

## සිදුවීම් කාලානුක්‍රමිකව දැක්වීම


2010 න් පසු කාලයට සාපේක්ෂව ගත් විට, 2015 න් පසු කාලය සම්බන්ධයෙන් කරන සමීප විමශර්ණයකදී, ක්‍රිස්තියානි භක්තිකයින් ඉලක්ක කොට ගනිමින් වූ ආගමික ප්‍රචණ්ඩත්වයේ රටාවන් සම්බන්ධව ධනාත්මක නැඹුරුතාවයන් දෙකක් හෙළිදරවු වේ. මෙම නැඹුරුතාවයන් දෙක ප්‍රමාණාත්මක සහ ගුණාත්මක යන දෙයාකාරයෙන්ම -එනම් පිළිවෙලින් සිදුවීම් ඇතිවූ වාර ගණන සහ ප්‍රචණ්ඩත්වයේ ආකාරය- විද්‍යමාන වේ.

(1) සිදුවීම් සීඝ්‍රතාවය – 2015 න් පසු කාලය තුළ මාසයක් තුළ වාතර්ා වූ සිදුවීම් සාමාන්‍යයේ ක්‍රමානුකූල වැඩිවීමක් දැක්වුණද (2010 න් පසු කාලයේ වූ මාසයකට සිදුවීම් 5 ක් හා සසඳන විට මාසයකට සිදුවීම් 7 ක්), 2010 න් පසු කාලය හා සංසන්දනය කරනා විට, - සිදුවීම් සීඝ්‍රතාවයේ ක්ෂණික පහළ වැටීමක් 2015 න් පසු කාලය තුළ දක්නට ලැබිණි.

මෙම අධ්‍යයනය තුළදී සීඝ්‍රතාවය ලෙසින් හඳුන්වන්නේ අදාළ කාල පරාසයක් තුළ සිදුවීම් සිදුවීමේ අනුපාතයයි. ආගමික ප්‍රචණ්ඩත්ව සිදුවීම් සිදුවූ සීඝ්‍රතාවය ඔස්සේ බලන විට 2010 ට පෙර කාලය හා සංසන්දනයේදී 2010 න් පසු කාලය තුළ විස්මය දනවන වැඩිවීමක් දක්නට ලැබෙනා අතර, 2013 හා 2014 වසර වල ඉහළම සිදුවීම් ප්‍රමාණයක් වාතර්ා වී ඇත (පිළිවෙලින් සිදුවීම් 93 ක් සහ 89 ක් ලෙසින් දැක්වේ). සැලකිය යුතු ලෙසින්, 2010 න් පසු කාලයේ සිදුවූ ප්‍රචණ්ඩත්වය වැඩිවීමේ සීඝ්‍රතාවය දිගටම පැවතුණේ නම්, 2015න් පසු කාලපරිච්ඡේදය 2013 දී වාතර්ා වූ ඉහළම ප්‍රචණ්ඩ සිදුවීම් සංඛ්‍යාව ඉක්මවනු ඇත. එබැවින්, 2015 න් පසු කාලපරිච්ඡේදයේ සිදුවීම් වල සීඝ්‍රතාවය ප්‍රචණ්ඩත්ව සිදුවීම් වල මූලික මට්ටමට නොගියත් (එනම් සිදුවීම් 25 ක්)[b], ආගමික ප්‍රචණ්ඩත්ව සිදුවීම් වල සීඝ්‍රතාවය 2010 න් පසු කාලයේ සීඝ්‍රතාවය දක්වා වැඩි නැත. වෙනත් ලෙසකින් පවසන්නේ නම්, 2015 න් පසු කාලයේ ඕනෑම වසරක වාතර්ාගත සිදුවීම් සංඛ්‍යාව. 2013 වසරේ සිදුවීම් සංඛ්‍යාවට වඩා අඩු ගණනක පැවතිණි.

[b] මෙම අධ්‍යයනයේදී, ප්‍රචණ්ඩත්වයේ මූලික මට්ටම ඇස්තමේන්තුගත කොට ඇත්තේ, වසර 10 ක කාලපරිච්ඡේදය (2010-2019) තුළ වාතර්ාගත අඩුම ආගමික ප්‍රචණ්ඩත්ව සිදුවීම් සංඛ්‍යාව ලෙසිනි.

නිදශර්කය 2: ක්‍රිස්තියානි භක්තිකයින්ට එරෙහි ප්‍රචණ්ඩත්වය *2010-2019 (අගෝස්තු)*



(2) ප්‍රචණ්ඩත්ව ආකාර – 2015 න් පසු කාලය තුළ ලේඛනගත වූ සිදුවීම් වල සීග්‍රතාවයේ මඳ පහළ බැස්මක් වාතර්‍ා වුවද, එම පහළ බැස්මෙන් බොහෝ කොටසකට හේතුකාරක වූයේ විමශර්‍ණයට බඳුන් වූ කාලය තුළ භෞතික ප්‍රචණ්ඩත්වය සම්බන්ධ වූ සිදුවීම් සංඛ්‍යාවේ සැලකිය යුතු අඩු වීමයි (2 නිදශර්‍නයේ දැක්වෙන ලෙසට). මෙම අධ්‍යයනයේ අරමුණ සඳහා, භෞතික ප්‍රචණ්ඩත්වය වෙතට පුද්ගලයින්ට එරෙහි ශාරීරික හිංසනය, සහ දේපළ වෙත සිදුකෙරෙන හානිය හෝ විනාශ කිරීම ඇතුළත් වූ අතර, භෞතික නොවන ප්‍රචණ්ඩත්වය සඳහා ද්වේශ සහගත අදහස් දැක්වීම්, තජර්‍නයන්, බියවැද්දීම් හෝ බලාත්කාරකම්, සහ පද්ධතිමය කොන් කිරීමේ ක්‍රියාවන් හෝ භාවිතයන් ඇතුළත් විණි. සැලකිය යුතු පරිද්දෙන්, 2016 දී භෞතික ප්‍රචණ්ඩත්වය සියලුම කාලයන් සලකා බලන විට අඩුම අගයකට -එනම් සිදුවීම් 11 ක් පමණකට- පැමිණ තිබිණි. ක්‍රිස්තියානි භක්තිකයින් මුහුණ දුන් සමස්ත සිදුවීම් සංඛ්‍යාවේ කොටසක් ලෙසින් ගත් විට, භෞතික ප්‍රචණ්ඩත්වය සම්බන්ධ වූ සිදුවීම් ප්‍රමාණය වසර දහයක කාලපරිච්ඡේදය තුළ උච්ඡාවචනය විණි. 2019 අප්‍රේල් මාසයේදී ක්‍රිස්තියානි භක්තිකයින් මුහුණ දුන් භෞතික ප්‍රචණ්ඩත්වයේ රටාවන්ගේ අනියමයක් වාතර්‍ා විණි. එම අනියමය පිළිබඳ වැඩි විස්තර, අංක 1 ඇමුණුමෙහි ඉදිරිපත් කොට ඇත.

## හිංසන ආකාර

නිදශර්‍කය 2 මගින්, වසර 10 ක කාලපරිච්ඡේදය පුරාවට වූ භෞතික නොවන සිදුවීම් වල ක්ෂණික ඉහළ නැගීම් සහ තිරසාර පැවතීම් ඉස්මතු කොට ඇත. මෙම සන්දභර්‍ය තුළ, විමශර්‍ණයට ලක්වූ කාලපරිච්ඡේදය තුළ ක්‍රිස්තියානි ප්‍රජාව මුහුණ දුන් භෞතික නොවන හිංසන සිදුවීම් වලින් විශාල කොටසක් (87%) සැදුම් ලද්දේ *කොන් කිරීමේ ක්‍රියා හෝ භාවිතාවන්* ගෙනි (උදා: නිදශර්‍කය 3 හි දැක්වෙන ආකාරයට 276 කි). මෙම ආකාරයේ හිංසන පැමිණවීම් (*කොන් කිරීමේ ක්‍රියා හෝ භාවිතාවන්*) මගින් ප්‍රධාන වශයෙන් ඉලක්ක කරගනු ලැබ ඇත්තේ වැඳුම් පිදුම් කරනා ස්ථානයන් (සිදුවීම් 192 ක්) සහ පාස්ටවර්රුන් (සිදුවීම් 96 ක්) වේ (නිදශර්‍කය 4 බලන්න).

එනිසා, මෙම හිංසන ආකාරය යටතේ සාමාන්‍යයෙන් වාතර්‍ාගතව ඇති සිදුවීම් වන්නේ වැඳුම් පිදුම් ස්ථානයක නීතිමය භාවය සම්බන්ධයෙන් පාස්ටවර්රයෙකුව ප්‍රශ්න කිරීම හෝ කුමනාකාරයක හෝ ආගමික ක්‍රියාකාරකම් නවත්වන ලෙසින් කියා සිටීම වේ. ක්‍රිස්තියානි භක්තිකයින්ට එරෙහිව වූ අනෙකුත් කොන් කිරීම් වලට, පොදු සුසාන භූමියක මිහිදන් කිරීමේ අයිතිය ප්‍රතික්ෂේප කිරීම සහ ක්‍රිස්තියානි ශිෂ්‍යයින්ව පාසැල් වලට ඇතුළත් කරගැනීම ප්‍රතික්ෂේප කිරීම ඇතුළත් වේ.

මෙම දැක්වූ හිංසන ආකාරයේ පොදු ගුණාංගයක් වූයේ, මේ ආකාරයේ සිදුවීම් වලින් 50% කටත් වඩා ප්‍රමාණයක වරදකරුවන් වූයේ රාජ්‍ය නිලධාරීන් වීමයි. සැබවින්ම ක්‍රිස්තියානි භක්තිකයින් මුහුණ දුන් මෙම කොන් කිරීම් සඳහා රාජ්‍යයේ නිරන්තර මැදිහත්වීම මගින් හැඟවෙන්නේ එවන් මැදිහත්වීමක ඇති පද්ධතිමය ස්වභාවයයි. ආගමික වශයෙන් කොන් කිරීම් සිදුකිරීම සඳහා රාජ්‍යය විසින් පෙනෙන පරිදි සිදුකරන සැලකිය යුතු භූමිකාව, මෙම අධ්‍යයනයේ පසුව එන කොටස් තුළ වඩාත් විස්තරාත්මකව අධ්‍යයනය කර තිබේ.


මේ අතරවාරයේදී, තජර්‍නයන්, බියවැද්දීම් හා බලාත්කාරයන් ඇතුළත් වූ සිදුවීම් වලින් 60% කට වඩා ප්‍රමාණයක වරදකරුවන් වූයේ ප්‍රදේශයේ වැසියන් (හඳුනාගත හැකි පුද්ගලයින් ලෙසින් වගර්‍ කෙරී ඇත) -එනම් දෙවෙනියට වඩාත් බහුලව පවතින වරදකරුවන්ගේ කාණ්ඩය- වේ. ප්‍රදේශවාසීන් සම්බන්ධ වූ සිදුවීම් වලදී බොහෝ විට පුද්ගලයින් විසින් පල්ලි වටලා, පාස්ටවර්රුන් හට තමන්ගේ අදාළ වන්දනාමාන කටයුතු නවත්වන ලෙසට තජර්‍නය කිරීම්/බලෙන් කියා සිටීම් ඇතුළත් විණි. තවදුරටත්, මෙම සිදුවීම් වලින් අතිවිශාල ප්‍රමාණයකදී ප්‍රදේශවාසීන් ප්‍රාදේශීය ආගමික ආයකයෙකු (එනම් බෞද්ධ භික්ෂුවක් හෝ හින්දු පූජකවරයෙක්) නැතිනම් ප්‍රාදේශීය රාජ්‍ය ක්‍රියාකාරකයෙකු (එනම් ප්‍රාදේශීය ලේකම් වරුන් වැනි) සමගින් පැමිණ තිබිණි. මෙම ආකාරයේ ක්‍රිස්තියානි භක්තිකයින් ඉලක්ක කොට ගැනුණු භෞතික නොවන ආකාරයේ ප්‍රචණ්ඩ ක්‍රියාවන් සාමාන්‍යයෙන් ප්‍රාදේශීයව සිදුවී ඇත. එනම්, මෙවැනි සිදුවීම් විශේෂයෙන්ම යම් ප්‍රදේශයකට සීමා වී ඇතිවාක් විනා, ජාතික මට්ටමකින් සිදුවී නොතිබුණි. සුළුතර අයිතිවාසිකම් කණ්ඩායම (Minority Rights Group -MRG) මගින් නිරීක්ෂණය කර තිබූ පරිදි, 'මෙහි ගැඹුරෙහි අඩංගු වන හැඟීම වන්නේ ක්‍රිස්තියානි භක්තිකයින් යනු 'ප්‍රාදේශිකයින්' යන සාම්ප්‍රදායික නිවර්චනයට අනුකූල නොවන 'පිටස්තරයන්' වන බැවින් ඔවුන් ප්‍රදේශයට සාදරයෙන් පිළිගැනෙන්නේ නැතිය' යන්නයි.[29] එනිසා, යම් කිසි ප්‍රදේශයක පවත්නා තුල්‍ය තත්වයට වන තජර්‍නය, පෙනෙනා ලෙසට මෙම ප්‍රචණ්ඩ ක්‍රියාවන්ට හේතු වී ඇත.

සමස්තයක් ලෙසින්, 2010 න් පසු කාලපරිච්ඡේදය තුළ වඩාත්ම වැඩියෙන් නැවත නැවත සිදුවූ හිංසන ආකාරය ලෙසින් වාතර්‍ාගත වී තිබුණේ තජර්‍නයන්, බියවැද්දීම් හෝ බලාත්කාරයන් වේ. මෙයට සමගාමීව, 2010 ට පෙර පස් අවුරුදු කාලසීමාව (එනම් 2005-2009

කාලය) හා සැසඳීමේදී 2010 න් පසු කාලය තුළ කොන් කිරීම් සම්බන්ධ වූ සිදුවීම් ප්‍රමාණයේ වැඩිවීමක් දක්නට ලැබේ. සාමූහික වශයෙන් ගත් කළ, මෙම අධ්‍යයනය සඳහා නිරීක්ෂණයට බඳුන් වූ කාල සීමාව මෙන්ම ඉන් පෙර පස් අවුරුදු කාල සීමාවද සැලකූ විට, ක්‍රිස්තියානි භක්තිකයින් මුහුණ දෙන හිංසන ආකාරයන් පිළිබඳ දත්ත මගින් හැඟවෙන්නේ ක්‍රිස්තියානි භක්තිකයින්ට එරෙහිව වන ප්‍රචණ්ඩත්වයේ ස්වභාවය පද්ධතිමය, භෞතික නොවන සහ ව්‍යුහාත්මක ආකාරයක් ගන්නා බවයි.[c] මෙම කී කාලපරිච්ඡේද දෙකෙහි ඇගයීමක් මගින් හෙළිදරව් වන්නේ, ක්‍රිස්තියානි භක්තිකයින්ට එරෙහි ප්‍රචණ්ඩත්වයේ පුළුල් ස්වභාවය නොවෙනස්ව පවත්නා බවයි. කෙසේ වුවත්, 2015 න් පසු කාලසීමාව තුළ ක්‍රිස්තියානි භක්තිකයින් මුහුණ දුන් හිංසන ආකාරයේ වෙනස් වීමක් සලකුණු වී ඇත. එනම් තර්ජනයන්, බියවැද්දීම් හා බලාත්කාරයන්ගෙන් එය කොන් කිරීමේ ක්‍රියාවන් හා භාවිතයන් වෙත පැමිණ ඇත.


[c] ‘ව්‍යුහාත්මක ප්‍රචණ්ඩත්වය’ යනු සමාජ ව්‍යුහයන් හෝ සමාජ සංස්ථාවන් මගින් පුද්ගලයින්ට ඔවුන්ගේ මූලික අවශ්‍යතාවයන් ලබාගැනීම වැළැක්වූ විට ඔවුන් [පුද්ගලයින්] වෙත පැමිණෙන හිංසනය ලෙසින් යොහාන් ගැල්ටන්ග් විසින් නිර්වචනය කර ඇත. මෙම සන්දර්භයේදී ‘ව්‍යුහාත්මක ප්‍රචණ්ඩත්වය’ ස්වභාවයෙන්ම ‘එදිරිවාදී’ වේ.

නිදශර්කය 3: ක්‍රිස්තියානි භක්තිකයින්ව ඉලක්ක කරගත් ආගමික ප්‍රචණ්ඩත්ව සිදුවීම් වල දක්නට ලැබුණු හානි සිදුවීම් ආකාරයන්, *2015-2019* (අගෝස්තු)





*එක් සිදුවීමක් තුළ, හානි ආකාර එකකට වඩා ඇතුළත් විය හැක. එනිසා, හානි ආකාරයන්ට අනුව කරනා ගණනය කිරීම් සියල්ලෙහි එකතුව, සමස්ත සිදුවීම් සංඛ්‍යාවට වඩා වැඩි විය හැක.

නිදශර්කය 4: ක්‍රිස්තියානි භක්තිකයින්ව ඉලක්ක කරගත් ආගමික ප්‍රචණ්ඩත්ව සිදුවීම් වල ප්‍රධාන ඉලක්කයන්, *2015-2019* (අගෝස්තු)




'එක් සිදුවීමක් තුළ ප්‍රධාන ඉලක්කයන් එකකට වඩා තිබිය හැක

නිදශර්කය 5: ක්‍රිස්තියානි භක්තිකයින්ව ඉලක්ක කරගත් ආගමික ප්‍රචණ්ඩත්ව සිදුවීම් වල ප්‍රමුඛ වරදකරුවන්, *2015-2019 (අගෝස්තු)*



# රාජ්‍යයේ භූමිකාව

ආගම් හෝ විශ්වාසයේ නිදහස පිළිබඳ එක්සත් ජාතීන්ගේ විශේෂ නියෝජිත අහමඩ් ශහීඩ් විසින් 2019 අගෝස්තු මාසයේදී ශ්‍රී ලංකාවට පැමිණි ඔහුගේ සංචාරයේදී කළ මූලික සොයාගැනීම් වලදී, ආගම් හෝ විශ්වාසයන් සඳහා වන නිදහසට (FORB) ඇති අයිතිය ආරක්ෂා කරනු වස් රාජ්‍යයට ඇති බැඳීම් දෙකක් හඳුනාගන්නා ලදී.[30] ඔහු මෙම බැඳීම් හඳුනාගනු ලැබුවේ, තමන්ට ආගමකට හෝ විශ්වාසයකට ඇති නිදහස කෙනෙකුට භාවිතා කිරීමට ඇති අයිතියට ගරු කිරීම සඳහා රාජ්‍යයෙන් වන සෘණාත්මක බැඳීමක් සහ තෙවන පාශර්වයන්/රාජ්‍ය-නොවන ක්‍රියාකාරකයන් විසින් යටකී අයිතීන් උල්ලංඝනය කිරීමට එරෙහිව ආරක්ෂාව සැපයීමට රාජ්‍යයට ඇති ධනාත්මක බැඳීමක් යන දෙකක් ලෙසිනි.

මෙම කොටස මගින්, 2015 කාලපරිච්ඡේදයෙන් පසුව ශ්‍රී ලංකාවේ ක්‍රිස්තියානි ප්‍රජාවන් මුහුණ දුන් ආගමික ප්‍රචණ්ඩත්ව ක්‍රියාවන් සම්බන්ධව වන බැඳීම් ඉෂ්ට සිද්ධ කිරීමේදී රාජ්‍යයේ භූමිකාව බැරෑරුම්ව විභාග කෙරේ. එනිසා, ක්‍රිස්තියානි ප්‍රජාව කෙරෙහි වන (1) සෘණාත්මක, සහ (2) ධනාත්මක බැඳීම් විෂයෙහි, රාජ්‍යයේ භූමිකාව තක්සේරුගත කොට ඇත. මෙම අධ්‍යයනය තුළ, රජය මගින් සිදුකරන ආගමික ප්‍රචණ්ඩ ක්‍රියාවන් විෂයෙහිදී පොලිස් නිලධාරීන්, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, පළාත් සභා නිලධාරීන්, නගර සභා, ප්‍රාදේශීය සභා සහ නාගරික සංවර්ධන අධිකාරිය ඇතුළුව ප්‍රාදේශීය තලයක වන ක්‍රියාකාරකයන් ප්‍රමුඛ වශයෙන් දක්වා ඇත.

## (1) රාජ්‍යයේ සෘණාත්මක බැඳීම

ඉහතින් විස්තර කොට ඇති ආකාරයට, රජයේ සෘණාත්මක බැඳීම පුද්ගලයින්ට සිය ආගම් හෝ විශ්වාසයන් සඳහා වන නිදහස භුක්තිවිඳීමට ඇති අයිතියට ගරු කිරීම හා සම්බන්ධ වේ. 5 වන නිදශර්කයෙන් චිත්‍රණය කොට පෙන්වන ආකාරයට, සැලකිය යුතු සිදුවීම් ප්‍රතිශතයක (40% කටත් වඩා වැඩි) ක්‍රිස්තියානි භක්තිකයින්ට එරෙහි ආගමික ප්‍රචණ්ඩත්වයේදී ප්‍රමුඛ වරදකරුවන්/වරදකාර පාශර්වය ලෙසින් රාජ්‍ය ආයතන හෝ මහජන සේවකයින් වාතර්ා වී ඇත. වෙනත් ලෙසකින් පවසන්නේ නම්, ශ්‍රී ලංකාවේ ක්‍රිස්තියානි භක්තිකයින්ව ඉලක්ක කරගනිමින් සිදුවන ආගමික ප්‍රචණ්ඩත්ව සිදුවීම් වලින් 40% කට වැඩි ප්‍රමාණයකදී රජය පෙනෙනා ලෙසින් ආගමික හෝ ඇදහිලි සඳහා වන නිදහසට (FORB) සෘජුව බාධා කොට ඇත. සැබවින්ම ක්‍රිස්තියානි භක්තිකයින් හට සිය ආගමික හෝ ඇදහිලි සඳහා වන නිදහස භුක්ති විඳීමට ඇති හැකියාවට සෘජුවම රජය විසින් බාධා කිරීම ඔස්සේ, රජය ක්‍රිස්තියානි ප්‍රජාව වෙත තමන්ගේ ඇති සෘණාත්මක බැඳීම ඉටු කිරීමෙහි ලා අසමර්ථ වී ඇත.

බොහෝ සිදුවීම් වලදී, භෞතික නොවන ප්‍රචණ්ඩත්වය සම්බන්ධ වූ සිදුවීම් වලදී රජය ප්‍රමුඛ වරදකරුවෙකු/වරදකාර පාශර්වය බවට පත්ව ඇත්තේ එම සිදුවීම් වලට සහාය වීමෙනි. මෙම භෞතික නොවන ප්‍රචණ්ඩත්ව සිදුවීම් වලදී, රජය වගකිව යුතු ප්‍රධානතම හිංසා ආකාරය වන්නේ කොන් කිරීමේ ක්‍රියාවන් හෝ භාවිතයන් වේ (සිදුවීම් 276 කින් 158 ක් නැතිනම් 57% ක්).


ක්‍රිස්තියානි භක්තිකයින්ට එරෙහිව රාජ්‍යයේ මූලිකත්වයෙන් යුතු කොන් කිරීමේ සිදුවීම් සඳහා සාමාන්‍යයෙන් සිදුවූයේ 2008 වසරේ නව වැඳුම් පිදුම් ස්ථාන ඉදිකිරීම පිළිබඳ චක්‍රලේඛය භාවිත කරමිනි. තොරතුරු දැනගැනීමේ පනත යටතේ ගොනු කරනු ලැබූ පෙත්සමකින් අනතුරුව බුද්ධ ශාසන අමාත්‍යාංශය සහ ක්‍රිස්තියානි කටයුතු දෙපාතර්මේන්තුව යන දෙකම මගින් ස්ථිර කරන ලද්දේ, ක්‍රිස්තියානි ආගමික වැඳුම් පිදුම් කරනා ස්ථානයන් ලියාපදිංචි කිරීමේ අවශ්‍යතාවයක් නොමැති බවටයි.[31] කෙසේ වෙතත්, වැඳුම් පිදුම් ස්ථානයක් නීතිවිරෝධීද/අවසරයකින් තොරද යන්න තීරණය කිරීමට හෝ වැඳුම් පිදුම් ස්ථානයක් ලියාපදිංචි කොට ඇතිද/නීත්‍යානුකූලද යන්න සෙවීමට හෝ රාජ්‍ය ක්‍රියාකාරකයන් විසින් තවමත් උක්ත චක්‍රලේඛය බලාත්මකව යොදාගනී. මෙම රාජ්‍ය මූලිකත්වයෙන් යුතු, වැඳුම් පිදුම් කරනා ස්ථානයන්ට එරෙහි වෙනස් ලෙසින් සැලකීම 2013 සහ 2014 වසර වලදී උච්චතම අවස්ථාවකට පැමිණුනි (ලියාපදිංචි වීමට අසමත් වීම නිසාවෙන් දේවස්ථාන 39 ක් වසා දැමිණි.) වාතර්ාගත කෙරුණු කාලය තුළ සිදුවීම් 35 ක් සලකුණු කළ හැකි වූ අතර, එහිදී රාජ්‍ය ක්‍රියාකාරකයන් විසින් ක්‍රිස්තියානි වැඳුම් පිදුම් කරනා ස්ථානයන් අවශ්‍ය අනුමැතිය ලබාගෙන නොමැති වීම කරණ කොට ගනිමින් එම ස්ථාන නීතිවිරෝධී/අනවසර ලෙසින් තීරණය කොට අත්හිටුවීම නැතිනම් ආගමික ක්‍රියාකාරකම් සිදුකිරීම නවත්වන ලදී.

වැඳුම් පිදුම් කරනා ස්ථානයක් 'නීතිවිරෝධී/අනවසර' එකක්දැයි නිශ්චය කිරීමේදී රාජ්‍යය සැමවිටකම පැහැදිලිව මෙම චක්‍රලේඛය සම්බන්ධයෙන් සඳහන් නොකරයි. තවදුරටත්, මෙම චක්‍රලේඛය 'නව වැඳුම් පිදුම් ස්ථානයන්' වෙත සීමාවී තිබුණත්, දැනටමත් තිබෙනා වැඳුම් පිදුම් ස්ථාන පවා නීතිවිරෝධී/අනවසර යැයි තීරණය කිරීම සඳහා මෙම චක්‍රලේඛය යොදාගැනුණු අවස්ථාවන් එකකට වැඩි ප්‍රමාණයක් ශ්‍රී ලංකා ජාතික ක්‍රිස්තියානි ඉවැන්ජලික සන්ධානයේ සිදුවීම් වාතර්ාවන් ඔස්සේ ලේඛනගතව ඇත. මෙම චක්‍රලේඛය යොදාගැනුණු උච්චතම සිදුවීම් වලදී රාජ්‍ය ක්‍රියාකාරකයන් විසින්, තමන් අදාළ ලියාපදිංචිය ලබාගන්නා තුරු සියලුම ආගමික ක්‍රියාකාරකම් නැවැත්වීමට එකඟ වන බවට ලිපියක් අත්සන් කිරීම සඳහා පාස්ටවර්රුන් වෙත බලපෑම් කර ඇත. 6 වන නිදශර්කයෙන් පෙනී යන්නේ 2015 න් පසු කාලය තුලදී, වැඳුම් පිදුම් කරනා ස්ථානයක් නීතිවිරෝධී/අනවසර එකක් ලෙසින් නිශ්චය කිරීම සඳහා පදනමක් ලෙස මෙම චක්‍රලේඛය යොදාගැනීමේ අවස්ථාවන් අඩු වීමකි. කෙසේ වෙතත්, 2015 වසරේදී රජය මාරු වීම තිබියදී පවා, දිගින් දිගටම මෙම චක්‍රලේඛය බලාත්කාරයෙන් ක්‍රියාත්මක කිරීම ඔස්සේ පෙනී යන්නේ, ආගමික වශයෙන් කොන් කිරීම් සිදුකිරීමේදී ප්‍රාදේශීය මට්ටමේ රාජ්‍ය ක්‍රියාකාරකයන්ගේ දිගින් දිගටම වන සම්බන්ධයයි.

භෞතික හිංසනය සහිත රාජ්‍යය මැදිහත් වූ සිදුවීම් විරල වේ. කෙසේ වෙතත්, 2015 දී සිය ආගමික ක්‍රියාකාරකම් නවත්වා අදාළ ගමෙන් පිටව යැම ප්‍රතික්ෂේප කළ පාස්ටවර්රයෙකු හට පළාත් සභා සභාපතිවරයෙකු විසින් ශාරීරික පහර දීමක් සිදුකිරීමේ සිදුවීමක් වාතර්ා විණි.

සමස්තයක් ලෙසින් ගත් විට, විශ්ලේෂණයට ලක්වූ දත්ත මගින්, වරදකාරී පාශර්වය ලෙසින් රාජ්‍යයේ භූමිකාව ප්‍රභලව විදහා දක්වයි. තවදුරටත්, රාජ්‍යයේ ප්‍රමුඛත්වයෙන් යුත් ප්‍රචණ්ඩත්වය, ස්වභාවයෙන්ම ගත් කල පුළුල් වශයෙන් ව්‍යුහාත්මක, පද්ධතිමය සහ ප්‍රාදේශීය වන බවද පෙනී යයි.

නිදශර්කය 6: නිරීක්ෂිත වසර ගණනාව පුරාවට වැඳුම් පිදුම් කරනා ස්ථානයක් නීතිවිරෝධී/අනවසර බවට නිශ්චය කළ වාර ගණන



## (2) රාජ්‍යයේ ධනාත්මක බැඳීම

ක්‍රිස්තියානි ප්‍රජාව කෙරෙහි රාජ්‍යයේ (එනම් පොලිසියේ සහ රාජ්‍ය නිලධාරීන්ගේ) ඇති ධනාත්මක බැඳීම කොටස් වලට කඩා දැක්වීම මෙම කොටසේ අරමුණ වේ. ක්‍රිස්තියානි භක්තිකයින්ගේ අයිතිවාසිකම් තුන්වන පාශර්වයක්/රාජ්‍ය නොවන ක්‍රියාකාරකයන් මගින් උල්ලංඝනය වීමෙන් ඔවුන්ව ආරක්ෂා කිරීම සහ ක්‍රිස්තියානි භක්තිකයින්ට ඔවුන්ගේ යටකී අයිතිවාසිකම් භුක්තිවිඳීමට විධිවිධාන සලසා දීම මෙම බැඳීම යටතට අයත් වේ.[d] සැලකිය යුතු ලෙසින්, රාජ්‍ය නොවන/තුන්වන පාශර්වයන් (එනම් ප්‍රදේශවාසීන්, බෞද්ධ භික්ෂූන් වැනි) වරදකරුවන් ලෙසින් හඳුනාගැනීම මගින් හැඟවුම් කෙරෙන්නේ, රාජ්‍යය සැමවිටම ප්‍රචණ්ඩත්වය හේතුකාරක නොවන නමුත්, එහි දුස්සහාය භූමිකාවක් ඉටු කරනා බවයි. මෙම කොටස ඔස්සේ විශ්ලේෂණය කෙරෙන්නේ, බෞද්ධ භික්ෂූන් හැර වෙනත් ක්‍රියාකාරකයන් සම්බන්ධ වූ සිදුවීම් හා සංසන්දනාත්මකව බැලූ විට, බෞද්ධ භික්ෂූන් සම්බන්ධ වූ හෝ නායකත්වය දුන් ආගමික ප්‍රචණ්ඩත්ව සිදුවීම් සඳහා පොලිසිය දක්වා ඇති ප්‍රතිචාරයන් පමණි. රාජ්‍යය මෙම ධනාත්මක බැඳීම ඉෂ්ට සිද්ධ කිරීම ඇගයුම් කිරීමේදී, බෞද්ධ භික්ෂූන් විසින් සිදුකළ ආගමික ප්‍රචණ්ඩ ක්‍රියාවන් වෙත පොලිසියේ වූ ප්‍රතිචාරය මෙම අධ්‍යයනය ඔස්සේ පහත පරිදි කාණ්ඩගත කොට ඇත.

③ සක්‍රීය ඍණාත්මක - පොලිසිය එම ආගමික ප්‍රචණ්ඩත්ව ක්‍රියාවන් සිදුවන තැන සිටින අතර, එම ප්‍රචණ්ඩ ක්‍රියාවට සක්‍රියව/නිහඬව සහාය දැක්වීමෙන් සම්බන්ධ වූ විට.

③ නිශ්ක්‍රිය ඍණාත්මක - පොලිසිය එම ප්‍රචණ්ඩ ක්‍රියාව සිදුවන තැන සිටියත්, ඊට ගොදුරු වන ප්‍රධාන ඉලක්කයේ ආරක්ෂාවට මැදිහත් නොවී එම ආගමික හිංසනය සිදුවීමට ඉඩදීම/පහසුකම් ලබාදෙන විට. ප්‍රචණ්ඩ ක්‍රියාවක් සිදුවන විට ඔවුන් එතැන නොසිටියත්, සිදුවීමෙන් පසුව අදාළ වගවීමේ ක්‍රියාවලිය සම්බන්ධයෙන් පසු විපරම් කිරීම ප්‍රතික්ෂේප කිරීමද මෙම කාණ්ඩයට අයත් වේ.


③ සක්‍රිය ධනාත්මක - පොලිසිය ආගමික ප්‍රචණ්ත්ව සිදුවීමක් වන විට එතැන හිඳ, එම සිදුවීමේ ප්‍රධාන ඉලක්කය ආරක්ෂා කිරීමට මැදිහත් වූ විට.

③ නිශ්ක්‍රිය ධනාත්මක - ප්‍රචණ්ඩ ක්‍රියාවක් සිදුවන විට ඔවුන් එතැන නොසිටියත්, සිදුවීමෙන් පසුව ඊට අදාළ වගවීමේ ක්‍රියාවලිය සම්බන්ධයෙන් පසු විපරමක් සිදුකරන විට.

බෞද්ධ භික්ෂූන් ප්‍රධාන වරදකරුවන් ලෙසින් හඳුනා ගත් සිදුවීම් සමස්ත වශයෙන් 119 කින් (නිදශර්කය 7 බලන්න), සිදුවීම් 50 කදී පොලිසිය සක්‍රිය ඍණාත්මක ආකාරයකින් සහ නිශ්ක්‍රිය ඍණාත්මක ආකාරයකින් ප්‍රතිචාර දක්වා ඇත (පිළිවෙලින් අවස්ථා 40 කදී සහ අවස්ථා 10 කදී).

[d] මෙම අධ්‍යයනයේ අරමුණ උදෙසා, තුන්වන පාශර්වය/රාජ්‍ය නොවන ක්‍රියාකාරකයන් යන්න, රාජ්‍ය ආයතන සහ මහජන සේවකයින් හැරෙන්නට අනෙකුත් සියලුම ප්‍රධාන වරදකරුවන් කාණ්ඩයන් ඇතුළත් කොට නිවර්චනය කෙරී ඇත.

නිදර්ශකය 7: බෞද්ධ භික්ෂූන් ප්‍රධාන වරදකරුවන් වූ විට පොලිසියේ ප්‍රතිචාරය




*බෞද්ධ භික්ෂූන් වරදකරුවන් ලෙසින් දැක්වුණු සිදුවීම් 38 ක් සඳහා ප්‍රතිචාරයන් නොමැත/නොදනී.

බෞද්ධ භික්ෂූන් ප්‍රධාන වරදකරුවන් ලෙසින් හඳුනාගැනුණු සිදුවීම් 119 ක සමස්තයකින් (නිදශර්කය 7 බලන්න), සිදුවීම් 50 කදී පොලිසිය සක්‍රිය ඍණාත්මක ආකාරයකින් සහ නිශ්ක්‍රිය ඍණාත්මක ආකාරයකින් ප්‍රතිචාර දක්වා ඇත (එනම් පිළිවෙලින් සිදුවීම් 40 කදී සහ 10 කදී, නිදශර්කය 7 බලන්න). එවන් ඍණාත්මක ප්‍රතිචාරයන්ගෙන් හැඟවෙන්නේ, බෞද්ධ භික්ෂූන් සම්බන්ධ වී ක්‍රිස්තියානි භක්තිකයින්ට ආගමික හිංසනයන් සිදුකරන විට පොලිසිය එතැන සිටි බව සහ සක්‍රියව/නිහඬව ඊට සහාය දුන් බව සහ/හෝ නිශ්ක්‍රියව ඊට අවකාශ සලසා දුන් බව වේ. සැලකිය යුතු පරිද්දෙන් ක්‍රිස්තියානි භක්තිකයින්ට එරෙහි ආගමික හිංසනයන්ට අවකාශ සැලසීමේ ඔවුන්ගේ නිශ්ක්‍රීය තීරණයේදී, පොලිසිය විසින් ක්‍රිස්තියානි භක්තිකයින්ට එරෙහිව -ඔවුන් ඍජු වරදකාරී පාශර්වය නොවන අවස්ථාවකදී පවා- කොන් කිරීමේ/හිංසා කිරීමේ අමතර මට්ටමක් කරා යෑමටද අවකාශ ලබාදී ඇත.

මීට ප්‍රතිවිරුද්ධ ලෙසින්, වරදකරු ලෙසින් බෞද්ධ භික්ෂුවක් සම්බන්ධ වූ සිදුවීම් 31 කදී පොලිසිය සක්‍රිය ධනාත්මක අයුරකින් සහ නිශ්ක්‍රිය ධනාත්මක අයුරකින් ප්‍රතිචාර දක්වා ඇත (පිළිවෙලින් සිදුවීම් 13 කදී හා 18 කදී, නිදශර්කය 7 බලන්න). මේ අතර, ප්‍රධාන වරදකරු ලෙසින් බෞද්ධ භික්ෂුවක් සම්බන්ධ නොවූ අවස්ථාවන් 63 කදී පොලිසිය සක්‍රිය ධනාත්මක ලෙසකින් හා නිශ්ක්‍රිය ධනාත්මක ලෙසකින් ප්‍රතිචාර දක්වා ඇත. මෙම දත්ත මගින් යෝජනා කෙරෙනුයේ, බෞද්ධ භික්ෂුවක් ප්‍රධාන වරදකරු වන අවස්ථාවකදී පොලිසිය ධනාත්මකව මැදිහත් වී, සිදුවීමට අදාළ ප්‍රධාන ඉලක්කය වෙත සහාය ලබාදීමේ හැකියාව අඩු බවයි.


සාපේක්ෂව ගත් විට ආරක්ෂක අංශ වල ඉහළ ප්‍රමාණයක ඍණාත්මක සක්‍රිය බව/අක්‍රිය බව සහ අඩු ප්‍රමාණයක ධනාත්මක මැදිහත් වීම මගින් සංකේතවත් වන්නේ, ශ්‍රී ලංකාවේ බෞද්ධ භික්ෂූන් හට ලැබී ඇති සුවිශේෂී ස්ථානය සහ දණ්ඩ මුක්තියයි.

මෙවන් 'බෞද්ධ ශ්‍රමණ සුවිශේෂීකරණය' මගින් දැක්වෙන්නේ සාමාන්‍ය නීති සහ සංරෝධනයන් භික්ෂූන්ට අනුග්‍රහයෙහි අත්හිටුවෙන්නේ කෙසේද යන්නයි.[32] උදාහරණ ලෙසින් ගත් විට, පොලිසිය විසින් තත්වය සමනය කරන්නට උත්සාහ නොගත් සිදුවීම් කිහිපයක් විණි. ඒ වෙනුවට පොලිසිය සිටියදීම බෞද්ධ භික්ෂූන් විසින් පහැදිලි ලෙසම පාස්ටවර්රුන්ට තජර්නය කරන ලදී. බෞද්ධ භික්ෂූන්ට ලබාදී ඇති මෙම සුවිශේෂීකරණය සහ දණ්ඩ මුක්තිය ඔස්සේ, ආගමික සුළුතරයන්ට එරෙහිව බෞද්ධ භික්ෂූන් වැනි තෙවන පාශර්වයන්/රාජ්‍ය නොවන ක්‍රියාකාරකයන් මගින් සිදුවන අයිතිවාසිකම් උල්ලංඝනයන්ගෙන් එම ආගමික සුළුතරයන්ගේ අයිතීන් ආරක්ෂා කිරීමට රජයට ඇති ධනාත්මක බැඳීමට ගහර්ා කිරීමක් සිදුවේ. තවදුරටත්, මෙම බෞද්ධ භික්ෂූන් භුක්ති විඳින සුවිශේෂීකරණය ඔස්සේ පිළිබිඹු වන්නේ, රාජ්‍ය ආයතනයන් තුළ සිංහල-බෞද්ධ බහුතරවාදය කෙතරම් ගැඹුරට මුල් විහිදී ඇතිද යන්නයි. මෙම සන්දභර්ය යටතේ ගෙහාන් ගුණතිලක වැනි විද්වතුන් විසින් තකර් නගා ඇත්තේ, සංස්ථාපිත ව්‍යුහයන් තුළ සිංහල-බෞද්ධ බහුතරවාදය මුල්බැස ගැනීම, ආයතනික් ක්‍රියාකාරකයන් විසින් සුළුතර කණ්ඩායම් වලට හානි ගෙන දෙමින් බහුතර මනෝභාවයන් පිනවීම කරා පොළඹවන 'ආයතනික ක්ෂය වීම'[33] වෙත පෙරටුගාමී වී ඇති බවයි. ආයතනික ක්ෂය වීම පිළිබඳව වන මෙම තකර්නය, 'මුස්ලිම් හා හින්දු භක්තිකයින් ඉලක්ක කෙරුණු ආගමික-වාගර්ික ප්‍රචණ්ඩත්වය පිළිබඳ විශ්ලේෂණය' යන මැයෙන් වන කොටසේදී තවදුරටත් විමංසනය කෙරෙනු ඇත.

# දිස්ත්‍රික්ක අනුව සිදුවීම් වල භූගෝලීය විසිරීම

2015 ට පසු කාලපරිච්ඡේදයේදී, ක්‍රිස්තියානි භක්තිකයින්ව ඉලක්ක කරගනිමින් වූ ආගමික ප්‍රචණ්ඩත්ව සිදුවීම්, ශ්‍රී ලංකාවේ පරිපාලන දිස්ත්‍රික්ක 25 න් 22 කම වාතර්‍ා විණි (නිදශර්කය 8 බලන්න). 2015 ත් 2019 ත් අතර කාලසීමාවේදී වැඩිම සිදුවීම් ප්‍රමාණයක් සංකේද්‍රණය වී තිබූ දිස්ත්‍රික්කය මඩකළපුව (59 ක්) වූ අතර, ඉන් පසුව වැඩිම සිදුවීම් සංකේන්ද්‍රණයක් වාතර්‍ා වූයේ පොලොන්නරුවෙනි (45 ක්) (2 ඇමුණුමෙහි මෙම දිස්ත්‍රික්ක පිළිබඳව වන සැලකිය යුතු ලක්ෂණයන් පැහැදිලි කෙරී ඇත). මෙම අධ්‍යයනයෙහි අරමුණ වන කාලපරිච්ඡේදයන් තුළ අන්තසර්ම්බන්ධතා පෙන්වීම සහ - කාලපරිච්ඡේදයන් අතරතුර සංසන්දනයන් කිරීම හා සංසක්ත වීම උදෙසා, මෙම කොටස මගින් සිදුවීම් භූගෝලීයව විසිරී තිබීම පිළිබඳ දත්ත පථයන් දෙකක් ඔස්සේ විශ්ලේෂණය කෙරී ඇත. පළමුව, දිස්ත්‍රික්කයකට වන ආගමික ප්‍රචණ්ඩත්ව සිදුවීම් සංඛ්‍යාව විෂයෙහිදී අදාළ කාල සීමාවන් ඔස්සේ (2010 න් පසු සහ 2015 න් පසු) වැඩිම සහ අඩුම අනුපාත වෙනස  සහිත දිස්ත්‍රික්ක පහ හඳුනාගැනීම සහ සිතියම් ගත කර ගැනීම ප්‍රයෝජනවත් වේ. දෙවෙනුව, කාලසීමාවන් ඔස්සේ, දිස්ත්‍රික්කයකට, ක්‍රිස්තියානි භක්තිකයින් 100,000 කට වාෂර්ික ආගමික ප්‍රචණ්ඩත්ව ක්‍රියා අනුපාතයේ වෙනස් වීම සිතියම්ගත කිරීම සහ විශ්ලේෂණය කිරීම ප්‍රයෝජනවත් වේ.

නිදශර්කය 8: *2010-2014* සහ *2015-2019* (අගෝස්තු) අතර සිදුවීම් ප්‍රමාණය දිස්ත්‍රික්ක අනුව




## (1) දිස්ත්‍රික්කයකට ආගමික ප්‍රචණ්ඩත්ව සිදුවීම් සංඛ්‍යාවේ ප්‍රතිශත වෙනස

2020 න් පසු සහ 2015 න් පසු කාලපරිච්ඡේදයන් අතර ලේඛනගත වී ඇති සිදුවීම් ඉහළම ප්‍රතිශතයකින් වැඩි වීමක් වාතර්ා වී ඇති දිස්ත්‍රික්ක පහ 9 නිදශර්කය ඔස්සේ දැක්වේ. සැලකිය යුතු ලෙසින්, ක්‍රිස්තියානි භක්තික ජනගහණයේ අඩුම ප්‍රතිශතයක් (1.1%) තිබෙනා දිස්ත්‍රික්කය වුවත් පොළොන්නරුව සිදුවීම් වැඩිවීමේ ඉහළම ප්‍රතිශතය (400%) වාතර්ා කොට ඇති අතර, ක්‍රිස්තියානි භක්තික ජනගහණයේ වැඩිම ප්‍රතිශතය (33%) වාතර්ා වන දිස්ත්‍රික්කය වුවත් පුත්තලම මෙම සිදුවීම් වැඩිවීමේ අඩුම ප්‍රතිශතය (43%) වාතර්ා කොට ඇත. තවදුරටත්, ක්‍රිස්තියානි භක්තිකයින්ව ඉලක්ක කොට ගත් ආගමික ප්‍රචණ්ඩත්ව සිදුවීම් වැඩිවීමේ ඉහළම ප්‍රතිශතයක් වාතර්ා කරනා දිස්ත්‍රික්කයන් පහෙන් වැඩි ප්‍රමාණයක් (5 න් 3 ක්) කම ක්‍රිස්තියානි භක්තික ජනගහණය 9% ට වඩා වැඩි ප්‍රමාණයක් ගනී (පොළොන්නරුව සහ කෑගල්ල හැරුණු කොට).

බාහිරස්ථයන් ඉවත් කිරීමේ අරමුණ උදෙසා, මෙම අධ්‍යයනය මගින් එකම කාලපරිච්ඡේදය තුළ ආගමික ප්‍රචණ්ඩකාරී සිදුවීම් අවම පහක මිණුමක් සලකුණු කොට ඇත. මෙම බාහිරස්ථයන් ඇතිවන්නේ දිස්ත්‍රික්කයන් 2010 සහ 2014 කාලය අතරතුරදී මුලින්ම ආගමික ප්‍රචණ්ඩ සිදුවීම් සුළු ප්‍රමාණයක් හෝ ශූන්‍යයක් වාතර්ා කොට ඇති අවස්ථාවන් වලදී වේ. උදාහරණ ලෙසින් ගත් විට, 2010 හා 2014 කාලය තුළ අම්පාර දිස්ත්‍රික්කයේ වාතර්ා වී ඇත්තේ ආගමික ප්‍රචණ්ඩ ක්‍රියා එකක් පමණක් වුවත්, 2015 හා 2019 කාලය අතරතුරදී එවැනි සිදුවීම් 13 ක් වාතර්ා වී ඇත. මෙහි ප්‍රතිඵලය වන්නේ, ආගමික ප්‍රචණ්ඩකාරී සිදුවීම් සංඛ්‍යාව වැඩිවීමේ ප්‍රතිශතය ලෙසින් 1200% ක් ලැබීමයි. එනිසා, අම්පාර දිස්ත්‍රික්කය සිදුවීම් වැඩිවීමේ ප්‍රතිශතය ලෙසින් 1200% ක ප්‍රමාණයක් වාතර්ා කොට තිබුණත්, එය ඉහළම ප්‍රතිශත වැඩිවීමේ කාණ්ඩයෙන් ඉවත් කොට ඇත.

මේ අතර, ක්‍රිස්තියානි භක්තිකයින්ව ඉලක්ක කරගනිමින් සිදුවූ ආගමික ප්‍රචණ්ඩත්ව ක්‍රියා ප්‍රමාණය පහත බැසීමේ ඉහළම ප්‍රතිශතය වාතර්ා වූ දිස්ත්‍රික්ක පහ, ක්‍රිස්තියානි භක්තික ජනගහණය 2% කට වඩා අඩු වූ, සිංහල-බෞද්ධ බහුතරය සිටිනා ප්‍රදේශයන් විණි.

නිදශර්කය 9: *2010-2014* සහ *2015-2019* (අගෝස්තු) අතර සිදුවීම් ප්‍රමාණයේ ප්‍රතිශතයන් වෙනස්වීම දිස්ත්‍රික්ක අනුව




**සිදුවීම් ප්‍රමාණය ඉහළ යෑම ප්‍රතිශතයක් ලෙස****

| | |
|---|---|
| 400% | පොළොන්නරුව (36) |
| 195% | මඩකළපුව (39) |
| 127% | කෑගල්ල (14) |
| 118% | ගම්පහ (20) |
| 43% | පුත්තලම (12) |

**සිදුවීම් ප්‍රමාණය පහත වැටීම ප්‍රතිශතයක් ලෙස****

| | |
|---|---|
| -90% | මාතලේ (9) |
| -76% | මොණරාගල (13) |
| -73% | රත්නපුර (11) |
| -67% | හම්බන්තොට (20) |
| -65% | අනුරාධපුර (13) |

* 2010-2014 කාලයේදී සිදුවූ එක් සිදුවීමක් හා සංසන්දනාත්මකව බලනා විට අම්පාර ප්‍රදේශයේ සිදුවීම් 12 ක් වාතර්ා වී ඇත. මෙය සිදුවීම් ප්‍රමාණය නිණර්ය කිරීමේදී ඉහළම වැඩිවීම ලෙසින් සලකා බලා නැත.

** 2015-2019 (අගෝස්තු) අතර කාලසීමාව සඳහා ඉහළම සහ පහළම සිදුවීම් නියත සංඛ්‍යාවක් සහිත දිස්ත්‍රික්ක 5, කාලසීමාවන් දෙක (එනම්, 2010-2014 සහ 2015-2019) තුළ සිදුවීම් ප්‍රතිශතයන්ගේ වෙනස්වීම සම්බන්ධයෙන් විශ්ලේෂණය කොට ඇත.

මෙම දිස්ත්‍රික්ක පහේ වාතර්ා වූ සිදුවීම් සංඛ්‍යාවේ ප්‍රතිශතය පහත වැටීම, 60% ක සිට 90% දක්වා පරාසයක විණි. මෙම පහත වැටීම ඔස්සේ හැඟවෙන්නේ, ආගමික ප්‍රචණ්ඩ ක්‍රියාවන් හි ප්‍රතිශතය පහත වැටීම, ඉහත දක්වා ඇති එවන් සිදුවීම් වල ප්‍රතිශතය ඉහළ නැගීම හා සංසන්දනය කරන විට ඉතා අඩු බවයි. සැලකිය යුතු පරිද්දෙන්, ආගමික ප්‍රචණ්ඩත්වය පිළිබඳ සිදුවීම් ඉහළම ප්‍රමාණයකින් අඩුවී ඇති දිස්ත්‍රික්ක පහ අතරට හම්බන්තොට දිස්ත්‍රික්කයද පැමිණ ඇත, 2010 හා 2014 කාලයේදී හම්බන්තොට දිස්ත්‍රික්කය මගින් වැඩිම ආගමික ආතතීන් හා ප්‍රචණ්ඩත්වය සම්බන්ධ සිදුවීම් (සිදුවීම් 30 ක්) ප්‍රමාණයක් පෙන්වා ඇත. කෙසේ වුවත් රජය මාරුවීමත් සමග, එම දිස්ත්‍රික්කයේ ක්‍රිස්තියානි භක්තිකයින් මු7හුණ පෑ ප්‍රචණ්ඩත්ව සිදුවීම් 67% කින් පහත වැටී ඇත.

## (2) ක්‍රිස්තියානි භක්තිකයින් 100,00 කට, දිස්ත්‍රික්කයකට සිදුවන ආගමික ප්‍රචණ්ඩත්ව ක්‍රියා වාෂර්ික අනුපාතය

මෙම විශ්ලේෂණයේදී උපයෝගී කරගෙන ඇති ක්‍රමවේදය කොටස් තුනකින් යුක්ත වේ. පළමුව, ආගමික ප්‍රචණ්ඩ ක්‍රියාවන් සඳහා මුහුණ දෙන ක්‍රිස්තියානි භක්තිකයින් ප්‍රමාණය සොයාගැනීම සඳහා දිස්ත්‍රික්කයකට වන සිදුවීම් ප්‍රමාණය (එක් එක් කාලපරිච්ඡේදයකදී), 2012 දී ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාතර්මේන්තුව මගින් නිකුත් කළ ජනගහණ දත්ත අනුව එම දිස්ත්‍රික්කයේ සිටිනා ක්‍රිස්තියානි භක්තිකයින් ප්‍රමාණයෙන් බෙදනු ලැබේ. දෙවෙනුව, ක්‍රිස්තියානි භක්තිකයින් 100,00 කට, දිස්ත්‍රික්කයකට අනුව ආගමික ප්‍රචණ්ඩත්ව සිදුවීම් වලට මුහුණ දෙන ක්‍රිස්තියානි භක්තිකයින් ප්‍රමාණය, අදාළ කාලපරිච්ඡේද දෙක ඔස්සේ ගණනය කෙරෙනු ලැබේ. අවසන් වශයෙන්, තුලනාත්මක භාවය සඳහා, එක් එක් සංඛ්‍යාව කාලපරිච්ඡේදයන් දෙක තුළ වන වසර ගණන ඔස්සේ ගණනය කර සාමාන්‍ය අගය සොයාගනු ලැබේ. මෙම ක්‍රිස්තියානි භක්තිකයින් 100,00 කට, දිස්ත්‍රික්කයකට සිදුවන ආගමික ප්‍රචණ්ඩත්ව ක්‍රියා වාෂර්ික අනුපාතය ගණනය කිරීම සම්බන්ධයෙන් වන සවිස්තරාත්මක පැහැදිලි කිරීමක් 3 වන ඇමුණුමෙහි දක්නට ඇත.


| දිස්ත්‍රික්කය | දිස්ත්‍රික්කයකට සිදුවීම් ප්‍රමාණය | | දිස්ත්‍රික්කයකට සිටින ක්‍රිස්තියානි භක්තිකයින් ප්‍රමාණය | ක්‍රිස්තියානි භක්තිකයින් 100,00 කට, දිස්ත්‍රික්කයකට සිදුවන ආගමික ප්‍රචණ්ඩත්ව ක්‍රියා වාෂර්ික අනුපාතය | |
|---|---|---|---|---|---|
| | 2010-2014 | 2015-2019 | | 2010-2014 | 2015-2019 |
| මඩකළපුව | 20 | 59 | 47,287 | 8 | 27 |
| පොළොන්නරුව | 9 | 45 | 4,468 | 40 | 216 |
| ගම්පහ | 17 | 37 | 495,478 | 1 | 2 |
| කෑගල්ල | 11 | 25 | 15,163 | 15 | 35 |
| අම්පාර | 1 | 13 | 13,129 | 2 | 21 |
| කළුතර | 20 | 32 | 48,730 | 8 | 14 |
| පුත්තලම | 28 | 40 | 252,314 | 2 | 3 |
| කුරුණෑගල | 11 | 19 | 53,637 | 4 | 8 |
| ත්‍රිකුණාමලය | 2 | 9 | 22,267 | 2 | 9 |
| මහනුවර | 13 | 19 | 35,177 | 7 | 12 |
| මන්නාරම | 0 | 4 | 57,205 | 0 | 1 |
| යාපනය | 1 | 4 | 95,985 | 0 | 1 |
| වවුනියාව | 1 | 4 | 23,803 | 1 | 4 |
| කිළිනොච්චිය | 0 | 0 | 18,499 | 0 | 0 |
| මුලතිවු | 0 | 0 | 12,727 | 0 | 0 |
| නුවර එළිය | 0 | 0 | 48,984 | 0 | 0 |
| කොළඹ | 24 | 23 | 229,308 | 2 | 2 |

| දිස්ත්‍රික්කය | දිස්ත්‍රික්කයකට සිදුවීම් ප්‍රමාණය | | දිස්ත්‍රික්කයකට සිටින ක්‍රිස්තියානි භක්තිකයින් ප්‍රමාණය | ක්‍රිස්තියානි භක්තිකයින් 100,00 කට, දිස්ත්‍රික්කයකට සිදුවන ආගමික ප්‍රචණ්ඩත්ව ක්‍රියා වාෂීක අනුපාතය | |
|---|---|---|---|---|---|
| | 2010-2014 | 2015-2019 | | 2010-2014 | 2015-2019 |
| මාතර | 14 | 13 | 5,640 | 50 | 49 |
| බදුල්ල | 6 | 4 | 18,635 | 6 | 5 |
| ගාල්ල | 25 | 21 | 9,730 | 51 | 46 |
| මාතලේ | 10 | 1 | 10,241 | 20 | 2 |
| රත්නපුර | 15 | 4 | 18,056 | 17 | 5 |
| අනුරාධපුර | 20 | 7 | 10,407 | 38 | 14 |
| මොණරාගල | 17 | 4 | 2,460 | 138 | 35 |
| හම්බන්තොට | 30 | 10 | 2,831 | 212 | 76 |

ප්‍රතිඵලය (ඉහත වගුව බලන්න) මගින් පෙන්වන්නේ, 2015 න් පසු කාලපරිච්ඡේදය තුළ, දිස්ත්‍රික්ක 24 පුරා, සෑම ක්‍රිස්තියානි භක්තිකයින් 10,000 කටම, වසරකට ක්‍රිස්තියානි භක්තිකයින් පස් දෙනෙකු පමණක් ආගමික ප්‍රචණ්ඩත්ව ක්‍රියාවන්ට මුහුණ දෙන බවයි.

මෙම සංඛ්‍යාව, මින් පෙර පස් අවුරුදු කාල පරිච්ඡේදයෙන් (2010 න් පසු කාලය) පසුව තවත් එක් ක්‍රිස්තියානි භක්තිකයෙකුගෙන් වැඩිවී ඇත. කෙසේ වෙතත්, සමස්තයක් වශයෙන් සියලුම දිස්ත්‍රික්ක පුරා සංඛ්‍යාව සුළු යැයි පෙනුණත්, දිස්ත්‍රික්කයකට වන ආගමික ප්‍රචණ්ඩත්ව ක්‍රියාවන්ගේ සංකේන්ද්‍රණය විස්මය දනවන ලෙසින් වැඩිවී ඇත.

නිදශර්කය 10: ක්‍රිස්තියානි භක්තිකයින් 100,00 කට, දිස්ත්‍රික්කයකට සිදුවීම් ප්‍රමාණය




**ක්‍රිස්තියානි භක්තිකයින් 100,000 කට වැඩිම සිදුවීම් ප්‍රමාණය**

- 216 පොළොන්නරුව
- 76 හම්බන්තොට
- 49 මාතර
- 46 ගාල්ල
- 35 කෑගල්ල, මොණරාගල

**ක්‍රිස්තියානි භක්තිකයින් 100,000 කට අඩුම සිදුවීම් ප්‍රමාණය**

- 1 යාපනය, මන්නාරම
- 2 කොළඹ, ගම්පහ, මාතලේ
- 3 පුත්තලම

**සිදුවීම් වාතර්ා වී නැත**

අම්පාර, කිළිනොච්චි, මුලතිවු, නුවර එළිය

ආගමික ප්‍රචණ්ඩත්ව ක්‍රියාවන්ගේ ඉහළම සංකේන්ද්‍රණය සහිත දිස්ත්‍රික්ක පහ මෙහිදී නැඹුරුතාවයන් සහ රටාවන් හඳුනාගැනීම සඳහා පිරික්සී ඇත. උදාහරණයක් ලෙසින් දක්වන්නේ නම්, පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ප්‍රතිඵල මගින් හැඟවෙන්නේ, වාෂරීක පදනමකින් යුතුව ගත් විට 2010 සහ 2014 අතර වසරවලදී සෑම ක්‍රිස්තියානි භක්තිකයින් 100,000 කින්ම ආසන්න වශයෙන් 40 දෙනෙකු ආගමික ප්‍රචණ්ඩත්ව සිදුවීම් වලට මුහුණ දී ඇති බවයි. මෙම සංඛ්‍යාව 2015 ත් 2019 ත් අතර කාලය තුළ සෑම ක්‍රිස්තියානි භක්තිකයින් 100,000 කටම 216 දෙනෙක් දක්වා සැලකිය යුතු මට්ටමකින් ඉහළ ගොස් ඇත.

මෙම වැඩිවීම ඔස්සේ හැඟවෙන්නේ, 2015 න් පසු කාලයේදී පොළොන්නරුව දිස්ත්‍රික්කයේ සිටිනා ක්‍රිස්තියානි භක්තිකයින් ආසන්න වශයෙන් පස් ගුණයක් වැඩියෙන් ආගමික ප්‍රචණ්ඩ ක්‍රියාවන්ට මුහුණ දීමේ හැකියාවක් ඇති බවයි, මීට සමාන ලෙසින්, 2015 න් පසු කාලයේ මඩකළපුව දිස්ත්‍රික්කයේ සිටිනා ක්‍රිස්තියානි භක්තිකයින් තුන් ගුණයක් වැඩියෙන් ආගමික ප්‍රචණ්ඩ ක්‍රියාවන්ට මුහුණ දීමේ හැකියාවක් පෙන්වන අතර, ගම්පහ සහ කෑගල්ල දිස්ත්‍රික්ක වල, ක්‍රිස්තියානි භක්තිකයින් එවන් සිදුවීම් වලට දෙගුණයක් වැඩියෙන් මුහුණ දීමේ හැකියාවක් පෙන්වයි.

# මුස්ලිම් හා හින්දු භක්තිකයින් ඉලක්ක කෙරුණු ආගමික-වාගරීක ප්‍රචණ්ඩත්වය පිළිබඳ විශ්ලේෂණය

අධ්‍යයනයේ මෙම කොටස් මගින්, 2015න් පසු කාලය තුළ මුස්ලිම් සහ හින්දු ප්‍රජාවන් ඉලක්ක කොටගනිමින් සිදුවූ ආගමික ප්‍රචණ්ඩත්ව සිදුවීම් විශ්ලේෂණය කරනු ලැබේ. ප්‍රාදේශීය මට්ටමින් සිදුවූ මුස්ලිම්-විරෝධී සහ හින්දු-විරෝධී නිදන්ගත සිදුවීම් සම්බන්ධයෙන් විස්තීර්ණ අධ්‍යයනයක් කිරීම සඳහා, මෙම ප්‍රජාවන් ඉලක්ක කොටගනිමින් සිදුවූ ආගමික ප්‍රචණ්ඩ සිදුවීම් පිළිබඳ සම්පාදිත හා තහවුරු කරන ලද දත්ත වල හිඟය අභියෝගයක් විණි. එනිසා, එක් එක් සුළුතර ප්‍රජාවට විශේෂ වූ ආගමික ප්‍රචණ්ඩත්ව සිදුවීම් විශ්ලේෂණය කිරීමෙහි ලා, මෙම අධ්‍යයනය මගින් ප්‍රවේශයන් දෙකක් යොදාගෙන ඇත.

පළමුව, මුස්ලිම්-විරෝධී ප්‍රචණ්ඩත්වය සම්බන්ධයේදී මෙම අධ්‍යයනය 'හදිසි උග්‍ර' ආකාරයෙන් විටින් විට දක්නට ලැබෙන සිදුවීම් වෙත අවධානය යොමා ඇත. මෙවැනි සිදුවීම් වලට උදාහරණ ලෙසින් ගිංතොට (2017 නොවැම්බර්) දිගන/තෙල්දෙණිය (2018 මාතර්‍), සහ කුරුණෑගල/මිනුවන්ගොඩ (2019 මැයි) සිදුවූ සිදුවීම් ඇතුළු කැරලි කෝලාහල දැක්විය හැක. මෙම අධ්‍යයනයේදී 'හදිසි උග්‍ර' ප්‍රචණ්ඩත්වය යන්න ඉහළ තීව්‍රතාවයකින් යුතුව, ස්වභාවයෙන්ම අවිධිමත්ව වරින් වර සිදුවන ක්‍රියාවන් ලෙසින් අර්ථ දැක්වී ඇත.[34]

දෙවෙනුව, හින්දු-විරෝධී ප්‍රචණ්ඩත්වය සම්බන්ධයේදී මෙම අධ්‍යයනය මගින් 2009 වසරෙන් පසුව උතුරේ සහ නැගෙනහිර හින්දු භක්තිකයින්ව ඉලක්ක කරගනිමින් සිදුවූ ආගමික ප්‍රචණ්ඩත්ව ක්‍රියාවන් පිළිබඳව ශ්‍රී ලංකා ජාතික ක්‍රිස්තියානි ඉවැන්ජලික සන්ධානය මගින් එක්රැස් කරන ලද දත්ත විශ්ලේෂණය කොට ඇත.

මෙහිදී සැලකිය යුතු වන්නේ මෙම දත්ත තෙවන පාශර්වීය මූලාශ්‍ර මගින් තහවුරු කර නොමැති බවයි. මෙම සීමාව සලකා බලමින්, මෙම අධ්‍යයනය මගින් 2018 ඔක්තෝබර් සහ 2019 නොවැම්බර් අතර සිදුවූ බවට පුවත්පත් වල වාතර්ා වූ හින්දු-විරෝධී ප්‍රචණ්ඩත්ව සිදුවීම්ද විශ්ලේෂණය කොට ඇත.[35] දත්ත බොහෝ ප්‍රමාණයක් ශ්‍රී ලංකාවේ ජාතික ක්‍රිස්තියානි ඉවැන්ජලික සන්ධානය මගින් ලබාදී ඇති අතර, වාතර්ාගත හින්දු-විරෝධී ප්‍රචණ්ඩත්ව සිදුවීම් උතුරේ සහ නැගෙනහිර හින්දු භක්තිකයින් වෙත අදාළ වී ඇත.

මුස්ලිම් සහ හින්දු ප්‍රජාවන් වෙත එල්ල වූ ප්‍රචණ්ඩ ක්‍රියාවන් වාගරීක මෙන්ම ආගමික දිශානතීන් ඔස්සේ සිදුවූ බව මෙහිදී සැලකිය යුතු කරුණක් වේ. ගුණතිලක විසින් පෙන්වා දෙන්නේ, මෙම ප්‍රචණ්ඩත්වය හුදුවේ 'ආගමික' ලෙසින් නොගෙන 'වාගරීක-ආගමික' ලෙසින් සංකල්පීකරණය කරගත් විට, ප්‍රචණ්ඩත්වයේ මෙම මුල් බැසගත් ස්වභාවය වඩාත් හොඳින් අවබෝධ කරගත හැකි බවයි.[36] මෙම සන්දභර්ය තුළ මෙම කොටස මගින් ඉලක්ක කොට ගනු ලබන්නේ, මුස්ලිම් සහ හින්දු වාගරීක-ආගමික ප්‍රචණ්ඩත්වය තුළ ගැබ් වුණු කාරකයන් සහ සැබෑ ප්‍රචණ්ඩත්ව සිදුවීම් අතර සහසම්බන්ධය විසංයෝජනය කොට විභාග කර බැලීමයි. එසේම හින්දු සහ මුස්ලිම් ප්‍රජාවන් ඉලක්ක කොටගනිමින් සිදුවන වාගරීක-ආගමික ප්‍රචණ්ඩත්ව සිදුවීම් සඳහා රාජ්‍යයේ වන මැදිහත් වීම (නැතිනම් මැදිහත් නොවීම) ද මෙම අධ්‍යයනය ඔස්සේ ගවේශණය කෙරෙනු ඇත. 2015 දී බලයට පැමිණි යහපාලන රජය මගින් සුළුතර විරෝධී ප්‍රචණ්ඩත්වය මැඩපවත්වන බවට දුන් පොරොන්දු තිබියදී පවා සුළුතර-විරෝධී ප්‍රචණ්ඩත්වය දිගින් දිගටම පැවතීමද මෙම කොටසින් පැහැදිලි කිරීමට උත්සාහ ගැනෙනු ඇත.

## මුස්ලිම් සහ හින්දු වාගරීක-ආගමික ප්‍රචණ්ඩත්වය තුළ ගැබ් වුණු කාරකයන් සහ සැබෑ ප්‍රචණ්ඩත්ව සිදුවීම් අතර සහසම්බන්ධය

මෙම කොටසෙහිදී සමාජ-දේශපාලන සන්දහර්ය තුළ විස්තර කෙරී ඇති පරිදි, සුළුතර-විරෝධී ප්‍රචණ්ඩත්වය මුඛ්‍ය වශයෙන්ම දිරි ලබන්නේ, බහුතර සිංහල-බෞද්ධ ප්‍රජාවේ ඇතැම් කොටස් අතර ව්‍යාප්තව පවත්නා හිමිකාරීත්ව සංකීණර්ය සහ පැවැත්මේ අනාරක්ෂිත භාවය වෙතිනි. ඒ අනුව, කොළඹ සරසවියේ ජ්‍යොෂ්ට ඇදුරුවරයෙකු වන නිමර්ාල් රංජිත් දේවසිරි විසින් තකර් කරනු ලබන්නේ (2016) මෙම ප්‍රචණ්ඩත්වය පැන නගින්නේ 'සිංහල-බෞද්ධ ජාතිකවාදී පරිකල්පනයේ මූලික මනෝරථයක් ලෙසින්' බවටයි.[37] මෙම සන්දහර්යේදී, ව්‍යාප්තව පවත්නා සුළුතර විරෝධී ප්‍රචණ්ඩත්වය, රටේ සිංහල-බෞද්ධ ආධිපත්‍යයට හානි කරන්නේ යැයි ප්‍රත්‍යක්ෂ කොටගත් අන්තරායන්ට වන ප්‍රතිචාරයක් ලෙසින් අථර් නිරූපණය කළ හැක.

### මුස්ලිම්-විරෝධී ප්‍රචණ්ඩත්වය

මෙම අධ්‍යයනය මගින්, බහුතර සිංහල-බෞද්ධ ප්‍රජාවේ කොටස් විසින් මුස්ලිම් ප්‍රජාව සම්බන්ධයෙන් දරණ බොහෝ පූවර්සංකල්පනාවන්ගෙන් දෙකක් විභාග කෙරෙනු ඇත. බොහෝ විට මුස්ලිම්-විරෝධී ප්‍රචණ්ඩත්වය ගැඹරෙහි මෙවන් පූවර්සංකල්පනාවන් ගැබ්ව පවතී. මෙම පූවර්යෙන් සිතා ගත් ආඛ්‍යානයන්, (a) ජනගහණය යළි සමතුලිතකරණය, සහ (b) මුස්ලිම් ප්‍රජාවේ ආථර්ික සමෘද්ධිය විෂයෙහි සිංහල-බෞද්ධ බහුතරයට එල්ල වී ඇතැයි ප්‍රත්‍යක්ෂ කොටගත් අන්තරාවන් වෙත අදාළ වේ.[38]

### *(a)* ජනගහණය යළි සමතුලිතකරණය

මෙම ආඛ්‍යානය මගින් යෝජනා කරන්නේ, ශ්‍රී ලංකාවේ ජනගහණය නැවත සමතුලිතකරණය සඳහා වන න්‍යාය පත්‍රයක් ශ්‍රී ලංකාවේ මුස්ලිම් ප්‍රජාව අනුගමනය කරන බවයි.[39] මෙම ආඛ්‍යානය පාශර්විකව පැන නැගී ඇත්තේ, 1981 සහ 2012 අතර කාලයේදී මුස්ලිම් ප්‍රජාවේ වධර්නයේ ප්‍රතිඵලයක් ලෙසිනි (සමස්ත ජනගහණයෙන්, 1981 දී 7% ක සිට 2012 දී 9.3% ක් දක්වා වධර්නයක්). මෙම වධර්නය, රටේ සිංහල-බෞද්ධ බහුතරයේ සංඛ්‍යාත්මක ආධිපත්‍යයට තජර්නයක් ලෙසින් සැලකී තිබේ.[40]

ඒ අනුව, මුස්ලිම් ප්‍රජාව විසින් සිංහල-බෞද්ධ ජනගහණය 'වඳවී යෑම' දක්වා අඩු කිරීම ඔස්සේ මෙම න්‍යාය පත්‍රය අනුගමනය කරන බවට තේරුම් ගෙන ඇත.[41]

මෙම පූවර්සංකල්පනාවේ විද්‍යමාන වීම් පසුගිය වසර කිහිපය ඇතුළතදී පැන නැගී ඇත. මුස්ලිම් ව්‍යාපාරිකයින් විසින් 'සිංහල ජාතිය පැතිරීම වැළැක්වීම උදෙසා' මහජනයාට අලෙවි කරන ආහාර පාන වලට 'වඳ පෙති' මිශ්‍ර කොට ඇති බවට වන චෝදනාවන් සහ සිංහල කාන්තාවන්ට අලෙවි කරන යට ඇඳුම් සඳහා වඳ භාවය ඇති කරනා ද්‍රව්‍ය යොදා ඇති බවට වන චෝදනාවන් එම විද්‍යමාන වීම් වලට වන උදාහරණ අතර වේ.[42] අනෙකුත් උදාහරණයන් අතර, මුස්ලිම් හිමිකාරීත්වයකින් යුතු ජනප්‍රිය වෙළඳසැල් ජාලයක් වන නෝ-ලිමිට් මගින්, ආහාරයට ගත් සිංහල මවුවරුන් වඳ භාවයට පත් කරන ටොෆී වගර්යන් බෙදා දුන් බවට ප්‍රකාශ කරමින් බොදු බල සේනා (BBS) මගින් පතුරුවා හැරි වෛරී ප්‍රකාශයන්ද වේ.[43] මෙම චෝදනාවන්, 2018 පෙබරවාරි මාසයේදී අම්පාරේදී උද්ගත වූ මුස්ලිම්-විරෝධී කලකෝලාහලයන්ද, එයින් පුරෝගාමීත්වය ලබා ඉන් සති කිහිපයකට පසුව දිගන/තෙල්දෙණිය ප්‍රදේශයේ උද්ගත වූ මුස්ලිම්-විරෝධී කෝලාහලයන්ද සාධාරණීකරණය කිරීමට නැතිනම් සුජාතකරණය කිරීමට යොදාගැනිණි. සැලකිය යුතු ලෙසින් මෙම කැරලි කෝලාහලයන් මගින් මුස්ලිම්වරුන්ගේ බොහෝ ව්‍යාපාරයන්, වැඳුම් පිදුම් ස්ථාන හා නිවාස වලට හානි කිරීම් සහ ඒවා විනාශ කිරීම් සිදුවූ අතර, පුද්ගලයින් කිහිප දෙනෙකුටම තුවාලද සිදුවිණි. මෙම සිතාගැනීමේ මෑතකාලීනම විද්‍යමාන වීම වන්නේ, මුස්ලිම් වෛද්‍යවරයෙකු විසින් සිංහල බෞද්ධ මවුවරුන් හට 'නීතිවිරෝධී වන්ධ්‍යාකරණයන්' 4,000 ක් සිදුකළ බවට කෙරුණු ප්‍රකාශයයි.[44]

### *(b)* ආථර්ික සමෘද්ධිය

මෙම ආඛ්‍යානය මගින් ඉදිරිපත් කෙරෙන්නේ, ශ්‍රී ලංකාවේ මුස්ලිම් ප්‍රජාව සිංහල-බෞද්ධ ප්‍රජාවට වඩා ආථර්ිකමය වශයෙන් සමෘද්ධිමත් වන බවයි. ඊට අනුව, මුස්ලිම් ජාතිකයින් විවිධ කමර්ාන්තයන් සහ වෙළඳ ජාලයන්හි ආධිපත්‍යය දරන්නේ යැයි අදහස් කොටගෙන සිටින අතර, ඒ ඔස්සේ ඔවුන් සිංහල-බෞද්ධ ව්‍යාපාරයන්ට තජර්නයක් එල්ල කරන්නේ යැයි සිතා ඇත.[45] මෙම ආඛ්‍යානය මගින් සෘණාත්මක ප්‍රතිඵලයන් දෙකකට දායකත්වය සපයා ඇත.

පළමුව, මේ ඔස්සේ 'සෘණාත්මක ආථර්ික ජාතිකවාදය' ලෙසින් හැඳින්වෙන ප්‍රපංචයක් -උදාහරණ ලෙසින් වෙළෙඳපොළ වාසියක් අත්පත් කරගැනීම උදෙසා සුළුතර-විරෝධී/ජාතිකවාදී හැඟීම් උපයෝගී කරගැනීමක්- පැන නැගීම සඳහා දායකත්වය ලැබී ඇත. මෙම ප්‍රපංචය ප්‍රමුක වශයෙන් පැන නැගුණේ පාස්කු ඉරිදා ප්‍රහාරයන්ගෙන් අනතුරුවයි. සිංහල පාරිභෝගිකයින්ව මුස්ලිම් හිමිකරුවන් සිටිනා ව්‍යාපාරයන් හා සම්බන්ධ නිෂ්පාදන හා සේවාවන් වජර්නය කිරීම සඳහා දිරි ගැන්විණි. සිංහල පාරිභෝගිකයින්ව සිංහල-බෞද්ධ සේවාවන් හා නිෂ්පාදනයන් පමණක් භාවිතා කිරීම සඳහා දිරි ගැන්විණි.

උදාහරණයක් ලෙසින් දක්වන්නේ නම්, ටැක්සි සේවා සමාගමක් විසින්, සිංහල-බෞද්ධ කාන්තාවන් සඳහා පමණක් ටැක්සි සේවා සපයමින් වෙළඳ දැන්වීමක් පළ කරන ලදී. මෙම කාන්තාවන්ව 'නීතිවිරෝධී වන්ධ්‍යාකරණයන්ට' බඳුන් කෙරෙනු වෙනුවට ඔවුන්ට පිළිසිඳ ගැනීමේ හැකියාව ඇති බව තහවුරු කරගනු වස් ඔවුන්ව සිංහල-බෞද්ධ වෛද්‍යවරුන් වෙත ගෙන ය් අන ලදී. මෙම විමශර්ණයට අදාළ කාලපරිච්ඡේදයට පෙර, 2013 දී බොදු බල සේනා මගින් 'හලාල්-විරෝධී ව්‍යාපාරයක්' ගෙන යන ලදී. එහිදී 'පිරිසිදු සිංහල පෞරාධිකාරය' ආරක්ෂා වීම සහතික කරනු වස් හලාල් නිෂ්පාදන සම්පූණර්යෙන්ම වජර්නය කරන මෙන් ඔල්ලා සිටින ලදී.[46] මෙවන් ආකාරයේ මුස්ලිම් හිමිකාරීත්වයෙන් යුතු ව්‍යාපාරයන්හි තරගකාරීත්වය වැළැක්වීම අදහා වූ ප්‍රයත්නයන් අභිලාන් කදිරගාමර් වැනි විශ්ලේෂකයින් විසින් විස්තර කොට ඇත්තේ, 'ආථර්කමය දුක්ගැනවිලි හා කලකිරීම්, වාගරීක-ආගමික ද්වේෂය ලෙසින් යොමු කිරීමක්' ලෙසිනි.[47]

දෙවෙනුව, සාමාන්‍යයෙන් මෙම ආඛ්‍යානය මුස්ලිම් ව්‍යාපාරයන් ඉලක්ක කොටගත් සැබෑ මුස්ලිම්-විරෝධී ප්‍රචණ්ඩත්ව සිදුවීම් වලට පෙරටුව පැමිණේ. විමශර්ණයට පාත්‍ර වූ කාලසීමාව තුළ, ගිංතොට (2017 නොවැම්බර්), අම්පාර (2018 පෙබරවාරි), දිගන/තෙල්දෙණිය (2018 මාතර්) සහ කුරුණෑගල/මිනුවන්ගොඩ (2019 මැයි) ලෙසින් ප්‍රධාන මුස්ලිම්-විරෝධී කලකෝලාහලයන් සතරක් පැන නැගිණි. මෙම ප්‍රචණ්ඩත්වයන්ගේ මූලික ඉලක්කයන් සහ ඇතැම් අවස්ථාවන්හිදී සිදුවීම් ඇතිවූ කාලය ඔස්සේ පෙන්වා දෙනු ලබන්නේ මේවා බොහෝ විට ව්‍යාපාරික ලැදියාවන් ඔස්සේ සිදුවූ බවයි. උදාහරණයක් ලෙසින් දක්වන්නේ නම්, මෙම ප්‍රචණ්ඩ ක්‍රියාවන්ගේ ඇතැම් මූලික ඉලක්කයන් වූයේ මුස්ලිම් හිමිකාරීත්වය ඇති ව්‍යාපාරයන් විණි. තවදුරටත්, ගිංතොට සහ දිගන/තෙල්දෙණිය වැනි සිදුවීම් සිදුවූ කාලය නත්තල සහ සිංහල හා දමිළ අලුත් අවුරුද්ද හා ආසන්නව පෙළගැසිනි.[48] සාමාන්‍යයෙන්, මෙම කාලසීමාවන් තුළ භාණ්ඩ හා සේවා සඳහා වන ඉල්ලුමේ වැඩිවීමක් තිබෙනා අතර, එය තරගකාරී නොවන ව්‍යාපාරික භාවිතයන් ධෛයර්මත් කළා විය හැක. මෙම ප්‍රචණ්ඩ ක්‍රියාවන් සිදුවූ කාලවේලාව මගින් ඇතැම් විට හැඟවෙන්නේ මුස්ලිම් හිමිකාරීත්වයෙන් යුතු ව්‍යාපාරයන්ගේ තරගකාරීත්වයට හානි කිරීමේ අරමුණකි. එනිසා, මුස්ලිම් ප්‍රජාව ඉලක්ක කරගනිමින් දියත් වන වාගරීක-ආගමික ප්‍රචණ්ඩත්ව ක්‍රියාවන් යට, මුස්ලිම් ප්‍රජාවට යුතු ප්‍රමාණයට වඩා වැඩි ආථර්ක සමෘද්ධියක් ඇතැයි ප්‍රත්‍යක්ෂව සිතා ගත් ආඛ්‍යානයද තිබීමට හැක.

## හින්දු-විරෝධී ප්‍රචණ්ඩත්වය

2009 දී අවසන් වූ සන්නද්ධ අරගලයට පසුවත්, බහුතර සිංහල-බෞද්ධ ජනගහණයේ ඇතැම් කොටස් භෞමික අනාරක්ෂිත භාවයකින් දිගින් දිගටම පීඩා විඳින ලදී. මෙම අනාරක්ෂිත භාවය බොහෝ විට, 'බලය විමධ්‍යගත කිරීම' සහ ඉඩම් ප්‍රතිසංස්කරණය වැනි කරුණු සිංහල භාෂා පුවත්පත් තුළ චිත්‍රණය වූ ආකාරය තුළ සාධක ලෙසින් දක්නට ලැබිණි.[49] මෙම අනාරක්ෂිත භාවය, ශ්‍රී ලංකාවේ උතුරේ සහ නැගෙනහිර ව්‍යාප්ත වී ඇති කොන් කිරීමේ ආකාරයන් තුළ දක්නට ලැබේ.

හින්දු වැඳුම් පිදුම් ස්ථාන හා සම්බන්ධ වූ ප්‍රචණ්ඩ ක්‍රියාවන්, ප්‍රමුඛ වශයෙන්ම සුළුතර ප්‍රදේශ තුළ රජය විසින් ගෙන යන 'සිංහලීකරණ/බෞද්ධාගම්කරණ' ක්‍රියාවලීන්ට සාධක ලෙසින් දමිළ භාෂා පුවත්පත් මත දක්වන්නන් සහ දේශපාලන චරිත මගින් දක්වන්නට යෙදිණි.[50] 'සිංහලීකරණය/බෞද්ධාගම්කරණය' වැනි යෙදුම් බොහෝ අවස්ථාවන්හිදී දමිළ-හින්දු ප්‍රජාවන් විසින් භාවිතා කළ අතර (එසේම දමිළ භාෂා පුවත්පත් තුළද දක්නට ලැබේ), ඒ 'යුද්ධය අවසාන වීමෙන් පසුව ඔවුන්ගේ සංස්කෘතික සහ ආගමික අයිතිවාසිකම් අනතුරට පාත්‍ර වේය යන බිය සහ අනාරක්ෂිත භාවය' ප්‍රකාශ කිරීම උදෙසායි.[51] මේ අතර, 'සිංහල ජාතිකවාදීන්' විසින් එය 'දේශපාලනිකව බලගැන්වුණු' යෙදුමක් ලෙසින් දකිමින් ප්‍රතික්ෂේප කරන ලදී.[52] අධ්‍යයනයන් මගින්, උතුරේ සහ නැගෙනහිර මිලිටරීකරණය සහ නව සිංහල ජනාවාස හඳුන්වා දීම ඇතුළුව විවිධ ආකාරයෙන් උතුරු හා නැගෙනහිර පළාත් වල සිදුවන 'සිංහලීකරණ/බෞද්ධාගම්කරණ' ආකාරයන් පෙන්වා දේ.[53] මෙම වත්මන් අධ්‍යයනය මගින්, විමශර්ණයට ලක් වූ කාලසීමාව තුළ පුළුල්ව වාතර්ා වූ සහ ලේඛනගත වූ 'සිංහලීකරණ/බෞද්ධාගම්කරණ' ආකාරයන් දෙකක් වෙත අවධානය යොමු කෙරෙනු ඇත.

### *(a)* බෞද්ධ වැඳුම් පිදුම් ස්ථාන/සංකේත ඉදිකිරීම

යාපනය, මන්නාරම, මුලතිවු සහ වවුනියාවේ හින්දු කෝවිල් පරිශ්‍රයක් තුළ හෝ හින්දු වැඳුම් පිදුම් ස්ථානයකට ආසන්න වටපිටාවේ බෞද්ධ පන්සල් ඉදිකිරීම සම්බන්ධයෙන් වාතර්ා වූ/චෝදනා එල්ල කෙරුණු සිදුවීම් කිහිපයක්ම විණි. තවදුරටත්, සිංහල පදිංචිකරුවන් නොමැති ප්‍රදේශද ඇතුළත්ව හමුදාව සිටිනා ස්ථානයන්හි බෞද්ධ පිළිම ඉදිකිරීම සම්බන්ධයෙන් වන බොහෝ වාතර්ාවන්ද විණි. උදාහරණයක් ලෙසින් දක්වන්නේ නම්, මුලතිවු හි නීරවඩි කලාපයේ සෙම්මාලෙ ප්‍රදේශයේ පිල්ලෙයාර් කෝවිල 2018 දී හමුදාවෙන් සහ පුරාවිද්‍යා දෙපාතර්මේන්තුවෙන් පවරා ගෙන, ඉන් පසුව බෞද්ධ පිළිමයක් ඉදිකෙරුණු බව පැවසේ.[54]

### *(b)* ආගමික ස්ථාන පිළිබඳව වන තරගය

උතුරේ සහ නැගෙනහිර ආගමික ස්ථාන කෙරෙහි වන තරගයට බොහෝ විට එම ස්ථානයේ ඓතිහාසික අනන්‍යතාවය සහ ස්ථානයේ අයිතිය පිළිබඳව වන තරගකාරී ප්‍රකාශයන් සම්බන්ධ විණි. මෑතකාලීන අතීතයේදී වඩාත් ප්‍රමුඛ අවධානයක් ලැබුණු සිදුවීම වූයේ, ත්‍රිකුණාමලයේ කන්නියා උණු වතුර ලිං ආශ්‍රිත පරිශයේ පුරාවිද්‍යා භූමිය සම්බන්ධ සිදුවීමයි (2019 ජූලි මසදී). සිංහල භාෂා පුවත්පත් තුළ වූ අදහස් ඔස්සේ කියා සිටියේ, එය අනුරාධපුර යුගයේ භාතික තිස්ස රජු විසින් තැනවූ පෞරාණික බෞද්ධ භූමි භාගයක් බවයි. අනෙකුන් විසින් ප්‍රකාශ කරන ලද්දේ, එය රාවණ රජු යුගයේ තැනවුණු පෞරාණික හින්දු කෝවිලක් බවයි. මීට සමාන ලෙසින් මුලතිවු හි නයාරුහි ආගමික ස්ථානයක් පිළිබඳව සිංහල භාෂා පුවත්පත් තුළ වූ අදහස් ඔස්සේ අයිතිය ප්‍රකාශ කෙරුණේ, එය 'ගුරුකන්ද රජ මහා විහාරය' නම් වූ පෞරාණික බෞද්ධ විහාරයක් බවට වන අතර, දමිළ භාෂා පුවත්පත් අදහස් ඔස්සේ අයිතිය ප්‍රකාශ කෙරුණේ, එය ඓතිහාසික හින්දු කෝවිලක් වන 'නීරාවියාදි පිල්ලෙයාර් කෝවිල' බව ප්‍රකාශ කරමිනි.

මෙවන් සිදුවීම් බොහෝ විට දමිළ ප්‍රජාව විසින් දකින ලද්දේ, බහුතර වාගරීක-ආගමික කණ්ඩායම විසින් ශ්‍රී ලංකාවේ උතුරේ සහ නැගෙනහිර ප්‍රදේශයන්හි වන හින්දු ආගමික ස්ථානයන් මත තමන්ගේ බහුතරභාවය පනවන 'සිතාමතාම සිදුකරන බහුතර ආධිපත්‍යයේ ප්‍රකාශනයන්' ලෙසයි.[55] අනෙක් අතට, මෙම සිදුවීම් මගින් පෙන්වා දෙන්නේ, සන්නද්ධ අරගලයෙන් පසුව උතුරේ සහ නැගෙනහිර දමිළ ප්‍රජාව බොහෝ විට මුහුණ දෙන පැවැත්වේ අනාරක්ෂිත භාවයටයි; මෙම සිදුවීම් හෙළිදරවු කරන්නේ, 'රාජ්‍යයෙන් අවකාශ සපයා දෙන සිංහලීකරණයේ/බෞද්ධාගම් කරණයේ' ප්‍රතිඵලයක් ලෙසට උක්ත කියූ ප්‍රජාවන් සිය අනන්‍යතාවය සහ අයිතීන් මදර්නය කිරීමකට ලක්ව ඇති බවක් ප්‍රත්‍යක්ෂ කොටගෙන ඇත්තේ කෙසේද යන වගයි.[56] අනෙක් අතට, මෙම සිදුවීම් වලින් පෙන්වා දෙනු ලබන්නේ, සිංහල-බෞද්ධ ප්‍රජාව 'උතුරේ [සහ නැගෙනහිර] තජර්නයන්ගෙන් සිය බෞද්ධ උරුමය [ආරක්ෂා කරගැනීම] සඳහා දක්වන හිමිකාරීත්වයටයි.[57]

සමස්තයක් ලෙසින් ගත් විට, මුස්ලිම්-විරෝධී සහ හින්දු-විරෝධී ප්‍රචණ්ඩත්වය ගැඹරෙහි ඇති කාරකයන් ඔස්සේ පැහැදිලි කෙරෙන්නේ, රජය මාරු වීමෙන් පසුව වුවත් සුළුතර-විරෝධී ප්‍රචණ්ඩත්වය ඇතැම් විට පවතින්නේ මන්ද යන්නයි.

## රාජ්‍යයේ වන මැදිහත් වීම (නැතිනම් මැදිහත් නොවීම)

2015 දී යහපාලන රජය බලයට පැමිණීම ඔස්සේ, සුළුතර-විරෝධී ප්‍රචණ්ඩත්වය මැඩපැවැත්වීම සහ සියලුම ප්‍රජාවන්ට ආගමික විශ්වාසයන්ට සහ ඇදැහීම් සඳහා ඇති නිදහස සඳහා වන අයිතිවාසිකම සුරක්ෂිත කිරීම සම්බන්ධව නව බලාපොරොත්තු ඇති විණි. කෙසේ වෙතත්, යහපාලන රජයේ ධූර කාලය අවසානයේදී, යහපාලන රජයට පුළුල්ව චෝදනාවන් එල්ල වූයේ වාගරීක-ආගමික ප්‍රචණ්ඩත්වයට අවකාශ සැපයීම සහ මින් පෙර රජයන් යටතේ දැකගැනීමට හැකිවූ දණ්ඩ මුක්තිය ලැබෙනා වාතාවරණය සවිබල ගැන්වූ බවටයි. මෙම චෝදනාවන් පැන නැගුණේ, රටේ සුළුතර වාගරීක-ආගමික කණ්ඩායම් සඳහා  තමන්ගේ ඇති ධනාත්මක සහ ඍණාත්මක බැඳීම් ඉෂ්ට සිද්ධ කිරීම සඳහා අවබෝධ කරගැනීමට ලැබුණු ලෙසට රජය අසමත් වීම ඔස්සේයි.

සුළුතර-විරෝධී ප්‍රචණ්ඩ ක්‍රියා සම්බන්ධයෙන් රාජ්‍යයේ වන මැදිහත් වීම (නැතිනම් මැදිහත් නොවීම) පෙනෙනා ලෙසට හැඩගැස්වී ඇත්තේ රාජ්‍ය සංස්ථාවන් සහ ක්‍රියාකාරකයන් තුළ ගැඹුරට මුල්බැසගෙන ඇති සිංහල-බෞද්ධ බහුතරවාදය ඔස්සේ වෙයි. මෙම අදහස ඔස්සේ ගුණතිලක විසින් තකර් කරනු ලබන්නේ,  බහුතර වාගරීක-ආගමික කණ්ඩායමේ (එනම් සිංහල-බෞද්ධ) අභිමතය රාජ්‍යයේ සියලුම කොටස් තුළ ගැඹුරට මුල් බැසගෙන තිබීම ඔස්සේ, සියලුම මට්ටම් වලින් ආයතනික ව්‍යුහයන් පිරිහීම සඳහා දිරි ලැබීමක් හා එම පිරිහීම තිරසාරකරණයක් සිදුවන බවටයි.[58] නීල් ඩිවෝටාට අනුව, 'සංස්ථායික පිරිහීම' සිදුවන්නේ, රාජ්‍යයේ නීති සම්පාදනය කරනා, ක්‍රියාත්මක කරනා, විනිශ්වය කරනා සහ බලගැන්වුම් කරනා ආයතනයන් විසින්, අනෙකුත් කණ්ඩායම් වල යුක්තියුක්ත දුක්ගැනවිලි නොසලකා හරින අතර, එක් විශේෂ කණ්ඩායමකට පක්ෂග්‍රාහී සැලකීමක් සිදුකරනා විටදී බවයි.[59] මෙම ආකාරයේ සංස්ථායික පිරිහීම, 2015 න් පසු කාලපරිච්ඡේදය තුළ මුස්ලිම් සහ හින්දු ප්‍රජාවන් ඉලක්ක කොටගනිමින් සිදුවූ ප්‍රචණ්ඩත්ව සිදුවීම් සඳහා වූ රාජ්‍යයේ ප්‍රතිචාරය තුල දක්නට ලැබිණි.

## මුස්ලිම්-විරෝධී ප්‍රචණ්ඩත්වය සන්දහර්යෙහි සංස්ථායික පිරිහීම සඳහා නිදශර්න

2017 වසරේ ගිංතොටදී, සිදුවූ මාගර් අනතුරකට පසුව සිංහල හා මුස්ලිම් තරුණ කොටස් අතර ගැටුම් ඇති වූ බව වාතර්ා වූ අතර, 'සාමය පවත්වා ගැනීම' සඳහා විශේෂ කායර් බලකායේ (STF) නිලධාරීන් යොදවා තිබිණි. මුල් ගැටුම් යටපත් වූ පසුව, විශේෂ කායර් බලකායේ නිලධාරීන්ව 'සිටිය යුතු කාලය සම්පූණර් නොකොටම ඉවත් කරවාගෙන' තිබිණි.[60] ලෙසේ වුවත් එම නිලධාරීන් ඉවත් කරගත් වහාම, ප්‍රදේශයේ මුස්ලිම් නිවාස සහ ව්‍යාපාරයන් ඉලක්ක කොටගනිමින් ප්‍රචණ්ඩ ක්‍රියාවන් පැන නැගී තිබිණි. එසේම, සීසීටීවී දශර්න හා ඇසින් දුටුවන්ගේ ප්‍රකාශයන්ගෙන් හෙළිදරවු වූ ආකාරයට, 2018 දී දිගන/තෙල්දෙණිය ප්‍රදේශයේදී ආයුධ සන්නද්ධ විශේෂ කායර් බලකා නිලධාරීන් සහ විශේෂ පොලිස් ඒකකයන් සිටියදීම වරදකරුවන් විසින් මුස්ලිම් ජාතිකයින්ට එරෙහිව ප්‍රහාරයන් දියත් කොට ඇත.[61] සැලකිය යුතු පරිද්දෙන්, 2018 දී දිගන/තෙල්දෙණිය ප්‍රදේශයන්හිදී මෙන්ම 2019 දී කුරුණෑගල/මිනුවන්ගොඩ ප්‍රදේශයන්හිදීද, පොලිසිය විසින් ඇඳිරි නීතිය පනවා තිබුණත්, ජනපති විසින් හදිසි නීටිය ප්‍රකාශයට පත් කොට තිබුණත්, ප්‍රචණ්ඩ ක්‍රියාවන් බාධාවකින් තොරව සිදුවුණි.[62] පුළුල්ව වාතර්ාගත වී තිබුණු ආකාරයට, සාමය ආරක්ෂා කිරීම සඳහා යොදවා තිබූ නීති ආරක්ෂක නිලධාරීන් 'නිශ්ක්‍රීය බලාහිඳින්නන්' ලෙසින් කටයුතු කරන අතරදී, කලහකාරී පිරිස් ප්‍රචණ්ඩ ක්‍රියාවන්හි යෙදී තිබිණි.[63]

2019 දී කුරුණෑගල/මිනුවන්ගොඩ සිදුවූ මුස්ලිම් විරෝධී ප්‍රචණ්ඩ ක්‍රියාවන්ගෙන් පසු, ශ්‍රී ලංකාවේ මානව හිමිකම් කොමිසමේ (HRCSL) සභාපතිවරයා විසින් වැඩ බලන පොලිස්පති වරයා (IGP) වෙත යැවූ ලිපියක නිරීක්ෂණය කොට තිබුණේ, 'අප්‍රේල් 21 ප්‍රහාරයන්ගෙන් පසු මුස්ලිම් ප්‍රජාවට එරෙහිව පළිගැනීමේ අරමුණෙන් යුතුව දියත් වන ප්‍රචණ්ඩ ක්‍රියාවන් සිදුවීමේ පැහැදිලි හැකියාවක් තිබුණද, ඒ වැළැක්වීමට කිසිදු පියවරක් ගෙන නොතිබුණු' බවයි.[64] ඇය සඳහන් කොට තිබුණේ, ප්‍රචණ්ඩ ක්‍රියාවන් සිදුවූ ප්‍රදේශ වලට කුමන හෝ අතිරේක පොලිස් නිලධාරීන්/විශේෂ කායර් බලකා නිලධාරීන් සැපයීම ප්‍රමාද වූ බවයි. එසේම ඇය ප්‍රකාශ කොට සිටියේ, මෙම ප්‍රචණ්ඩ ක්‍රියාවන්ට සම්බන්ධ යැයි අත්අඩංගුවට ගත් (ප්‍රශ්න කිරීම සඳහා ගත්) අයවලුන්, ඇප මත නිදහස් වීම සඳහා සම් ආකාරයක දේශපාලනික බලයකින් යුක්ත වූ බවයි.[65]

## හින්දු-විරෝධී ප්‍රචණ්ඩත්වය සන්දහර්යෙහි සංස්ථායික පිරිහීම සඳහා නිදශර්න

මෙම අධ්‍යයනයේ සඳහන් කොට ඇති පුවත්පත් වාතර්ාවන් හා සිදුවීම් වාතර්ාවන් මත පදනම්ව බැලූ විට, හින්දු-විරෝධී ප්‍රචණ්ඩත්වයේදී, උතුරේ සහ නැගෙනහිර ප්‍රදේශයන්හි චෝදනා එල්ල වන ලෙසින් 'සිංහලීකරණ/බෞද්ධාගම්කරණ' ප්‍රයත්නයන්හි පෙරමුණ ගත් මූලික ක්‍රියාකාරකයන් ලෙසින් හමුදා නිලධාරීන් සහ පුරාවිද්‍යා දෙපාතර්මේන්තුවේ නිලධාරීන් හඳුනාගත හැක. විශේෂයෙන්ම සඳහන් කරන්නේ නම්, පද්ධතිමය ලෙසකින් හින්දු වැඳුම් පිදුම් ස්ථානයන් ඉලක්ක කොටගනිමින් කොන් කිරීමේ ක්‍රියාමාගර්යන් ගත් බවට පුරාවිද්‍යා දෙපාතර්මේන්තුවේ නිලධාරීන් වෙත දමිළ භාෂා පුවත්පත් තුළ වූ අදහස් ඔස්සේ චෝදනා එල්ල කොට තිබුණි.[66] එහිදී මෙම නිලධාරීන්ව චිත්‍රණය කොට තිබුණේ 'උතුරේ සහ නැගෙනහිර සිංහල බහුතරවාදී ආධිපත්‍යය ප්‍රවධර්නය කරනා රාජ්‍ය හස්තයක්' ලෙසිනි.[67]

මෙම ක්‍රියාකාරකයන්ට එපිටින්, ශ්‍රී ලංකාවේ ජාතික ක්‍රිස්තියානි එවැන්ජලික සන්ධානයේ සිදුවීම් වාතර්ාවන්ගෙන් තවදුරටත් හෙළිදරවු වන්නේ, චෝදනා එල්ල වන සිදුවීම් සිදුවන අවස්ථාවන්හිදී ප්‍රාදේශීය සහ ජාතික තලයේ වන ආණ්ඩුවේ දේශපාලඥයින් මුණිවත රැක සිටි ආකාරයයි. උදාහරණ ලෙසින් දක්වන්නේ නම්, 2015 දී හිටපු ජනපති මෛත්‍රීපාල සිරිසේන මන්නාරමේ 'මාත්තොට්ටම් රාජ විහාර' නමින් හැඳින්වෙන බෞද්ධ සිද්ධස්ථානයක් විවෘත කිරීම සඳහා යෑමට නියමිතව තිබිණි. කෙසේ නමුත් මෙම සිද්ධස්ථානය අවසරයකින් තොර බවත්, චෝදනා එල්ල වන ලෙසට හමුදාවේද සහාය ඇතිව තිරුකෙදීස්වරම් සිවන් කෝවිල් පරිශය තුළ ඉදිකොට ඇති බවටත් තොරතුරු දැක්වුණු පසු ජනපතිවරයා විසින් විවෘත කිරීමට වූ ආවාරධනය ප්‍රතික්ෂේප කොට තිබිණි. මේ අතර චෝදනා එල්ල වන ලෙසට මන්නාරම දිස්ත්‍රික්කයේ පාලර්මේන්තු මන්ත්‍රී සෙල්වම් අඩෛකලනාදන් සහ විපක්ෂ නායක ආර්.සම්බන්ධන් මෙම කරුණ සම්බන්ධයෙන් මුණිවත රකින ලදී. මෙම නිදශර්නය මගින් පෙන්වා දෙන්නේ, උතුරේ වැඳුම් පිදුම් සිදුකරනා ආගමික ස්ථානයන්හි හිමිකාරීත්වය කෙරෙහි වන තරගයන් සම්බන්ධයෙන් රාජ්‍යය දක්වන අකමර්ණ්‍යතාවයයි.

යථෝක්ත විශ්ලේෂණය මගින් උත්සාහ දරන්නේ, සුළුතර-විරෝධී ප්‍රචණ්ඩත්වය පාලනය කරනා බවට යහපාලන රජය මගින් ලබාදුන් ප්‍රතිඥාවන් තිබියදීද සුළුතර-විරෝධී ප්‍රචණ්ඩත්වය පැතිර පැවතීම පැහැදිලි කිරීමටයි.

මෙම විශ්ලේෂණය මගින් යෝජනා කරන්නේ, වාගරීක-ආගමික ප්‍රචණ්ඩත්වය දිගින් දිගටම පැවතීම අභ්‍යන්තරයේ ඇති කාරකයන් වන්නේ 1) සිංහල-බෞද්ධ බහුතරයේ හිමිකාරීත්ව සංකීණර්ය සහ 2) ඔවුන්ට හැඟෙනා පැවැත්මේ අනාරක්ෂිත භාවය බවටයි. සියලුම වාගරීක-ආගමික ප්‍රචණ්ඩ ක්‍රියා සිදුවීම් තුළ ව්‍යාප්තව පවතින මෙම කාරකයන් මගින් ටහ්වදුරටත් යෝජනා කරන්නේ, ප්‍රචණ්ඩත්වය යනු බහුතර කණ්ඩායම හඟිනා තජර්නය හෝ අනාරක්ෂිත භාවය විෂයෙහි ප්‍රතික්‍රියාවක් බවයි. තවදුරටත්, මෙහි විමශර්ණයට ලක්වූ කාලපරිච්ඡේදයට පෙරාතුව පවා වූ සිදුවීම් තුළ යථෝක්ත කාරකයන් දක්නට ලැබෙන්නේය යන කරුණ මගින් හැඟවෙන්නේ, වාගරීක-ආගමික ප්‍රචණ්ඩත්වයේ වරදකරුවන්ව ප්‍රේරණය කරනා දිගුකාලීන බහුතරවාදී සංකීණර්යක් තිබෙනා බවයි.

සැලකිය යුතු ලෙසින් බහුතරවාදයේ වඩාත් මුල් බැසගත් හැඟීමක්, වාගරීක-ආගමික ප්‍රචණ්ඩත්වය අභිමුවෙහි රාජ්‍ය සංස්ථාවන්ගේ සහ රාජ්‍ය ක්‍රියාකාරකයන්ගේ (අ)ක්‍රියාකාරීත්වය තුළ දක්නට ලැබේ. ඉහත දක්වා ඇති මුස්ලිම්-විරෝධී සහ හින්දු-විරෝධී ප්‍රචණ්ඩත්ව සිදුවීම් තුළ දක්නට හැකි ආකාරයට ප්‍රචණ්ඩත්වය ඇති කිරීමට සහ උසිගැන්වීමට ක්‍රියාකරන තෙවන පාශර්වයන්/රාජ්‍ය නොවන ක්‍රියාකාරකයන්ට එරෙහිව පියවර ගැනීමට රාජ්‍යය අපොහොසත් වන විට, දණ්ඩ මුක්තිය ලෙසින් අමතර තත්වයක් නිමර්ාණය වන අතර, එය ඉන් අනතුරුව සුළුතරයන්ට එරෙහි ප්‍රචණ්ඩත්වයට තවදුරටත් ශක්තිය ලබාදෙයි.

# නිගමනය

මෙම අධ්‍යයනය මගින් ඉලක්ක කොට ගන්නේ, 2015 ට පෙරාතුව කාලපරිච්ඡේදය හා සංසන්දනය කිරීමේදී 2015 න් පසු කාලපරිච්ඡේදය තුළ ආගමික සුළුතරයන් වෙත වූ සැලකිල්ලේ නැඹුරුතාවයන් බැරෑරුම්ව විශ්ලේෂණය කිරීමයි. එහි සමපර්ණය වන්නේ, බලයේ හිඳින රජය කුමක් වුවත් සුළුතරයන් ඉලක්ක කොට ගත් වාගරීක-ආගමික ප්‍රචණ්ඩත්වය දිගින් දිගටම පවත්නා බවයි.

මෙම අධ්‍යයනය අවධානය යොමු කරන්නේ, ආගමික සුළුතරයන්ට හිංසා පැමිණවීම බලාත්මක කරනා වටපිටාවක් පෝෂණය කිරිමෙහි ලා රාජ්‍යයේ භූමිකාවයි. එයින් සොයාගෙන ඇත්තේ, රාජ්‍යය බොහෝ අවස්ථාවන්හිදී රාජ්‍ය-නොවන ක්‍රියාකාරකයන් ප්‍රචණ්ඩත්ව ක්‍රියාවන් සිදුකිරීම අනුදත් බවත්, ආගමික සුළුතරයන් ප්‍රචණ්ඩත්වයෙන් ආරක්ෂා කිරීමට රාජ්‍යයේ වන බැඳීම ඉෂ්ට සිද්ධ කිරීමට අසමථර් වූ බවත් වේ. එනිසා, ලෝකයේ වෙනත් කොටස් වලද දැකිය හැකි පරිදි ශ්‍රී ලංකාවේ ආගමික ප්‍රචණ්ඩත්වය, රාජ්‍යයේ ක්‍රියාකාරීත්වය හෝ අක්‍රියාකාරීත්වය ඔස්සේ අවිකල්පයෙන්ම පෝෂිතව තිබේ.[68]

මෙම අධ්‍යයනය මගින්, 2015 ජනවාරි සිට 2019 අගෝස්තු දක්වා කාලපරිච්ඡේදය තුළ ශ්‍රී ලංකාවේ ක්‍රිස්තියානි ප්‍රජාව ඉලක්ක කොට ගනිමින් සිදුවූ ආගමික ප්‍රචණ්ඩත්ව සිදුවීම් 397 ක සමස්තයක් විභාග කොට ඇත. මෙම සිදුවීම් වලින් 70% ක් කොන් කිරීමේ ක්‍රියාවන් හෝ භාවිතයන් ලෙසින් දැක්විය හැකි අතර, එයින් 50% කට වැඩි ප්‍රමාණයක් සිදුකර ඇත්තේ රාජ්‍ය නිලධාරීන් විසිනි. සමස්තයක් ලෙසින්, භෞතික් නොවන හිංසන සිදුවීම් බොහෝ ප්‍රමාණයක් සඳහා රාජ්‍යය සහාය වී තිබිණි. ඒ අනුවම්, රජය මුඛ්‍ය වරදකරුවෙකු ලෙසින් වූ දත්ත මගින් අනාවරණය් කෙරෙන්නේ, රාජ්‍යයේ මූලිකත්වයෙන් වූ ප්‍රචණ්ඩත්වය ස්වභාවයෙන්ම ව්‍යූහාත්මක, පද්ධතිමය හා ප්‍රාදේශීය වන බවයි.

ක්‍රිස්තියානි සුළුතරයේ අයිතිවාසිකම් වෙත රාජ්‍යය සිදුකරන ඍජු මැදිහත්වීමට අමතරව 2015 න් පසු කාලපරිච්ඡේදයේ දත්ත මගින් අනාවරණය කරන්නේ, තෙවන පාශර්වයන්ගෙන්/රාජ්‍ය නොවන ක්‍රියාකාරකයන්ගෙන් -විශේෂයෙන්ම බෞද්ධ භික්ෂූන්ගෙන්- ක්‍රිස්තියානි භක්තිකයින්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා රාජ්‍යය අසමථර් වූ බවයි. බෞද්ධ භික්ෂූන් ප්‍රධාන වරදකරුවන් ලෙසින් හඳුනාගන්නා අවස්ථාවන්හිදී ඔවුන්ට සුවිශේෂීකරණයේ සහ දණ්ඩ මුක්තියේ විශේෂ තත්වයක් ලබාදීමෙහි ලා රාජ්‍යයේ භූමිකාවද දත්ත ඔස්සේ අනාවරණය වේ. මෙම විශ්ලේෂණය මගින් හෙළිදරවු කරන්නේ, වරදකරුවන් බෞද්ධ භික්ෂූන් වන අවස්ථාවකදී පොලිසිය ධනාත්මකව මැදිහත් වී ප්‍රධාන වින්දිතයින් හට සහාය ලබාදීමට අඩු හැකියාවක් පවත්නා බවයි.

මෙම අධ්‍යයනය මගින් මුස්ලිම් හා හින්දු භක්තිකයින්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙන්ද ගුණාත්මක විශ්ලේෂණයක් ලබාදී ඇත. මුස්ලිම් සහ හින්දු ප්‍රජාවන් වෙත ඉලක්ක වූ ප්‍රචණ්ඩත්වෞඅ සඳහා රජයේ මැදිහත්වීම (මැදිහත් වීමක් නොමැති වීම), රාජ්‍ය ආයතනයන් තුල වන සිංහල-බෞද්ධ බහුතරවාදය ඔස්සේ දකිමින් විශ්ලේෂණය කොට ඇත. මෙම අධ්‍යයනය මගින් සොයාගෙන ඇත්තේ, බහුතරවාදය මුල්බැසගෙන තිබීම ඔස්සේ නීති බලාත්මක කිරීමේ බලධාරීන් ඇතුළු රාජ්‍ය මෙවලම් තුළ සංස්ථායික පිරිහීම/පක්ෂග්‍රාහීත්වය ඇතිවී ඇති බවයි. එයින් සමපර්ණය කරන්නේ, විමශර්ණයට ලක් වූ කාලපරිච්ඡේදය තුළ ක්‍රිස්තියානි, මුස්ලිම් සහ හින්දු භක්තික ප්‍රජාවන් ඉලක්ක කොටගත් වාගරීක-ආගමික ප්‍රචණ්ඩත්ව සිදුවීම් සඳහා රාජ්‍යය විසින් දක්වන ප්‍රතිචාරය තුළ එවැනි සංස්ථායික පිරිහීමක්/පක්ෂග්‍රාහීත්වයක් ඇති බවට ප්‍රබල සාධක පවත්නා බවටයි.

# ඇමුණුම්

# ඇමුණුම 1

## හානි ආකාරය: භෞතික හිංසනය සම්බන්ධ වූ සිදුවීම්

පාස්කු ඉරිදා ප්‍රහාරයන් සැලකිල්ලට ගනිමින්, මෙම කොටස ඔස්සේ *පුද්ගලයන්ට එරෙහි භෞතික ප්‍රචණ්ඩත්වය* හා *දේපළ විනාශ කිරීමට* අදාළ හානි ආකාරය ගවේෂණය කෙරෙනු ඇත. පාස්කු ඉරිදා ප්‍රහාරය යනු, *පුද්ගලයින්ට එරෙහි භෞතික ප්‍රචණ්ඩත්වය* සහ *දේපළ විනාශය* ජාතික තලයෙන් දැක්වුණු සුවිශේෂී සිදුවීමක් ලෙසින් දැක්විය හැක.

සාමාන්‍යයක් ලෙසින් ගත් විට, නිරීක්ෂණයට බඳුන් වූ පශ්චාත්-යුධ කාලපරිච්ඡේදයන් දෙක (2010-2014 සහ 2015-2019: වසර අනුව ප්‍රචණ්ඩ ප්‍රහාරයන් ප්‍රමාණය වෙන් කොට දැක්වීම සඳහා 3 නිදශර්කය බලන්න) තුළ මාසයකට *පුද්ගලයෙකු/පුද්ගලයන් වෙත එල්ල වූ භෞතික ප්‍රචණ්ඩත්වය* හෝ *දේපළ හානි* රැගත් සිදුවීම් දෙකක් සළකුණු වී ඇත. *දේපල හානි/විනාශයන්* ලෙසින් වගරීකරණය කෙරී ඇති සිදුවීම්, පල්ලියකට ගල් ගැසීමේ සිට ක්‍රිස්තියානි නිවාස ගිණි තැබීම දක්වා පරාසයක පවතී. මේ අතර, *භෞතික ප්‍රචණ්ඩත්වය* යටතේ වගරීකරණය කෙරී ඇති සිදුවීම් සඳහා විශාල වශයෙන්ම පාස්ටවර්රුන් සහ පල්ලියට යන එන බැතිමතුන් වෙත සිදුවන භෞතික පහරදීම් ඇතුළත්ව ඇත.

පාස්කු ඉරිදා ප්‍රහාරයන් සිදුවන තුරු, ක්‍රිස්තියානි ප්‍රජාවට එරෙහිව එල්ල වන ප්‍රචණ්ඩත්ව සිදුවීම් 'නිදන්ගත' ඒවා ලෙසින් වගරීකරණය වී තිබුණේ, ඒවායේ අඩු තීව්‍රත්වය නිසාවෙනි. [69] එනිසා, 2019 අප්‍රේල් 21 දින ක්‍රිස්තියානි වැඳුම් පිදුම් ස්ථානයන් (සහ කොළඹ හෝටලයන්) ඉලක්ක කොටගනිමින් ඉහළ සංවිධානයකින් සහ ඉතා දියුණු ස්වභාවයකින් යුතුව සිදුවූ මරාගෙන මැරෙන බෝම්බ ප්‍රහාර මාලාව, පසුගිය වසර 25 (1994-2018) තුළ දක්නට ලැබුණු නැඹුරුතාවයන්ගෙන් වෙනස් වූ අනියමයක් විණි.[70] මෙම ප්‍රහාරයන්ගේ ප්‍රතිඵලයක් ලෙසට පුද්ගල මරණ 250 ක් සහ 485 කට වැඩි පිරිසකට තුවාල වීම් සිදුවූ අතර, විශාල වශයෙන් දේපළ විනාශයන් සිදුවිණි. සමස්තයක් ලෙසින් ගත් විට පාස්කු ඉරිදා ප්‍රහාරයන් මගින් සැලකිය යුතු මට්ටමක අපගමනයන් දෙකක් සලකුණු වේ. ඒවා නම්, (1) ක්‍රිස්තියානි ප්‍රජාවට එරෙහිවූ සාමාන්‍යයෙන් සිදුවන ප්‍රචණ්ඩත්ව ආකාරයේ සහ ප්‍රචණ්ඩත්ව පරිමාණයේ අපගමනයක්, සහ (2) ශ්‍රී ලංකාවේ දිගින් දිගටම පැවති සිංහල-බෞද්ධයන්ගේ මූලිකත්වයෙන් සිදුවූ ආගමික ප්‍රචණ්ඩත්ව සිදුවීම් රටාවෙන් අපගමනයක් වේ. මන්දයත්, පාස්කු බෝම්බ ප්‍රහාරයේ වරදකරුවන් ඉස්ලාමීය කණ්ඩායම් වලට අයත් වූවන් හෝ ඉස්ලාමීය දෘෂ්ටිවාදයන්ට දායකත්වය ලබාදුන්නවුන් ලෙසින් හඳුනා ගැනුණු බැවිනි. විවාදාත්මක ලෙසින්, දෙවන අපගමන ආකාරය ඔස්සේ ශ්‍රී ලංකාවේ ක්‍රිස්තියානි සහ මුස්ලිම් භක්තිකයින් අතර නව 'වින්දිත-වරදකරු ද්විධාකරණයකට' උපත ලබාදී ඇත.[71]

# ඇමුණුම 2

## ක්‍රිස්තියානි භක්තිකයින්ට එරෙහි ආගමික ප්‍රචණ්ඩත්ව සිදුවීම් වල ඉහළම සංකේන්ද්‍රණය සහිත දිස්ත්‍රික්ක දෙකේ ගතිලක්ෂණයන්: මඩකළපුව හා පොළොන්නරුව

2015 සහ 2019 අතර කාලපරිච්ඡේදය තුළ ඉහළම සිදුවීම් සංකේන්ද්‍රණයක් සහිත දිස්ත්‍රික්කය වූයේ මඩකළපුව (59ක්) වූ අතර, දෙවෙනුවට වැඩිම දිස්ත්‍රික්කය වූයේ පොළොන්නරුවයි (45). මෙම දිස්ත්‍රික්ක දෙකෙන්ම ලැබුණු දත්ත තුළ වූ පොදු ලක්ෂණයක් වූයේ 2015 න් පසු කාලපරිච්ඡේදය තුළ වාතර්ාගතව තිබූ නැවත නැවත සිදුවූ හානි ආකාරය වූයේ *කොන් කිරීමේ ක්‍රියාවන් හා භාවිතයන්* වීමයි. කෙසේ වෙතත්, යම් විශේෂිත ප්‍රදේශයක බහුතර වාගරීක-ආගමික කණ්ඩායම මගින් ක්‍රිස්තියානි භක්තිකයින්ට එරෙහිව සිදුකළ යම් ආකාරයක කොන් කිරීම් විවිධ වූ බවද සඳහන් කිරීමට වටී. උදාහරණයක් ලෙසින් ගතහොත්, ක්‍රිස්තියානි මිහිදන් කිරීමේ චාරිත්‍රයන්ට එරෙහිව සිදුවූ ආගමික කොන් කිරීම් ඉහත සඳහන් කළ දිස්ත්‍රික්ක දෙකෙන් එකකට සුවිශේෂී වූ බව නිරීක්ෂණය කළ හැක.

ඉහළම සිදුවීම් සංකේන්ද්‍රණය සහිත දිස්ත්‍රික්ක දෙකේ ජනවිකාසන සංයුතිය මගින් දැක්වෙන්නේ, ඒ ඒ අයගේ වාගරීක-ආගමික සංයුතිය විෂයෙහි තියුණු වෙනසකි. 2012 සංගණන දත්ත අනුව, මඩකළපුවේ බහුතර වාගරීක ප්‍රජාව ලෙසින් 72.7% ක දමිළ ජනගහණයක් සලකුණු වන අතර, ඉන් පසුව 25.4% ක ශ්‍රී ලංකා යෝනක, 1.3% ක සිංහල සහ 0.5% ක බගර්ර් ජනතාවක් එහි වෙසේ.[72] මඩකළපුවේ ආගමික ප්‍රජාවන් සලකා බලන විට ක්‍රිස්තියානි භක්තිකයින් සුළුතර ප්‍රජාවක් (8.9%) වන අතර, ආගමික බහුතරය හින්දු භක්තිකයින් (64.4%) සහ දෙවෙනුවට වැඩිම ආගමික කණ්ඩායම මුස්ලිම් භක්තිකයින් (25.5%) වේ.[73]

මීට ප්‍රතිවිරුද්ධ ලෙසින් පොළොන්නරුවේ වාගරීක සහ ආගමික බහුතරය සිංහල-බෞද්ධයින්ගෙන් සැදුම්ලත් අතර (90.7% ක් සිංහල සහ 89.7% ක් බෞද්ධ), පොළොන්නරුවේ ජනගහණයෙන් 1.1% පමණක් වන ක්‍රිස්තියානි භක්තිකයන් ආගමික සුළුතරය ලෙසින් හිඳී.

මෙම සන්දර්භය තුළ, මඩකළපුවේ සහ පොළොන්නරුවේ යන දිස්ත්‍රික්ක දෙකේම කොන් කිරීමේ ක්‍රියාවන් හා භාවිතයන් ලෙසින් වගරීකරණය කෙරුණු සිදුවීම්, (අ) ක්‍රිස්තියානි වැඳුම් පිදුම් ස්ථානයන් ඉදිකිරීමට බාධා කිරීම් හෝ (ආ) ක්‍රිස්තියානි ආගමික කටයුතු සිදුකිරීමට බාධා කිරීම් හා සම්බන්ධ විණි. කෙසේ වෙතත්, මිහිදන් කිරීමේ චාරිත්‍ර චාරිත්‍ර සම්බන්ධ වූ සිදුවීම් වලින් බහුතරයක් මඩකළපුව දිස්ත්‍රික්කයේ සිදුවිණි. ක්‍රිස්තියානි භක්තිකයින්ට ඔවුන්ගේ මිහිදන් කිරීමේ කටයුතු බහුතර (හින්දු) ආගමානුකූලව සිදුකිරීමට බලකිරීම හෝ තමන් සිටිනා ප්‍රදේශයට පිට ස්ථානයකට මිහිදන් කිරීම් රැගෙන යාමට සිදුවීම මෙම සිදුවීම් වලට ඇතුළත් විණි. ගුණතිලක විසින් තකර් කොට තිබූ ආකාරයට, මිහිදන් කිරීමේ කටයුතු වලට ඉඩදීම ප්‍රතික්ෂේප කිරීම පිටුපස ඇති අභිප්‍රාය කරුණු සාධක දෙකකට බැර කළ හැක. එක් අතකින් 'ක්‍රිස්තියානි භූමදානයන් ඉහළ ප්‍රමාණයක් දැකීමට ලැබීම ඔස්සේ ඇතැම් විටක අදාළ බහුතර ආගමේ ආධිපත්‍යයේ බලය බිඳීමක් සිදුවිය හැකි' අතර, මෙහිදී මඩකළපුවේ එම බහුතර ආගමික ප්‍රජාව හින්දූන් වේ. අනෙක් අතට, භූමදාන කටයුතු සඳහා ඉඩ දීම ප්‍රතික්ෂේප කිරීම 'ආධ්‍යාත්මික විශ්වාසයකට' ද බැර කිරීමට හැක්කේ, මිහිදන් කිරීමේ සම්ප්‍රදාය වෙනුවට හින්දු භක්තිකයින් විසින් ආදාහනය විශ්වාස කරනා බැවිනි.[74] මිහිදන් කිරීමේ කටයුතු සම්බන්ධයෙන් වන කොන් කිරීමේ සිදුවීම් මුඛ්‍ය වශයෙන් සිදුවූයේ මඩකළපුව (හින්දු ආධිපත්‍යය සහිත ප්‍රදේශයක්) දිස්ත්‍රික්කයේ වුවත්, මිහිදන් කිරීමේ කටයුතු සම්බන්ධයෙන් වූ ආරාවුල් සහ ආතතීන් පුත්තලමෙන්ද (බෞද්ධ ආධිපත්‍යය සහිත ප්‍රදේශයක්) වාතර්ාගතව තිබිණි.

දිස්ත්‍රික්කයන් තුළ මිහිදන් කිරීම් සම්බන්ධයෙන් ආතතීන් ව්‍යාප්තව තිබීම ඉහත වාගරීක-ආගමික ජනවිකාස සංයුතීන් සමගින් ගෙන බැලූ විට, ඇතැම් විට බෞද්ධයන් සහ හින්දූන් යන දෙකොටසම භූමදාන කටයුතු පිළිබඳව සමාන විශ්වාසයන් දැරීම ඔස්සේ ඇතැම් විට එය විස්තර කිරීමට හැකිවනු ඇත. උදාහරණයක් ලෙසින් දක්වන්නේ නම්, උක්ත ප්‍රජාවන් දෙකම ප්‍රතිසන්ධිය ලැබීමේ සංකල්පය සම්බන්ධයෙන් සමාන විශ්වාසයන් දරයි.[75]

# ඇමුණුම 3

## ක්‍රිස්තියානි භක්තිකයින් 100,00 කට, දිස්ත්‍රික්කයකට සිදුවන ආගමික ප්‍රචණ්ඩත්ව ක්‍රියා වාෂරීක අනුපාතය ගණනය කිරීම

සිදුවීම් වල වාෂරීක අනුපාතයේ ගණනය කිරීම් සඳහා 2010-2014 කාලයෙන් නිදශර්නයක් සපයා ඇත.

සමීකරණය 1 ඔස්සේ 2010-2014 කාලය තුළ මඩකළපුවේ ක්‍රිස්තියානි භක්තිකයින්ට වන සිදුවීම් ප්‍රමාණය ගණනය කෙරේ. මේ, මඩකළපුවේ සමස්ත ක්‍රිස්තියානි භක්තික ජනගහණයට එදිරිව 2010-2014 කාලයේ මඩකළපුවේ ක්‍රිස්තියානි භක්තිකයින් විසින් මුහුණ දුන් සමස්ත සිදුවීම් කොටසයි.

සමීකරණය 1: 20/47287= 0.0004

සිදුවීම් වල වාෂරීක අනුපාතය ලබාගැනී ඇත්තේ, විමශර්ණයට ලක්ව ඇති කාලපරිච්ඡේදයේ සලකා බලන වසර ප්‍රමාණයේ සංඛ්‍යාවෙන් සමීකරණය 1 බෙදීමෙනි. 2010 න් පසු කාලපරිච්ඡේදයට වසර 5 ක දත්ත ඇතුළත් වේ. එනිසා, සමීකරණය 1 හි පිළිතුර 5 න් බෙදූ විට, සිදුවීම් වල වාෂරීක අනුපාතය ලැබේ. ඉන් පසුව මෙය 100,000 න් වැඩි කෙරෙන්නේ, මඩකළපුවේ සිටින ක්‍රිස්තියානි භක්තිකයින් 100,000 කට වාෂරීක අනුපාතය ලෙසින් එය අථර් නිරූපණය කිරීම සඳහායි.

සමීකරණය 2: [(20/47287)/5] x 100,000 = 8

# ක්‍රමවේදය සහ සිදුවීම් වර්ගීකරණය

පහත දක්වා ඇති ක්‍රමවේදය, වෙරිටෙ රිසර්ච් මගින් 2013 දී නිර්මාණය කරනු ලැබූ අතර, 1994 සිට 2014 දක්වා ක්‍රිස්තියානි භක්තිකයින්ගේ ආගමික නිදහසට ඇති බාධාවන් විශ්ලේෂණය කළ වෙරිටෙ රිසර්ච් හි මින් පෙර අධ්‍යයනය සඳහා එම ක්‍රමවේදය යොදාගෙන ඇත.

## සිදුවීම සහ සිදුවීම් හැඳුනුම

දිනය මත පදනම්ව සෑම සිදුවීමකටම ඊට විශේෂ වූ හැඳුනුමක් ලබාදී ඇත.

එක් සිදුවීමක් යනු තනි දත්ත ලක්ෂ්‍යයකි. එනිසා, එකිනෙකට අදාළ ආගමික ප්‍රචණ්ඩත්ව සිදුවීම් පෙළක් හෝ එකම ස්ථානයක විවිධ අවස්ථාවන් තුළ වන සිදුවීම් කිහිපයක් වර්ගීකරණය කෙරෙන්නේ එකිනෙකින් වෙන් වූ සිදුවීම් ලෙසිනි. වෙන් වූ සිදුවීමක් ලෙසින් වර්ග කිරීම සඳහා සිදුවීමක් වන කාලය, එකම දිනයේ වන සිදුවීම් වල සිට වෙනස් දිනවල වන සිදුවීම් දක්වා පරාසයක පවතී. තවදුරටත්, යමක් 'සිදුවීමක්' ලෙසින් ගණන් ගැනීම උදෙසා, එය ආගමික පෙළඹවීමක් සහිත මානයක ප්‍රචණ්ඩත්වය[e] සහිතව සිදුවිය යුතු අතර, 'සිදුවීම් ආකාරය' පහත දක්වා ඇති කාණ්ඩයන් තුළට ඇතුළත් වීමට හැකි යැයි නිර්ණය කිරීමට ප්‍රවේශ වීමට හැකි දත්ත ප්‍රමාණවත් විය යුතුය.

## හානි ආකාර

කාණ්ඩයන් සඳහා වන අර්ථවිවරණයන් පහත ලැයිස්තුගත කොට ඇත. පහත කාණ්ඩ පහෙන් එකකට හෝ අයත් නොවනා සිදුවීම් වාර්තාවක් *සිදුවීමක්* ලෙසින් වර්ගීකරණය කර නොමැත. තනි සිදුවීමකට එකකට වඩා හානි ආකාරයන් තිබිය හැක.

1. *දේපළ හානි හෝ විනාශ කිරීම්* – දේපළ හානි හෝ විනාශ කිරීම් - අයුතු ලෙසින් බලහත්කාරයෙන් ඇතුළු වීම්, පුද්ගලයෙකුට, ආයතනයකට හෝ කණ්ඩායමකට අයත් දේපළකට එල්ල වන කඩා බිඳ දැමීම් ඇතුළුව ඕනෑම ආකාරයක ප්‍රහාරයන්.
2. *භෞතික ප්‍රචණ්ඩත්වය* - පුද්ගලයෙකුට/පුද්ගලයන්ට එරෙහිව වන බලහත්කාරයෙන් රඳවා තබාගැනීම, පහර දීම, ලිංගික අපරාධ, පැහැර ගැනීම සහ ඝාතනය ඇතුළු -ඊට පමණක් සීමා නොවූ- ඕනෑම ආකාරයක ප්‍රචණ්ඩ ක්‍රියා
3. *ද්වේෂ සහගත අදහස් දැක්වීම්* - ආගමකට, ආගමික භාවිතාවන්ට, ආගමික සංකේතයන්ට, වැඳුම් පිදුම් ස්ථානයන්ට, ආගමික ප්‍රජාවන්ට හෝ ආගමික අනුබැඳිය මත පදනම් වෙමින් ආගමක අනුගාමිකයින්ට එරෙහිව ප්‍රහාර ලෙසින්, මුද්‍රිත දෑ, රැස්වීම්, රැළි හෝ මාධ්‍ය ව්‍යාපාර ඔස්සේ අදහස් ප්‍රකාශ කිරීම්
4. *තර්ජනයන්, බියවැද්දීම් හා බලාත්කාරයන්* - පුද්ගලයන්ට හෝ දේපළ වලාට එරෙහිව ප්‍රචණ්ඩත්වයක් ඇති නොවන, එහෙත් පුද්ගලයෙකුට/පුද්ගලයින්ට ඔවුන්ගේ කැමැත්තට එරෙහිව ඕනෑම ක්‍රියාවක් සිදුකිරීමට සිදුවන ලෙසින් බලපෑමක් හෝ බලපෑමක තර්ජනයක් ඇති කෙරෙන ආකාරයේ, වාචික තර්ජනයන්, දුරකථන ඇමතුම් හෝ සෘජු ප්‍රතිමුඛ වීම්

[e] ප්‍රචණ්ඩත්වය යන යෙදුම, කොන් කිරීම් සහ ද්වේෂ සහගත අදහස් දැක්වීම් වැනි ව්‍යුහාත්මක ප්‍රචණ්ඩත්වයේ අංගයන්ද ඇතුළත් වීම සඳහා පුළුල්ව අර්ථවිවරණය කෙරී ඇත.

5. *කොන් කිරීමේ ක්‍රියා හෝ භාවිතාවන්* - ආගමික පදනමකින් සිදුවන ඕනෑම ආකාරයක කොන් කිරීමක්: වාගරීක-ආගමික කණ්ඩායමක් වීමේ පදනම ඔස්සේ තනි සිදුවීමකදී නැතිනම් දිගින් දිගටම පවත්නා වෙනස් කොට සැලකීමක ප්‍රතිපත්ති/භාවිතාවන් හිදී සේවා සැපයීම් සීමා කිරිමක් හෝ ප්‍රතික්ෂේප කිරීමක් හෝ වෙනස් කොට සැලකීමක් ඔස්සේ ඊට ප්‍රවේශය සීමා කිරීමක් ඇතුළත්ව, නමුත් ඊට සීමා නොවූ ක්‍රියාවන් හෝ භාවිතාවන්. මෙම කාණ්ඩය රාජ්‍ය ක්‍රියාකාරකයන්ට පමණක් සීමා නොවූ නමුත්, 'ප්‍රධාන වරදකරුවන්' ලෙසින් ලැයිස්තුගත කොට ඇති ඕනෑම කාණ්ඩයකට අදාළ වේ.

## ප්‍රධාන වරදකරුවන්

ශ්‍රී ලංකාවේ ජාතික ක්‍රිස්තියානි ඉවැන්ජලික සන්ධානයේ වාර්තාවන්ගෙන් හඳුනාගත් පරිදි, වරදකරුවන්ව පෙර නියම කළ ලැයිස්තුවකින් ප්‍රධාන ක්‍රියාකාරක කාණ්ඩයකට වගරීකරණය කෙරේ. එක් සිදුවීමකට වරදකරුවන් කාණ්ඩ එකකට වඩා තිබිය හැක.

1.

   a. *දේශපාලන/සමාජ ව්‍යාපාර හෝ දේශපාලකයින්* - සිදුවීම හා සම්බන්ධ වන මොහොතේ රාජ්‍ය තනතුරක් නොදරණ, තමන්ව සිය නමෙන් හෝ දේශපාලන ප්‍රතිරූපයක් ලෙසින් හඳුන්වා දෙන සියලුම දෙනා මීට අදාළ වේ. උදාහරණ ලෙසින් දක්වන්නේ නම්, පළාත් සභා මන්ත්‍රීවරයෙකු මෙම කාණ්ඩයට අයත් වන නමුත්, පළාත් සභා ඇමතිවරයෙකු අයත් වන්නේ පහත ඇති 'මහජන සේවක' කාණ්ඩයට වේ.

   b. *බෞද්ධ භික්ෂූන්ගෙන් සැදි, හෝ බෞද්ධ භික්ෂු නායකත්වයෙන් යුතු දේශපාලන/සමාජ ව්‍යාපාර*

3. *හඳුනා නොගත් පුද්ගලයින් හෝ කණ්ඩායම්* - වරදකරුවන්ගේ සම්බන්ධතාවය නොපැහැදිලි නම් හෝ සඳහන් කොට නැතිනම්

4. *ආයතන හෝ මහජන සේවක* - රාජ්‍ය නිලයකට ඡන්දයෙන් තේරී පත්වූ අයද ඇතුළත්ව ගැටළුවට පාත්‍ර වූ පුද්ගලයා හෝ ආයතනය, රාජ්‍යය වෙත නෛතික සම්බන්ධකමක් ඇති නම් (උදා: රාජ්‍ය පාසැල්, රජයේ පරිපාලකයෙකු, අමාත්‍යවරයෙකු )

   a. *ආගමික ආයතන හෝ පූජ්‍ය පක්ෂය* - පහත සඳහන් ආකාරයට නිල වශයෙන් සමාජ/දේශපාලන ව්‍යාපාරයකට සම්බන්ධ පූජ්‍ය පක්ෂය හැර, ආගමික සංඝයක, වැඳුම් පිදුම් ස්ථානයක හෝ ආගමික ආයතනයක සාමාජිකයෙකු (උදා: ආගමික අධ්‍යාපන ආයතන, ආගමට සම්බන්ධ සුභසාධන ආයතන)

   b. *බෞද්ධ භික්ෂූන්* - බෞද්ධ සංඝයට අයත් සාමාජිකයින් මීට අයත් වේ

5. වාණිජ ලැදියාවන් සහිත කණ්ඩායම් හෝ පුද්ගලික අංශයේ ආයතන - නිල වශයෙන් ලියාපදිංචි වාණිජ ආයතන (උදා: ශ්‍රී ලංකාවේ සමාගම් පනත යටතේ ලියාපදිංචි ව්‍යාපාරයක්), ඕනෑම ආකාරයක වාණිජ ක්‍රියාකාරකම් වලට සම්බන්ධ හෝ වාණිජ ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය සඳහා අවකාශයක් ලෙසින් ක්‍රියාත්මක වන ව්‍යාපාර සංවිධානයක් හෝ ආයතනයක්

## වරදකරුවන්ගේ ආගමික අනුබැඳිය

කණ්ඩායම් හෝ පුද්ගලයින් ස්වයං-හඳුන්වාදීමක් කරන්නේ නම් හෝ නිශ්චිතව හඳුනාගත හැකි ආගමික අනුබැඳියක් තිබේ නම් මෙම කාණ්ඩය භාවිතා වන අතර; එසේ නැතිනම් එය 'නොදනී' යනුවෙන් වගරීකරණය කෙරෙනු ඇත.

## වරදකරුවන්ගේ වාගරීක අනුබැඳිය

කණ්ඩායම් හෝ පුද්ගලයින් ස්වයං-හඳුන්වාදීමක් කරන්නේ නම් හෝ නිශ්චිතව හඳුනාගත හැකි වාගරීක අනුබැඳියක් තිබේ නම් මෙම කාණ්ඩය භාවිතා වන අතර; එසේ නැතිනම් එය 'නොදනී' යනුවෙන් වගරීකරණය කෙරෙනු ඇත.

## ප්‍රධාන ඉලක්ක කණ්ඩායම

මෙම කොටසින් දැක්වෙන්නේ, වාර්තාගත සිදුවීම් වල ප්‍රධාන ඉලක්කයයි. තේරීම් කාණ්ඩ හයක් මගින් විය හැකි ඉලක්කයන්ගේ වඩාත් පුළුල් වගරීකරණයක් නියෝජනය කරන අතර, තෝරාගත් එක් සිදුවීමක් එම කාණ්ඩයන් එකකට වඩා ප්‍රමාණයකට ඇතුළත් විය හැක.

ප්‍රධාන ඉලක්කයන් මෙසේ වගරීකරණය කෙරී ඇත:

1. *පුද්ගලයෙකු/පුද්ගලයින්* - 'ප්‍රධාන ඉලක්කයන්' යටතේ වෙනත් කිසිදු කාණ්ඩයක විශේෂයෙන් සඳහන්ව නැති තනි පුද්ගලයින් හෝ පුද්ගල කණ්ඩායම් (උදා: ක්‍රිස්තියානි පල්ලියක සේවකයන් හෝ ක්‍රිස්තියානි සභාවක්.
2. *ප්‍රාදේශීය ප්‍රජාව* - උදාහරණයක් ලෙසින් දක්වන්නේ නම්, ගමක සියලුම ක්‍රිස්තියානි නිවාස හෝ ඉලක්කයක් වූ ක්‍රිස්තියානි නිකායක්
3. *වැඳුම් පිදුම් ස්ථාන* - පල්ලියක් හෝ නැමදුම් හමුවීම් සිදුකරන ස්ථානයක්/නිවසක් විය හැක.
4. *ව්‍යාපාර* - ක්‍රිස්තියානි භක්තික හිමිකාරීත්වය සහිත ව්‍යාපාරයක් විය හැක
5. *පුළුල් ප්‍රජාවක්* - විශේෂයෙන්ම බොහෝ හෝ සියලුම කාණ්ඩයන් එක්ව ගෙන ඉලක්ක කෙරුණු සිදුවීම් වලදී, නැතිනම් ජාතික තලයකදී ක්‍රිස්තියානි භක්තිකයින් ඉලක්ක වූ විටක
6. *ආයතම, පූජ්‍ය පක්ෂය, නිල හෝ මහජන ප්‍රතිරූප* - පාස්ටවර්රයෙකු හෝ ක්‍රිස්තියානි සංවිධානයක් හෝ වෙනත් ක්‍රිස්තියානි මහජන ප්‍රතිරූපයක් විය හැක

## සිදුවීමේදී පොලිසියේ පියවර

1. සක්‍රියව/නිහඬව සම්බන්ධව ඇත - යම් පොලිස් නිලධාරියෙකු විසින්, වරදකාරී සිදුවීමකට සෘජුව සම්බන්ධ වීම, ඕනෑම ආකාරයකින් වරදකරුවන්ගේ ක්‍රියාවන් අනුමත කිරීම ඔස්සේ වරදකරුවන්ට සහාය පළ කිරීම හෝ සිදුවීමක් සිදුවූ පසුව දැනුම් දුන් අවස්ථාවකදී සිය නිල රාජකාරියේ නියැලීම ප්‍රතික්ෂේප කිරීම ඇතුළත්ව, වරදක් සිදුකිරීමේදී සක්‍රියව හෝ නිහඬව සිදුකරනා ඕනෑම භූමිකාවක්.
2. සිදුවීම වන විට එතැන අක්‍රියව හිඳීම - පොලිස් නිලධාරියෙකු ආගමික හිංසාවක් සිදුවන විට එහි ප්‍රධාන ඉලක්කයන් ආරක්ෂා කිරීම සඳහා මැදිහත්වීමකින් තොරව එතැන සිටින්නේ නම්.
3. සිදුවීම වන විට එතැන හිඳ මැදිහත් වීම - පොලිස් නිලධාරියෙකු ආගමික හිංසාවක් සිදුවන විට එහි ප්‍රධාන ඉලක්කයන් ආරක්ෂා කිරීම සඳහා එතැනදී මැදිහත් වන්නේ නම්.
4. නොසිටී/නොදනී - සිදුවීමේදී පොලිස් නිලධාරියෙකුගේ ක්‍රියාවන් පිළිබඳ කිසිදු සඳහනක් නැතිනම් හෝ සිදුවීම් වාතර්ාවේ එම ක්‍රියාවන් පැහැදිලිව නොමැති නම්.
5. සිදුවීමට පසුව මැදිහත් වීම - සිදුවීමට පසුව පොලිස් නිලධාරියෙකුට දැන්වූවේ නම් හෝ නිලධාරියා වෙත ගියේ නම් සහ යම් ආකාරයක පසු-විපරමක් සිදුවූයේ නම්.

## සිදුවීමේදී රජයේ නිල පියවර

රාජ්‍ය නිලධාරියෙකු යනු, පොලිසිය හැරෙන්නට වෙනත් ඕනෑම රජයේ සේවකයෙකු විය හැක. උදා: ප්‍රාදේශීය ලේකම් කායර්ාලයක නිලධාරියෙක්, ග්‍රාම සේවක නිලධාරියෙක්.

1. *සක්‍රියව/නිහඬව සම්බන්ධව ඇත* - යම් රජයේ නිලධාරියෙකු විසින්, වරදකාරී සිදුවීමකට සෘජුව සම්බන්ධ වීම, ඕනෑම ආකාරයකින් වරදකරුවන්ගේ ක්‍රියාවන් අනුමත කිරීම ඔස්සේ වරදකරුවන්ට සහාය පළ කිරීම හෝ සිදුවීමක් සිදුවූ පසුව දැනුම් දුන් අවස්ථාවකදී සිය නිල රාජකාරියේ නියැලීම ප්‍රතික්ෂේප කිරීම ඇතුළත්ව, වරදක් සිදුකිරීමේදී සක්‍රියව හෝ නිහඬව සිදුකරනා ඕනෑම භූමිකාවක්.
2. *සිදුවීම වන විට එතැන අක්‍රියව හිඳීම* - රජයේ නිලධාරියෙකු ආගමික හිංසාවක් සිදුවන විට එහි ප්‍රධාන ඉලක්කයන් ආරක්ෂා කිරීම සඳහා මැදිහත්වීමකින් තොරව එතැන සිටින්නේ නම්.
3. *සිදුවීම වන විට එතැන හිඳ මැදිහත් වීම* - රජයේ නිලධාරියෙකු ආගමික හිංසාවක් සිදුවන විට එහි ප්‍රධාන ඉලක්කයන් ආරක්ෂා කිරීම සඳහා එතැනදී මැදිහත් වන්නේ නම්.
4. *නොසිටී/නොදනී* - සිදුවීමේදී රජයේ නිලධාරියෙකුගේ ක්‍රියාවන් පිළිබඳ කිසිදු සඳහනක් නැතිනම් හෝ සිදුවීම් වාතර්ාවේ එම ක්‍රියාවන් පැහැදිලිව නොමැති නම්.
5. *සිදුවීමට පසුව මැදිහත් වීම* - සිදුවීමට පසුව රජයේ නිලධාරියෙකුට දැන්වූවේ නම් හෝ නිලධාරියා වෙත ගියේ නම් සහ යම් ආකාරයක පසු-විපරමක් සිදුවූයේ නම්.

## වැඳුම් පිදුම් ස්ථානයේ නීත්‍යානුකූලබව

වැඳුම් පිදුම් කරනා ස්ථානයන් ලියාපදිංචි කරනා ලෙසින් 2008 දී බුද්ධ ශාසන අමාත්‍යාංශය මගින් චක්‍රලේඛයක් නිකුත් කිරීමෙන් පසුව සිදුවූ සියලුම සිදුවීම් සඳහා, වැඳුම් පිදුම් ස්ථානයන් නීත්‍යානුකූල භාවය පිළිබඳ ගැටළුව වගරීකරණය කොට ඇත.

1. *ව්‍යවස්ථාපිතය හෝ චක්‍රලේඛය පිළිබඳ සඳහනකින් තොරව නීත්‍යානුකූල භාවය ප්‍රශ්න කොට ඇත* - ව්‍යවස්ථාපිතය හෝ චක්‍රලේඛය පිළිබඳ සඳහනකින් තොරව වැඳුම් පිදුම් ස්ථානයක නීත්‍යානුකූල භාවය ප්‍රශ්න කොට ඇත

2. *ව්‍යවස්ථාපිතය හෝ චක්‍රලේඛය පිළිබඳව සඳහන් කිරීම සමගින් නීත්‍යානුකූල භාවය ප්‍රශ්න කොට ඇත* - ව්‍යවස්ථාපිතය හෝ චක්‍රලේඛය පිළිබඳව සඳහන් කිරීම සමගින් වැඳුම් පිදුම් ස්ථානයක නීත්‍යානුකූල භාවය ප්‍රශ්න කොට ඇත

3. *පැහැදිලි කිරීමක් ඉල්ලා ඇත*- වැඳුම් පිදුම් ස්ථානයේ නීත්‍යානුකූල භාවය ප්‍රශ්න කෙරී ඇතිනම් හෝ අවසර ලබාදී ඇති බවට සාක්ෂි පෙන්වන ලෙසින් කියා සිටි විට

4. *නීතිවිරෝධී/අවසර නොලත් ලෙසින් සලකා ඇත*- පාස්ටවර්රයෙකුට පල්ලියක හෝ යාඥා හමුවක සිය ආගම ඇදහීමේ සේවාවන්, බුද්ධ ශාසන අමාත්‍යාංශය හෝ වයඹ සංවධර්න අධිකාරිය වෙතින් ලබාගත් අවශ්‍ය ලිපිලේඛනයන්ගෙන් තොරව පවත්වා ගෙන යා නොහැකි යැයි රාජ්‍ය නිලධාරියෙකු (උදා: පොලිස් නිලධාරියෙකු) විසින් ප්‍රකාශ කරමින්, එම වැඳුම් පිදුම් ස්ථානය නීතිවිරෝධී යැයි සලකා ඇති විට.

# අවසන් සටහන්


1. ජනිත් ෆනර්ැන්ඩෝ සහ ෂමාරා වෙත්තමුණි, *Religious violence in Sri Lanka: A new perspective on an old problem,* ඩේලි එෆ්ටී, 2017 මැයි 26, ප්‍රවේශය: http://www.ft.lk/article/617872/Religious-violence-inSri-Lanka:-A-new-perspective-on-an-old- problem [අවසන් වරට ප්‍රවේශය: 2019 දෙසැම්බර් 18].

2. ගෙහාන් ගුණතිලක, 'The Structural Limits of Depoliticisation in Sri Lanka' (2019) 108(6) *The Round Table: The Com- monwealth Journal of International Affairs* 613-624.

3. නීල් ඩිවෝටා, 'A Win for Democracy in Sri Lanka', *(2016) 27 (1) Journal of Democracy National Endowment for De- mocracy and Johns Hopkins University Press,* පි.158.

4. ගෙහාන් ගුණතිලක, *The Chronic and the Entrenched: Ethno-religious violence in Sri Lanka* (ජනවාගරීක අධ්‍යයනය සඳහා වූ ජාත්‍යන්තර කේන්ද්‍රය 2018), පි.32.

5. නීල් ඩිවෝටා, 'A Win for Democracy in Sri Lanka', *(2016) 27 (1) Journal of Democracy National Endowment for De- mocracy and Johns Hopkins University Press,* පි.153.

6. ගෙහාන් ගුණතිලක, *The Constitutional Practice of Ethno-Religious Violence in Sri Lanka,* Asian Journal of Comparative Law, 13 (2018), පි.359.

7. ගෙහාන් ගුණතිලක, *The Chronic and the Acute: Post-War Religious Violence in Sri Lanka,* (*මානව හිමිකම් අධ්‍යාපනය සඳහා වූ ජාත්‍යන්තර කේන්ද්‍රය සහ* ජනවාගරීක අධ්‍යයනය සඳහා වූ ජාත්‍යන්තර කේන්ද්‍රය 2015), පි.1.

8. 2010-2014 කාලය සඳහා වන මූලික සොයාගැනීම් වෙත ශ්‍රී ලංකාවේ ජාතික ක්‍රිස්තියානි ඉවැන්ජලික සන්ධානය (NCEASL) හා සහයෝගීව වෙරිටෙ රිසවර් මගින් ඉදිරිපත් කළ මින් පෙර වාතර්ාව ඔස්සේ ප්‍රවේශ විය හැක, *Silent Suppression: Restrictions on Religious Freedoms of Christians 1994-2014* (2015) ප්‍රවේශය: http://minormatters.org/storage/app/uploads/public/5b5/6f2/ca3/5b56f2ca3b806736825385.pdf [අවසන් වරට ප්‍රවේශය: 2019 නොවැම්බර් 18].

9. කතුවැකිය, *The Guardian view on Sri Lanka's election: Danger ahead,* ද ගාඩියන්, 2019 නොවැම්බර් 14 ප්‍රවේශය: https://www.theguardian.com/commentisfree/2019/nov/14/the-guardian-view-on-sri-lankas-election-danger-ahead?fbclid=I-wAR257omu_JXXEC4KryAIhFYfj-YUPR6OhrH9hDA3VV1Yad5W3fyZ3HK5ue4 [අවසන් වරට ප්‍රවේශය: 2019 නොවැම්බර් 18].

10. අයේෂා සුහයිර්, *Dynamics of Sinhala Buddhist Ethno-Nationalism in Post War Sri Lanka* (2016 අප්‍රේල්), විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය (CPA), පි.20, ප්‍රවේශය: https://www.cpalanka.org/wp-content/uploads/2016/04/Dynamics-ofSinhala-Bud-dhist-Ethno-Nationalism-in-Post-War-Sri-Lanka.pdf [අවසන් වරට ප්‍රවේශය: 2019 නොවැම්බර් 18].

11. කාන්තාව සහ මාධ්‍ය සාමූහිකය (WMC) සහ කාන්තාවන් සඳහා ආසියා-පැසිෆික් සම්පත් හා පයෙර්ෂණ කේන්ද්‍රය (ARROW), *Ethno-Religious Nationalism and Sexual and Reproductive Health and Rights in Sri Lanka: A social media, print media and policy review*, (2016), පි.9, ප්‍රවේශය: https://arrow.org.my/wp content/uploads/2016/08/Interlinkages-Between-Reli- gion-and-SRHR_National-Report_Sri-Lanka.pdf [අවසන් වරට ප්‍රවේශය: 2019 නොවැම්බර් 18].

12. අයේෂා සුහයිර්, *Dynamics of Sinhala Buddhist Ethno-Nationalism in Post War Sri Lanka* (April 2016), විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය (CPA), පි.6, ප්‍රවේශය: https://www.cpalanka.org/wp-content/uploads/2016/04/Dynamics-ofSinhala-Bud- dhist-Ethno-Nationalism-in-Post-War-Sri-Lanka.pdf [අවසන් වරට ප්‍රවේශය: 2019 නොවැම්බර් 18].

13. ඇනා ස්ටිල්ස්, 'Civic Nationalism and Language Policy', *(2009) 37 (3) Wiley Periodicals, Inc. Philosophy and Public Affairs,* පි.257.

14. මොහොමඩ් ආගුස් යුසුෆ් සහ ආදම්බාවා සජර්ූන්, *Post-War Religious Violence, Counter-State Response and Religious Harmony in Sri Lanka,* (2019) 9 (3) Journal of Educational and Social Research, Mediterranean Center of Social and Educational Research, පි.212.

15. වෙරිටෙ රිසවර් (VR) 'Understanding Press Coverage on Religious Freedom (2019 ඔක්තෝබර් සහ නොවැම්බර්) ප්‍රවේශය: http://www.minor- matters.org/en/media-pdfs [අවසන් වරට ප්‍රවේශය: 2019 නොවැම්බර් 18].

16. 'රන්ජන්ගේ තවත් ආන්දෝලනාත්මක හඬ පට කරළියට', හිරු නිව්ස්, 2020 ජනවාරි 13, ප්‍රවේශය: http://www.hirunews.lk/232228/more-controversial-voice-clips-of-ranjan-come-out [අවසන් වරට ප්‍රවේශය: 2020 ජනවාරි 24].

17. ගෙහාන් ගුණතිලක, *The Constitutional Practice of Ethno-Religious Violence in Sri Lanka,* Asian Journal of Comparative Law, 13 (2018), පි.359–387, පි.359.

18. ගෙහාන් ගුණතිලක, *The Chronic and the Entrenched: Ethno-religious violence in Sri Lanka* (ජනවාගරීක අධ්‍යයනය සඳහා වූ ජාත්‍යන්තර කේන්ද්‍රය 2018), පි.64.

19. එහිම, පි.62.

20. හෂර්ණ රඹුක්වැල්ල, *The Politics and Poetics of Authenticity: A Cultural Genealogy of Sinhala Nationalism* (UCL Press 2018), පි. 37.

21. මෙම අදහස මින් පෙර වෙරිටෙ රිසවර් විසින් සිය සතිපතා ප්‍රකාශනයක් වන මාධ්‍ය විශ්ලේෂණයෙහිදී විමසුම් කොට ඇත. උදාහරණ සඳහා, වෙරිටෙ රිසවර්, මාධ්‍ය විශ්ලේෂණය, වෙලුම 4, කාණ්ඩය 16 බලන්න (2014 අප්‍රේල් 21 – 27, 2014).

22. ගෙහාන් ගුණතිලක, *The Chronic and the Entrenched: Ethno-religious Violence in Sri Lanka* (*මානව හිමිකම් අධ්‍යාපනය සඳහා වූ ජාත්‍යන්තර කේන්ද්‍රය* සහ ජනවාගරීක අධ්‍යයනය සඳහා වූ ජාත්‍යන්තර කේන්ද්‍රය 2018), පි.70.

23. ස්ටැන්ලි ජේ. තම්බයියා, *Sri Lanka: Ethnic fratricide and the dismantling of democracy* (IB Tauris, 1986), පි.92.

24. ගෙහාන් ගුණතිලක, *The Chronic and the Entrenched: Ethno-Religious Violence in Sri Lanka*, (ICES 2018), පි.92.

25. වෙරිටෙ රිසච් (VR) 'Understanding Press Coverage on Religious Freedom (සැප්තැම්බර් 2019) ප්‍රවේශය: http://www.minor-matters.org/en/media-pdfs [අවසන් වරට ප්‍රවේශය: 2019 නොවැම්බර් 18].

26. ගෙහාන් ගුණතිලක, *The Chronic and the Entrenched: Ethno-religious violence in Sri Lanka* (ජනවාගරීක අධ්‍යයනය සඳහා වූ ජාත්‍යන්තර කේන්ද්‍රය 2018), පි.75.

27. එහිම, පි.24-27.

28. එහිම, පි.24-27.29.

29. සුළු ජාතික අයිතීන් පිළිබඳ ජාත්‍යන්තර සංවිධානය, Confronting intolerance: Continued violations against religious minorities in Sri Lanka, (2016), ප්‍රවේශය: https://minorityrights.org/wpcontent/uploads/2016/12/MRG_Rep_SriLan_Dec16.pdf [අවසන් වරට ප්‍රවේශය: 2019 නොවැම්බර් 18].

30. එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් පිළිබඳ මහකොමසාරිස් කායර්ාලයේ වෙබ් අඩවිය, 'Preliminary findings of Country Visit to Sri Lanka by the Special Rapporteur on freedom of religion or belief', ප්‍රවේශය: https://www.ohchr.org/EN/NewsEvents/Pages/DisplayNews.aspx?NewsID=24918&LangID=E [අවසන් වරට ප්‍රවේශය: 2019 දෙසැම්බර් 30].

31. MinorMatters වෙබ් අඩවිය, 'HQI tells pastor to register place of worship', ප්‍රවේශය: http://minormatters.org/en/crisis-map/report/hqi-tells-pastor-to-register-place-of-worship [අවසන් වරට ප්‍රවේශය: 2019 දෙසැම්බර් 30].

32. ගෙහාන් ගුණතිලක, *The Chronic and the Entrenched: Ethno-religious violence in Sri Lanka* (ජනවාගරීක අධ්‍යයනය සඳහා වූ ජාත්‍යන්තර කේන්ද්‍රය 2018), පි.77.

33. ගෙහාන් ගුණතිලක, 'The Structural Limits of Depoliticisation in Sri Lanka' (2019) 108(6) *The Round Table: The Commonwealth Journal of International Affairs* පි.613-624.

34. ගෙහාන් ගුණතිලක, *The Chronic and the Acute: Post-War Religious Violence in Sri Lanka,*(මානව හිමිකම් අධ්‍යාපනය සඳහා වූ ජාත්‍යන්තර කේන්ද්‍රය සහ ජනවාගරීක අධ්‍යයනය සඳහා වූ ජාත්‍යන්තර කේන්ද්‍රය 2015), පි.33- 34.

35. වෙරිටෙ රිසච් මගින් ආගමික නිදහසට අදාළ කරුණු සම්බන්ධ පුවත්පත් ආවරණයන් අවබෝධ කරගැනීම උදෙසා minormatters.org සඳහා මාසික වාතර්ාවන් ලබා දේ. මෙම වාතර්ාවන් පොදුජනයාට දැකීම සඳහා තිබේ: http://www.minormatters.org/en/media-pdfs.

36. ගෙහාන් ගුණතිලක, *The Chronic and the Entrenched: Ethno-religious violence in Sri Lanka* (ජනවාගරීක අධ්‍යයනය සඳහා වූ ජාත්‍යන්තර කේන්ද්‍රය 2018), පි.2.

37. දේවසිරි, *New Buddhist Extremism and the Challenges to Ethno-Religious Co-Existence in Sri Lanka* (ජනවාගරීක අධ්‍යයනය සඳහා වූ ජාත්‍යන්තර කේන්ද්‍රය 2016), පි.37.

38. වෙරිටෙ රිසච්, මාධ්‍ය විශ්ලේෂණය*,* වෙළුම.09 කාණ්ඩ අංක.20 (2019 මැයි 27- ජූනි 02).

39. වෙරිටෙ රිසච් (VR) 'Understanding Press Coverage on Religious Freedom (May 2019) ප්‍රවේශය: http://www.minormatters.org/en/media-pdfs [last accessed 18 November 2019].

*40.* එහිම.

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාතර්මේන්තුව, ජන හා නිවාස සංගණය*-2012* - අවසන් වාතර්ාව*,* ප්‍රවේශය: http://www.statistics.gov.lk/PopHouSat/CPH2011/Pages/Activities/Reports/FinalReport/FinalReportE.pdf [අවසන් වරට ප්‍රවේශය: 2019 නොවැම්බර් 20].

*41.* එහිම.

42. වෙරිටෙ රිසච්, මාධ්‍ය විශ්ලේෂණය6*,* වෙළුම.09 කාණ්ඩ අංක.20 (2019 මැයි 27- ජූනි 02).

43. Disinformation in Sri Lanka: An overview (2017). ග්‍රවුන්ඩ්ව්විස්. https://groundviews.org/2017/07/04/ disinformation-in-sri-lanka-an-overview/ වෙතින් ලබාගෙන ඇත [අවසන් වරට ප්‍රවේශය: 2019 නොවැම්බර් 20].

44. වෙරිටෙ රිසච් (VR) 'Understanding Press Coverage on Religious Freedom (May 2019) ප්‍රවේශය: http://www.minormatters.org/en/media-pdfs [අවසන් වරට ප්‍රවේශය: 2019 නොවැම්බර් 18].

45. වෙරිටෙ රිසච් (VR) 'Understanding Press Coverage on Religious Freedom (May 2019) ප්‍රවේශය: http://www.minormatters.org/en/media-pdfs [අවසන් වරට ප්‍රවේශය: 2019 නොවැම්බර් 18].

46. ධරීෂා බැස්ටියන්ස්, *"This is a Sinhala country, Sinhala Government": Bodu Bala Sena,* ඩේලි එෆ්ටී, 2013 පෙබරවාරි 18, ප්‍රවේශය: http://www.ft.lk/article/136381/-This-is-a-Sinhala-country--Sinhala-Government---Bodu-Bala-Sena [අවසන් වරට ප්‍රවේශය: 2019 දෙසැම්බර් 18].

47. ධම්මික හේරත් සහ හෂර්ණ රඹුක්වැල්ල, *Self, religion, identity and politics: Buddhist and Muslim encounters in contemporary Sri Lanka,* (ජනවාගරීක අධ්‍යයනය සඳහා වූ ජාත්‍යන්තර කේන්ද්‍රය 2015), පි.7.

48. වෙරිටෙ රිසච්, මාධ්‍ය විශ්ලේෂණය*,* වෙළුම.09 කාණ්ඩ අංක 13 (2019 මාතර්ු 25-31).

49. වෙරිටෙ රිසච්, මාධ්‍ය විශ්ලේෂණය*,* වෙළුම.06 කාණ්ඩ අංක 14 සහ 15 (2016 අප්‍රේල් 11-24).

50. වෙරිටෙ රිසච් (VR) 'Understanding Press Coverage on Religious Freedom (February 2019) ප්‍රවේශය: http://www.minor-matters.org/en/media-pdfs [අවසන් වරට ප්‍රවේශය: 2019 නොවැම්බර් 18].

*51.* විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය (CPA), *Attacks on Places of Religious Worship in Post-War Sri Lanka,* (2013), පි.83, ප්‍රවේශය:https://s3.amazonaws.com/f.cl.ly/items/3L2T1z0A1G1f3o0m2H3g/Attacks%20on%20Religious%20 Places.pdf [අවසන් වරට ප්‍රවේශය: 2019 නොවැම්බර් 18].

වෙරිටෙ රිසච් (VR) 'Understanding Press Coverage on Religious Freedom (2018 ඔක්තෝබර්-දෙසැම්බර්, 2019 පෙබරවාරි, මාතර්ු, ජූලි සහ සැප්තැම්බර්) ප්‍රවේශය:http://www.minormatters.org/en/media-pdfs [අවසන් වරට ප්‍රවේශය: 2019 නොවැම්බර් 18].

*52.* ගැටුම් පිළිබඳව ජාත්‍යන්තර කණ්ඩායම, *Sri Lanka's North I: The Denial of Minority Rights Crisis Group Asia Report,* 16 March 2012, පි.17, ප්‍රවේශය:https://www.srilankacampaign.org/wp-content/uploads/2015/02/ Sri-Lanka-s-North-I-The-Denial-of-Minority-Rights-International-Crisis-Group-2012.pdf [අවසන් වරට ප්‍රවේශය: 2019 නොවැම්බර් 18].

*53.* ගැටුම් පිළිබඳව ජාත්‍යන්තර කණ්ඩායම, *Sri Lanka's North I: The Denial of Minority Rights Crisis Group Asia Report,* 16 March 2012, පි.17, at https://www.srilankacampaign.org/wp-content/uploads/2015/02/ Sri-Lanka-s-North-I-The-Denial-of-Minority-Rights-International-Crisis-Group-2012.pdf [අවසන් වරට ප්‍රවේශය: 2019 නොවැම්බර් 18].

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය (CPA), *Attacks on Places of Religious Worship in Post-War Sri Lanka,* (2013), පි.8, ප්‍රවේශය: https://s3.amazonaws.com/f.cl.ly/items/3L2T1z0A1G1f3o0m2H3g/Attacks%20on%20Religious%20 Places.pdf [අවසන් වරට ප්‍රවේශය: 2019 නොවැම්බර් 18].

Nadine Vanniasinkam, Kasun Pathiraja, Mohamed Faslan and Dinushka Jayawickreme, *Inter-religious conflict in four districts of Sri Lanka,* (ICES and Equitas 2018), පි.11-15, ප්‍රවේශය:http://ices.lk/wp-content/uploads/2019/05/Inter-religious- conflict-in-four-districts-of-Sri-Lanka_English.pdf [අවසන් වරට ප්‍රවේශය: 2019 නොවැම්බර් 18].

54. ශ්‍රී ලංකාවේ ජාතික ක්‍රිස්තියානි ඉවැන්ජලික සන්ධානය (NCEASL) මගින් හින්දූන්ට එරෙහි ප්‍රචණ්ඩත්ව සිදුවීම් හා බියවැද්දීම් පිළිබඳව සම්පාදනය කළ සිදුවීම් වාතර්ාව.

55. වෙරිටෙ රිසච් (VR) 'Understanding Press Coverage on Religious Freedom (July 2019) ප්‍රවේශය:http://www.minormatters.org/en/media-pdfs [අවසන් වරට ප්‍රවේශය: 2019 නොවැම්බර් 18].

56. වෙරිටෙ රිසච් (VR) 'Understanding Press Coverage on Religious Freedom (2019 සැප්තැම්බර්) ප්‍රවේශය:http://www.minor-matters.org/en/media-pdfs [අවසන් වරට ප්‍රවේශය: 2019 නොවැම්බර් 18].

57. වෙරිටෙ රිසච් (VR) 'Understanding Press Coverage on Religious Freedom (2019 සැප්තැම්බර්) ප්‍රවේශය:http://www.minor-matters.org/en/media-pdfs [අවසන් වරට ප්‍රවේශය: 2019 නොවැම්බර් 18].

58. ගෙහාන් ගුණතිලක, 'The Structural Limits of Depoliticisation in Sri Lanka' (2019) 108(6) *The Round Table: The Com- monwealth Journal of International Affairs* 613-624.

59. නීල් ඩිවෝටා, Sinhalese Buddhist Nationalist Ideology: Implications for Politics and Conflict Resolution in Sri Lanka (Washington: East-West Centre 2007), පි.5.

60. ධරීෂා බැස්ටියන්ස්, *Gintota and the shadows of extremism,* ඩේලි එෆ්ටී, 2017 නොවැම්බර් 23 ප්‍රවේශය:http://www.ft.lk/opinion/Gintota-and-the-shadows-of-extremism/14-643843 [අවසන් වරට ප්‍රවේශය: 2019 නොවැම්බර් 18].

61. රුකී ෆනර්ැන්ඩෝ, *STF brutality against Muslims in Digana: March 5,* ග්‍රවුන්ඩ්ව්ව්ස්, 2018 මාතර්ු 13, https://groundviews.org/2018/03/13/stf-brutality-against-muslims-in-digana-march-5/[ අවසන් වරට ප්‍රවේශය: 2019 නොවැම්බර් 18].
ටොම් ඇලඩර් සහ ෂිහාර් අනීස්, *Police, politicians accused of joining Sri Lanka's anti-Muslim riots,* Reuters, 2018 මාතර්ු 25 ප්‍රවේශය:https://www.reuters.com/article/us-sri-lanka-clashes-insight/police-politicians-accused-of-joining-sri-lankas-an- ti-muslim-riots-idUSKBN1H102Q [අවසන් වරට ප්‍රවේශය: 2019 නොවැම්බර් 18].

62. මාකර් ෂුබටර්, *Restrictions and Violence against Religious Minorities: An incident analysis,* (2019) ප්‍රවේශය:http://www.minor-matters.org/storage/app/uploads/public/5d3/7fb/10c/5d37fb10ce12e404095654.pdf [අවසන් වරට ප්‍රවේශය: 2019 නොවැම්බර් 18].

කේ.රත්නායක, *Sri Lankan government imposes island-wide curfew amid anti-Muslim violence,* WSWS, 2019 මැයි 14, ප්‍රවේශය:https://www.wsws.org/en/articles/2019/05/14/sril-m14.html[අවසන් වරට ප්‍රවේශය: 2019 නොවැම්බර් 18].

63. පියුමි ෆොන්සේකා, *Anti-Muslim attacks question security coordination,* ඩේලි මිරර්, 2019 මැයි 16 ප්‍රවේශය: http://www.dailymirror.lk/news-features/Anti-Muslim-attacks-question-security-coordination/131-167256 [අවසන් වරට ප්‍රවේශය: 2019 නොවැම්බර් 18].

අබුබකර රමීස්, *Resurgence of Ethno-Religious Sentiment against Muslims in Sri Lanka: Recent Anti-Muslim Violen- ce in Ampara and Kandy,* (2018), p.32, 11 (4) Journal of Politics and Law, Canadian Center of Science and Education.
මොහොමඩ් ආගුස් යුසූෆ් සහ ආදම්බාවා සජර්ූන්, *Post-War Religious Violence, Counter-State Response and Religious Harmony in Sri Lanka,* (2019), පි.217, 9 (3) Journal of Educational and Social Research, Mediterranean Center of Social and Educational Research.

64. ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසම, *Recent Communal violence in the North-Western Province, Chilaw District and Miuwangoda Town,* 2019 මැයි 23, ප්‍රවේශය: http://hrcsl.lk/english/wp-content/uploads/2019/05/HRCSL-letter-to-IGP.pdf [අවසන් වරට ප්‍රවේශය: 2019 නොවැම්බර් 18].

*65.* එහිම.

66. වැඩිවිස්තර සඳහා බලන්න, වෙරිටෙ රිසච්(VR) ‘Understanding Press Coverage on Religious Freedom (October-December 2018), ප්‍රවේශය:http://www.minormatters.org/en/media-pdfs [අවසන් වරට ප්‍රවේශය: 2019 නොවැම්බර් 18].

67. වැඩිවිස්තර සඳහා බලන්න, වෙරිටෙ රිසච්(VR) ‘Understanding Press Coverage on Religious Freedom (July 2019), ප්‍රවේශය: http://www. minormatters.org/en/media-pdfs [අවසන් වරට ප්‍රවේශය: 2019 නොවැම්බර් 18].

68. හෙයිනර් බියෙල්ෆෙල්ට්, Nazila Ghanea and Michael Wiener, *Freedom of Religion or Belief: An International Law Commentary* (OUP 2016).

ගෙහාන් ගුණතිලක, *The Constitutional Practice of Ethno-Religious Violence in Sri Lanka,* Asian Journal of Comparative Law, 13 (2018), පි.359.

69. ගෙහාන් ගුණතිලක, *The Chronic and the Acute: Post-War Religious Violence in Sri Lanka,* (මානව හිමිකම් අධ්‍යාපනය සඳහා වූ ජාත්‍යන්තර කේන්ද්‍රය සහ ජනවාගරීක අධ්‍යයනය සඳහා වූ ජාත්‍යන්තර කේන්ද්‍රය 2015), පි.33.

70. *Health Ministry revises Easter attacks death toll down to 253,* අද දෙරණ, ප්‍රවේශය: http://www.adaderana.lk/news/54668/health-ministry-revises-easter-attacks-death-toll-down-to253 [අවසන් වරට ප්‍රවේශය: 2019 නොවැම්බර් 18].

වැඩිවිස්තර සඳහා බලන්න, වෙරිටෙ රිසච්(VR) ‘Understanding Press Coverage on Religious Freedom (2019 අප්‍රේල්), ප්‍රවේශය: http://www. minormatters.org/en/media-pdfs [අවසන් වරට ප්‍රවේශය: 2019 නොවැම්බර් 18].

71. වෙරිටෙ රිසච් (VR) ‘Understanding Press Coverage on Religious Freedom (April 2019) ප්‍රවේශය: http://www.minormatters.org/en/media-pdfs [අවසන් වරට ප්‍රවේශය: 2019 නොවැම්බර් 18].

72. ශ්‍රී ලංකා ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාතර්මේන්තුව, *Percentage distribution of population by ethnic group district, Census 1981, 2001, 2012,* ප්‍රවේශය: http://www.statistics.gov.lk/Abstract2016/CHAP2/2.12.pdf [අවසන් වරට ප්‍රවේශය: 2019 නොවැම්බර් 18].

73. ශ්‍රී ලංකා ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාතර්මේන්තුව, *Percentage distribution of population by religion group district, Census 1981, 2001, 2012,* ප්‍රවේශය: http://www.statistics.gov.lk/Abstract2016/CHAP2/2.15.pdf [අවසන් වරට ප්‍රවේශය: 2019 නොවැම්බර් 18].

74. ගෙහාන් ගුණතිලක, *The Chronic and the Entrenched: Ethno-religious violence in Sri Lanka* (ජනවාගරීක අධ්‍යයනය සඳහා වූ ජාත්‍යන්තර කේන්ද්‍රය 2018), පි.43.

*75.* එහිම.

Verité Research
Strategic Analysis for Asia

අංක. 5A, පොලිස් පාර්ක් ප්ලේස්, කොළඹ 5
+94 11-2055544
reception@veriteresearch.org
www.veriteresearch.org